# පටුන


මෙහෙවර ප්‍රකාශය i

මහින්ද චින්තන - ඉදිරි දැක්ම ii

පෙරවදන iii-v

**<u>අංශවල ප්‍රගති වාර්තා</u>**

1. දකුණු ආසියා හා සාර්ක් අංශය 1 - 20
2. නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශය 21 - 32
3. මැද පෙරදිග අංශය 33 - 40
4. අප්‍රිකා අංශය 41 - 52
5. යුරෝපා, ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුළු සහ ඇමරිකා අංශය 53 - 63
6. එක්සත් ජාතීන්ගේ, බහු පාර්ශ්වීය කටයුතු, මානව හිමිකම් සහ සමුළු අංශය 64 - 68
7. ආර්ථික කටයුතු අංශය 69 - 73
8. සන්ධාන අංශය 74 - 83
9. කොන්සියුලර් කටයුතු අංශය 84 - 87
10. පොදු සන්නිවේදන අංශය 88 - 91
11. නීති අංශය 92 - 101
12. විදේශ දූත මණ්ඩල පාලන අංශය 102 - 106
13. සාමාන්‍ය පරිපාලන අංශය 107 - 109
14. මුදල් අංශය 110-113
15. විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල ජාලය 114
16. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සංවිධාන සටහන 115

# මෙහෙවර ප්‍රකාශය

“ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව
ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන්
ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම සහ සුරක්ෂා කිරීම
සහ ජාත්‍යන්තර ප්‍රවණතා ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන්ට
අනුකූලව කළමනාකරණය කිරීම සම්බන්ධයෙන්
රජයට උපදෙස් දීම”

# විදේශ කටයුතු අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන්

"විදේශ කටයුතු පිළිබඳ දේශපාලනික සැලසුම් හා
වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;
විදේශ රටවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම;
ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතිවලට එළඹීම;
ශ්‍රී ලංකාවේදී විදේශ රටවල ආණ්ඩු සහ
ජාත්‍යන්තර සංවිධාන නියෝජනය කිරීම;
විදේශ රටවලදී සිදු කරන ප්‍රචාරණ කටයුතු;
රාජ්‍යතාන්ත්‍රික විනිර්මුක්තීන් හා වරප්‍රසාද සහ
කොන්සියුලර් කටයුතු"

ශ්‍රී ලංකාව කවදත් අනුගමනය කළ නොබැඳි විදේශ ප්‍රතිපත්තිය තවදුරටත් ශක්තිමත් කොට පවත්වාගෙන යන්නෙමි. ඉන්දියාව, ජපානය, චීනය, පකිස්තානය ඇතුළු ආසියානු රටවල් සමඟ පවත්වාගෙන යන අපේ මිත්‍රශීලී සබඳතාවන් කොතෙක් ඵලදායී ද යන්න පසුගිය සිව් වසර තුළ මනාව පැහැදිලි වූ අතර, දේශපාලන, ආරක්ෂක, ආර්ථික, වෙළඳ හා සංස්කෘතික ක්ෂේත්‍රයන්හි එම සබඳතා අතිශයින් මිත්‍රශීලී ලෙස පත්වාගෙන යාමට කැප වෙමි.

ලෝක පාරිසරික සහ දේශගුණික විපර්යාසයන් හා බැඳුණු ජාත්‍යන්තර සම්මුතීන් හා ගිවිසුම් සමඟ ඒකාබද්ධව කටයුතු කරන අතර, එක්සත් ජාතීන්ගේ සංවිධාන සමඟ ඇති සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කරමි.

ශ්‍රී ලංකාව වෙනත් රටවල් සමඟ පවත්වන විදේශ සබඳතාවයන්හිදී රටේ ගෞරවය සහ අභිමානය සුරැකෙන පරිද ක්‍රියා කිරීමටත් විදේශ රටවල ආකර්ෂණය වර්ධනය කර ගැනීමටත් අවශ්‍ය නව වැඩපිළිවෙළක් හඳුන්වා දෙමි.

**මහින්ද චින්තන - ඉදිරි දැක්ම**

# පෙරවදන

ජාතික ආරක්ෂාව, උත්කෘෂ්ඨ අරමුණු හා ආර්ථික සමෘද්ධිය වැනි අපගේ ජාතික අභිලාෂයන් සුරක්ෂාකර ගැනීමෙහිලා නිර්මාණය කෙරුණු, දේශපාලනික ඉලක්ක රැසක් මත ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය මූලික වශයෙන් හැඩ ගැසී තිබේ. මේ අනුව විදේශ ප්‍රතිපත්තිය, රජයේ සමස්ත ප්‍රතිපත්ති රාමුවේ අත්‍යාවශ්‍ය කොටසක් බවට පත්වෙයි.

අතිගරු ජනාධිපතිතුමාගේ 'මහින්ද චින්තන' ඉදිරි දැක්ම අනුව යමින්, ශ්‍රී ලංකාව නොබැඳි, නිදහස් හා ප්‍රගතිශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. මහින්ද චින්තනය ක්‍රියාත්මක කිරීමේදි මෙම අමාත්‍යාංශය ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ මාර්ගෝපදේශය ලබාගනී.

මෙම අමාත්‍යාංශය සහ ලොවපුරා පිහිටි එහි දූත මණ්ඩල 64ක ජාලය, ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ජාතික අභිලාශයන් විදේශ රටවලදී ප්‍රවර්ධනය කිරීම සඳහා සහ සුරක්ෂා කිරීම සඳහා අනලස්ව කටයුතු කරයි. 2012 වසරේදී විවිධ මට්ටම්වලින් සිදු කෙරුණු ද්විපාර්ශ්වික සංචාරවල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කෙරිණ. ශ්‍රී ලංකාව වෙත නිරන්තරයෙන් සිදු කෙරෙන මෙම ද්විපාර්ශ්වික සංචාර මගින් ශ්‍රී ලංකාව ලොව අන් රටවල් සමඟ කැපී පෙනෙන ආකාරයෙන් පවත්වාගෙන යන සබඳතා පිළිබිඹු කරයි. මෙම එක් එක් සංචාරය අතරතුරදී, ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල් අතර ද්විපාර්ශ්වික සහයෝගිතාව ශක්තිමත් කිරීම සඳහා සහ වැඩි දියුණු කිරීම සඳහා මං පාදමින්, ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් රාශියකට එළඹ තිබේ.

අතිගරු ජනාධිපතිතුමා පාකිස්තානය, සිංගප්පූරුව, කොරියානු ජනරජය, කටාර්, කියුබාව, ඉරානය ඉන්දියාව සහ කසකස්තානය යන රටවල නිරතවූ රාජ්‍ය සංචාරද ඇතුළුව ද්විපාර්ශ්වික සංචාර විශාල සංඛ්‍යාවක නිරත විය. මෙම සංචාර මගින්, ලොව අන් රටවල් සමඟ ශ්‍රී ලංකාව සිදුකරන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා මහඟු අවස්ථා උදා කර දී තිබේ. දේශගුණික විපර්යාස සහ බලශක්ති ආරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිය විදහා දක්වමින්, අතිගරු ජනාධිපතිතුමා, තිරසාර සංවර්ධනය පිළිබඳව බ්‍රසීලයේ පැවති එක්සත් ජාතීන්ගේ රියෝ+20 සමුළුවට ද, කටාර් හි පැවති දෝහා සංසදයටද, ඩුබායි හි පැවති ලෝක බලශක්ති සංසදයටද සහභාගි විය. කුවේට් හි පැවති ප්‍රථම ආසියා සහයෝගිතා සංවාදය සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගිත්වය මගින්, ආසියානු ශිෂ්ඨාචාරයේ පොදු වූ සාරධර්ම මත පදනම් වූ කලාපීය සහයෝගිතාව සඳහා ශ්‍රී ලංකාවේ ඇපකැපවීම ජාත්‍යන්තර මට්ටමින් විදහා දක්වා තිබේ.

විදේශ ප්‍රතිපත්ති ක්ෂේත්‍රයෙ හි මතුවෙමින් පවතින අභියෝගවලින් ජයගැනීමේ අරමුණින්, විදේශ කටයුතු අමාත්‍යාංශය, අප්‍රිකානු මහද්වීපයේ රටවල් 15ක් හා මධ්‍යම, ලතින් ඇමෙරිකානු සහ කැරිබියන් කලාපයේ රටවල් 13ක් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ස්ථාපිත කරමින් තම රාජ්‍යතාන්ත්‍රික සබඳතා ජාලය පුළුල් කර ඇත. බැග්ඩෑඩ් හි දූත මණ්ඩලය නැවත විවෘත කිරීමට අමාත්‍යාංශය පියවර ගත් අතර, අන්කාරා හි සහ ගුවැන්ෂු හි නව දූත මණ්ඩල ස්ථාපනය කොට තිබේ. බහරේන් හි සහ නයිජීරියාවේ තානාපති කාර්යාලය දෙකක්ද, ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි කොන්සල් ජනරාල් කාර්යාලයයක් ද ස්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

අප සිදුකරන නියෝජන ඵලදායීව හා නිසි අධිෂ්ඨානයකින් යුතුව සිදුකිරීමට අවස්ථාව සලසමින්, මෙම අමාත්‍යාංශය වෙන්නායි හි හා කැන්බරා හි නව චාන්සරි ගොඩනැගිලි ඉදිකර තිබේ. නිව්යෝර්ක් හා වොෂිංටන් ඩී.සී හි දූත මණ්ඩල සඳහා නව චාන්සරි ගොඩනැගිලි මිලදී ගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති ඉලක්ක ඵලදායී ලෙස ජය ගැනීම සඳහා අත්‍යාවශ්‍යවන්නක් වන හැකියාවලින් පරිපූර්ණ හා උසස් තත්වයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ වැදගත්කම අමාත්‍යාංශය විසින් හඳුනාගෙන

තිබේ. අමාත්‍යාංශයේ මානව සම්පත් තවදුරටත් වැඩි දියුණු කිරීම උදෙසා, 2012 ජනවාරි මසදී ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා නව නිලධාරීන් 14 දෙනෙකු බඳවා ගන්නා ලද අතර, ශ්‍රී ලංකා විදේශ සේවයේ -III ශ්‍රේණිය සඳහා නව නිලධාරී කණ්ඩායමක් බඳවා ගැනීම සඳහා වූ විභාගය 2012 මැයි සහ ජූනි මාස වලදී පවත්වන ලදී. කුසලතා සංවර්ධනය සඳහා ගන්නා ලද පියවරක් ලෙස, පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා යවන ලද පරිස ද ඇතුළුව නිලධාරීන් 17 දෙනෙකු විදේශ පුහුණු වැඩසටහන් සඳහා යවන ලදී.

විදේශ කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ පිහිටුවා ඇති ජනරජ ගොඩනැගිල්ල වෙනුවට, සීඝ්‍රයෙන් නවීකරණය වන ජාතියක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට ගැලපෙන අයුරින්, විදේශ කටයුතු අමාත්‍යාංශය නවීන හා වැඩි ඉඩකඩක් ඇති ගොඩනැගිල්ලකට ගෙන යාම සඳහා සැලසුම් කරමින් සිටියි.

පොදු ජනතාව හා සෘජුව සම්බන්ධ වන අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය, රජයේ ප්‍රජා මූලික ප්‍රතිපත්තිවලට අනුකූලව, විදේශ රටවල වෙසෙන, සංචාරය කරන, වෙළෙඳාම් කරන සහ රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ අපේක්ෂාවන්, ඉටු කර දීම සඳහා තවදුරටත් සවිබල ගන්වා තිබේ. මෙම අංශය, දිනපතා පෙ.ව. 6 සිට පුද්ගලයින් 800 - 1000 ට ආසන්න ප්‍රමාණයකට සේවා සහ කොන්සියුලර් සහය ලබා දෙයි. ලියකියවිලි සහතික කරදීම මගින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 127,364,375.00/-ක ආදායමක් උපයා ගැනීමට මෙම අංශය සමත්ව ඇත. ඥාතීන්ට ශ්‍රී ලංකා රුපියල් මිලියන 208,103,971.37/-ක මුදලක් වන්දි වශයෙන් ලබා ගැනීම සඳහා මෙම අංශය විසින් කටයුතු කොට ඇති අතර, මෙම වසරේදී ශ්‍රී ලාංකිකයන්ගේ මෘතදේහ 316 ක් විදේශ රටවල්වල සිට නැවත මෙරටට ගෙන්වා ගැනීමටද මෙම අංශය විසින් කටයුතු කරන ලදී.

තොරතුරු බෙදා හැරීම සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විදේශ රටවලදී විදහා දැක්වීම සම්බන්ධයෙන් රජය හා බාහිර ක්‍රියාකාරීන් අතර කේන්ද්‍රස්ථානය වන පොදු සන්නිවේදන අංශය, විදේශ රටවල ශේෂව සිටින එල්.ටී.ටී.ඊ. කොටස් සහ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ පෙරමුණු සංවිධාන ශ්‍රී ලංකාවට එරෙහිව දියත් කර ඇති ප්‍රචාරණ ව්‍යාපාරය මැඩලීමට කටයුතු කර ඇත.

ගැටුම්වලින් පසු අවධියේ ඇතිවූ ප්‍රවණතා ගැටුම් හා සම්බන්ධ චෝදනා සහ ඒ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත සහ වෙනත් බහුපාර්ශ්වීය සංවිධාන වෙත අනිවාර්යයෙන්ම සිදු කළ යුතු වන වාර වාර්තාකරණය හා සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාව විසින් මතුකරනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දීම පිළිබඳව ශ්‍රී ලංකාව සිදු කරන කටයුතු සම්බන්ධයෙන් ක්‍රමෝපාය සැකසීම අමාත්‍යාංශයේ වගකීමක් බවට පත්වී තිබේ. එක්සත් ජාතීන්, මානව හිමිකම් සහ බහුපාර්ශ්වීය කටයුතු අංශය, මේ සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කිරීමේ හා ජිනීවා හි පිහිටි මානව හිමිකම් කවුන්සිලය, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල්, ජාත්‍යන්තර සිවිල් සමාජ නියෝජිතයන් මෙන්ම ජාත්‍යන්තර මාධ්‍ය වැනි ප්‍රධාන පෙළේ සංවිධාන සහ උනන්දුවක් දක්වන කණ්ඩායම් වෙත තොරතුරු බෙදා හැරීමේ කර්තව්‍යයෙහි නියැලුණි. ළමයින් හා සන්නද්ධ ගැටුම් පිළිබඳ 1612 එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල යෝජනාවලියේ II ඇමුණුමෙන් එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා ලවා ශ්‍රී ලංකාව ඉවත් කරවා ගැනීමට මෙම අංශයට සාර්ථකව හැකිවිය. තවද, ශ්‍රී ලංකාවේ පැවති විවිධ ජාත්‍යන්තර සමුළු සහ රැස්වීම් සඳහා විදේශීය ජාතිකයන්ට ශ්‍රී ලංකාවට පැමිණීමට වීසා බලපත්‍ර 1800ක් පමණ සැකසීමෙහිලා මෙම අංශය සහාය දැක්විය.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ අපනයන සංවර්ධන මණ්ඩලය, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය වැනි රජයේ නියෝජිතායතන මෙන්ම වාණිජ හා කර්මාන්ත මණ්ඩල 06 විසින් නියෝජනය කෙරෙන පෞද්ගලික අංශය සමඟ සහයෝගිතාවයෙන් යුතුව කටයුතු කරමින්, ශ්‍රී ලාංකික නිෂ්පාදන සහ සේවා සඳහා සහ සෘජු විදේශ ආයෝජන හා සංචාරක කර්මාන්තය සඳහා නව වෙළෙඳපළ සොයා බැලීම සඳහා ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන්, විදේශ වෙළඳම, ආයෝජන සහ සංචාරක කර්මාන්තය

ප්‍රවර්ධනය කිරීමේදී මෙම අමාත්‍යාංශය එහි විදේශ රටවල පිහිටි දූත මණ්ඩල හරහා ඉතා වැදගත් කාර්යභාරයන් අඛණ්ඩව ඉටු කරයි.

ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සිංගප්පූරුව, මැලේසියාව, මොරිටේනියාව, ඉන්දියාව සහ පකිස්තානය ඇතුළු විදේශ රටවල් ගණනාවක මෙන්ම ඇමෙරිකානු, ලතින් අමෙරිකානු සහ යුරෝපා මහද්වීපවලට අයත් රටවල් කිහිපයක සිදුකරන ලද සංචාර මගින් අමාත්‍යාංශයේ රාජ්‍යතාන්ත්‍රික කටයුතු පිළිබඳ ව්‍යාප්ති පරාසය සැළකිය යුතු මට්ටමකින් පුළුල් කිරීමට අමාත්‍යාංශයට හැකි විය.  මෙම සංචාරවලදී, තම සාකච්ඡාමය පාර්ශ්වකරුවන් සමග ඵලදායී සංවාදයක නියැලීමට හා පැවති ගැටුම් හේතුවෙන් ඇති වී ඇති අයහපත් බලපෑම් සමනය කිරීම සඳහා, සීඝ්‍ර හා තිරසාර ආර්ථික සංවර්ධනයක් ඇති කරලමින් යුද්ධයෙන් විනාශයට පත් ආර්ථිකය නැවත ගොඩනැගීම සඳහා වන ශ්‍රී ලංකාවේ වැඩ පිළිවෙළ පිළිබඳව ප්‍රකාශයට පත් කිරීමට සහ රට තුළ සිටින විවිධ ප්‍රජා අතර හා විදේශ රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන් අතර විශ්වාසය හා එකමුතුභාවය නැවත ගොඩනැගීමටත් අමාත්‍යවරයා සමත් විය.  යළි ගොඩනැගීම, පුනරුත්ථාපනය සහ ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් රජය යොදා ඇති ප්‍රයත්න විදහා දැක්වීම සඳහා බහු පාර්ශ්වීය හා විද්වත් මණ්ඩල ඇතුළත් වන සංසද කිහිපයක් ඇමතීමට ද ගරු අමාත්‍යවරයා මෙම සංචාරය උපයෝගී කර ගත්තේය.

1976 වර්ෂයේදී නොබැඳි ජාතීන්ගේ සමුළුව පැවැත්වූවාට පසුව, රාජ්‍ය නායකයන් ආණ්ඩු ප්‍රධානීන් විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේඋ ඒකරාශී වන පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රුස්වීම 2013 වසරේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීම සඳහා පෙර සූදානම් කටයුතු අමාත්‍යාංශය විසින් උද්යෝගීව සංවිධානය කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ අභිලාෂයන් විදේශ රටවලදී ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ නොබැඳි විදේශ ප්‍රතිපත්තියේ මූලික හරය වන සියල්ලන් සමඟ මිත්‍රත්වය සහ කිසිවෙකුත් සමඟ වෛරයෙන් නොබැඳීම යන මූලික ප්‍රතිපත්තියට අනුව කටයුතු කරමින් එම වගකීම අඛණ්ඩව ඉටු කරලීම මෙම අමාත්‍යාංශයේ මුඛ්‍ය වගකීම වෙයි.

විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ
2013 මැයි 31

# දකුණු ආසියා හා සාර්ක් අංශය

**<u>දකුණු ආසියා අංශය</u>**

- ආවරණය වන රටවල් : ඇෆ්ගනිස්තානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය සහ පකිස්තානය
- නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව (05) : බංග්ලාදේශය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය සහ පකිස්තානය
- සමගාමීව අක්ත ගන්වන ලද රටවල් සංඛ්‍යාව (02) : නවදිල්ලිය වෙත ඇෆ්ගනිස්තානය සහ භූතානය
- බහුපාර්ශ්වීය සංවිධාන සංඛ්‍යාව (01) : දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය (SAARC)

**<u>දකුණු ආසියානු අංශයේ ප්‍රධාන කාර්යය ක්ෂේත්‍ර පහත සඳහන් ආකාරයට පුළුල් ලෙස වර්ගීකරණය කළ හැක.</u>**

- වැදගත් දේශපාලනික සහ ආර්ථික ප්‍රවණතා ශ්‍රී ලංකාවේ දේශීය සහ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව තක්සේරුවක් ඉදිරිපත් කිරීම සඳහා දකුණු ආසියා අංශය, දකුණු ආසියා කලාපයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමග සම්බන්ධීකරණයෙන් යුතුව, එම ප්‍රවණතා අඛණ්ඩව අධීක්ෂණය කරයි.
- දකුණු ආසියානු රටවල කොළඹ පිහිටි දූත මණ්ඩල සමග යහපත් ඵලදායි, කාර්යක්ෂම කාර්යය සබඳතාවක් පවත්වා ගෙන යාම.
- අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ, ගරු විදේශ කටයුතු ඇමතිතුමාගේ, වෙනත් කැබිනට් අමාත්‍යවරුන්ගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ විදේශ සංචාර සම්බන්ධීකරණය කිරීම.
- දකුණු ආසියානු රටවල සම්භාවනීය අමුත්තන් ශ්‍රී ලංකාවෙහි සිදු කරන සංචාර සඳහා කටයුතු සූදානම් කිරීම.
- දේශපාලනික, අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අමාත්‍යාංශ අතර අනුගාමී සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- කලාපයේ රටවල් සමග දේශපාලනික, විද්‍යා හා තාක්ෂණ, වෙළඳ හා ආයෝජන, අධ්‍යාපනික සහ සංස්කෘතික ගිවිසුම්වලට එළඹීම පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- විදේශ රටවල පිහිටි දූත මණ්ඩලවලින් ලැබෙන මාසික දේශපාලනික වාර්තා පිළිබඳ තොරතුරු සැකසීම සහ එම තොරතුරු අදාළ බලධාරීන් වෙත යොමු කිරීම.
- මෙම කලාපය ආශ්‍රිතව සිදු කෙරෙන සංචාරවලදී සහ සමුළුවලදී සාකච්ඡාවට ලක් කිරීම සඳහා ලුහුඬු වාර්තා, කථා සහ කථාවලදී ඉදිරිපත් කිරීම සඳහා යෝජිත කරුණු පිළියෙල කිරීම.
- ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ශ්‍රී ලංකාව සහ දකුණු ආසියානු රටවල් අතර සිරකරුවන් හුවමාරු කිරීම පිළිබඳ පවතින ගැටලු සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

## <u>ද්විපාර්ශ්වික සබඳතා</u>

### ඇෆ්ගනිස්තානය

ශ්‍රී ලංකාව වෙත සිදු කරන නිල සංචාර

- ඇෆ්ගනිස්තාන ඉස්ලාමීය ජනරජයේ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු ආචාර්ය සල්මායි රසූල් මහතාගේ සංචාරය, 2012 දෙසැම්බර් 18 - 21

- විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය සල්මායි රසූල් මහතා, ඇෆ්ගනිස්තානයේ නේවාසික නොවන තානාපති ශායිදා එම්. අබ්ඩාලි උතුමාණන්, පළමු දේශපාලන අංශයේ අධ්‍යක්ෂ ජනරාල් අසීස්දුන් අහ්මද්සාදා සහ ඇෆ්ගනස්තාන විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය මාධ්‍ය ප්‍රකාශක සළුද් අබ්දුල් බශීර් සදීම් මහතා මෙම නියෝජිත කණ්ඩායමට ඇතුළත් විය. ඇෆ්ගනිස්තානයේ විදේශ කටයුතු අමාත්‍යවරයෙකු විසින් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද ප්‍රථම ද්විපාර්ශ්වික සංචාරය මෙයයි. නිල සාකච්ඡා අතරතුර, ඇෆ්ගනිස්තානය වෙත වෘත්තිකයන් සහ පුහුණු කම්කරුවන් ලබා දීම සඳහා වන ද්විපාර්ශ්වික ගිවිසුමකට අත්සන් තැබීමට ශ්‍රී ලංකාව විසින් යෝජනා කරන ලදී.

- ආර්ථික, අධ්‍යාපනික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ ද්විපාර්ශ්වික ගිවිසුමට සහ දෙරට අතර සංස්කෘතික සහයෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම අමාත්‍යවරු ඉදිරියේදී සිදු කෙරිණ.

- වෙළඳ කටයුතු පුළුල් කිරීම සඳහා වන මාර්ග පිළිබඳ සොයා බැලීමේ අරමුණෙන්, ඇෆ්ගනිස්තානයේ වාණිජ සහ කර්මාන්ත අමාත්‍යාංශය සහ වාණිජ මණ්ඩලය නියෝජනය කරන නියෝජිත කණ්ඩායමක් මෙරටට එවීමට ඇෆ්ගනිස්තාන විදේශ අමාත්‍යවරයා මෙහිදී එකඟ විය. ඇෆ්ගනිස්තානයේ සංචාරයක යෙදෙන ලෙස ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා වෙත කර්සායි ජනාධිපතිතුමා විසින් සිදු කරන ලද ආරාධනය එරට විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් මෙහිදී ඇනුම් දෙන ලදී.

### බංග්ලාදේශය

**ශ්‍රී ලංකාව වෙත සිදු කරන ලද නිල සංචාර**

- බංග්ලාදේශයේ නීති, අධිකරණ සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය සඳහා වන පාර්ලිමේන්තු ස්ථාවර කමිටුවේ සභාපතිවරයා, 2012 අප්‍රේල් 07 සිට 10 දක්වා දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

**බංග්ලාදේශය වෙත සිදු කරන ලද නිල සංචාර**

- බංග්ලාදේශ අග්‍රාමාත්‍ය අතිගරු ෂික් හසීනා මහත්මිය විසින් 2012 අගෝස්තු 05-06 දිනවලදී ඩකාහිදී කැඳවන ලද "ජනතාව සවිබල ගැන්වීම සහ සංවර්ධනය" පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයට සහභාගී වීම සඳහා විදේශ කටයුතු අමාත්‍යවරයා බංග්ලාදේශයේ සංචාරයක නිරත විය.

- 2012 ජූලි 08-12 යන දිනවලදී ඩකාහිදී පැවති "2012 දකුණු ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සම්මේලනයට" සහභාගී වීම සඳහා එරට වෙත ගිය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් යුත් පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමේ නායකත්වය පාර්ලිමේන්තු කටයුතු ඇමතිණී ගරු සුමේධා ජයසේන මහත්මිය විසින් දරන ලදී.

- "ගබඩා කරගත් වැහි ජලය යොදා ගෙන සිදු කරන ගොවිතැන් කටයුතු" පිළිබඳ සමුළුවට සහභාගී වීම සඳහා, ජල සම්පත් හා ජලපවාහන අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මහතා 2012 ජූනි 14 - 17 දිනවලදී ඩකා හි සංචාරයක නිරත විය. මෙහිදී අමාත්‍යවරයා, අගමැතිණී අතිගරු ෂික් හසීනා මහත්මිය බැහැ දුටුවේය.

- 2012 මැයි 09 - 11 දිනවලදී ඩකා හි පැවති "සංස්කෘතික විවිධත්වය පිළිබඳ ආසියා පැසෆික් අමාත්‍ය සංසදයට" සහභාගී වීම සඳහා, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය ගරු ආචාර්ය ජගත් බාලසූරිය මහතා බංග්ලාදේශයේ සංචාරයක නිරත විය.

- 2012 මාර්තු 02-08 දිනවලදී පැවති "ශ්‍රී ලංකා- බංග්ලාදේශ ඒකාබද්ධ ආර්ථික කොමිෂන් සභාවේ" 4 වැනි රැස්වීමට සහභාගී වීම සඳහා බංග්ලාදේශය වෙත ගිය ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය කර්මාන්ත සහ වාණිජ අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතා විසින් දරන ලදී. මෙම සංචාරය අතරතුර 2012 මාර්තු 08 වැනි දින ගරු අමාත්‍යවරයා, බංග්ලාදේශ අගමැතිනී අතිගරු ෂික් හසීනා මහත්මිය සහ විදේශ කටයුතු ඇමතිනී ආචාර්ය දිපු මෝනි මහත්මිය හමුවී සාකච්ඡා කළේය.

- බංග්ලාදේශ රජයේ ආරාධනාවක් මත, ශ්‍රී ලංකාවේ හමුදාපති ලුතිනන් ජනරාල් ජගත් ජයසූරිය මහතා, වී.එස්.වී, යූ.එස්.පී, එන්.ඩී.යූ, පී.එස්.සී, 2012 ජනවාරි 20-16 දිනවලදී බංග්ලාදේශයේ සංචාරයක නිරත විය.

**භූතානය**

**ශ්‍රී ලංකාව වෙත සිදුකරන නිල සංචාර**

- 2012 මැයි 28 වන දින කොළඹදී පැවති, ළමයින්ට එරෙහි හිංසනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ අධ්‍යයනය පිළිබඳව දකුණු ආසියානු පසු විපරම් කලාපීය උපදේශනයන්හි සමාරම්භක සැසියේ විශේෂ අමුත්තෙකු ලෙස, භූතානයේ ගරු අගවිනිසුරු ලියොන්පො සෝනම් ටොබ්ගේයේ මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

**ඉන්දියාව**

**ශ්‍රී ලංකාව වෙත සිදුකරන ලද නිල සංචාර**

- ඉන්දියානු විදේශ කටයුතු අමාත්‍ය, ගරු එස්.එම්.ක්‍රිෂ්ණා මහතා, 2012 ජනවාරි 05 වැනි දින ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

- ඉන්දියාවේ හිටපු ජනාධිපති අතිගරු අබ්දුල් කලාම් මහතා, 2012 ජනවාරි 22-24 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. ජාතික කාර්යය සැලැස්ම දියත් කිරීමේ සහ 2012 ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා වන වසර ලෙස ප්‍රකාශයට පත් කිරීමේ උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස ඔහු සහභාගී විය.

- ලෝක් සභාවේ විපක්ෂ නායක ගරු සුෂ්මා ස්වරාජ් මහත්මියගේ නායකත්වයෙන් යුත්, ඉන්දිය පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂවල මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩයමක් 2012 අප්‍රේල් 17 වැනි දින ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම නියෝජිත කණ්ඩායම දුම්රිය මාර්ග ව්‍යාපෘති, රෝහල් ව්‍යාපෘති සහ නිවාස ව්‍යාපෘති වැනි ඉන්දියාව විසින් ආධාර ලබා දෙන ව්‍යාපෘති දැක බලා ගැනීමට ගියේය.

- දරිද්‍රතාවය දුරු කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයකට සහභාගී වීම සඳහා සනීපාරක්ෂාව සහ පානීය ජලය පිළිබඳ ඉන්දිය අමාත්‍ය ගරු ජයරාම් රමේෂ් මහතා, 2012 ජූලි 11 - 13 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. ශ්‍රී ලංකාවේ පිහිටි ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපායික අධ්‍යයනය පිළිබඳ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය (LKIIRSS) සහ ඉන්දියාවේ පිහිටි සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වන පර්යේෂණ සහ තොරතුරු පද්ධතිය (RIS) අතර අවබෝධතා ගිවිසුමකට ද අත්සන් තබන ලදි.

- ඉන්දියාවේ වාණිජ, කර්මාන්ත සහ රෙදිපිළි පිළිබඳ අමාත්‍ය, ගරු ආනන්ද් ශර්මා මහතා, 2012 අගෝස්තු 2-5 යන දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

- සංස්කෘතිය, නිවාස සහ නාගරික දිළිඳු බව දුරලීම පිළිබඳ අමාත්‍ය ගරු කුමාරි සෙල්ජා මහත්මිය පූජනීය කපිල වස්තු ධාතු රැගෙන මෙරටට පැමිණියාය. මෙම සංචාරය අතරතුරදී, එතුමිය උතුරේ ක්‍රියාත්මක වන ඉන්දිය නියමු අදියර නිවාස ව්‍යාපෘතියේ භූමි භාගයද දැක බලා ගැනීමට ගියාය.

- ඉන්දියාවේ ජාතික ආරක්ෂක උපදේශක ශ්‍රී ශිවශංකර් මෙනන් මහතා 2012 ජූනි 29 වැනි දින ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. ඒ මහතා මෙම සංචාරය අතරතුරදී, අතිගරු ජනාධිපතිතුමා බැහැදුටු අතර, ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා සහ ආරක්ෂක ලේකම්වරයා සමඟ සාකච්ඡා පැවැත්විය.

- නව දිල්ලියේ, ජාතික ආරක්ෂක විද්‍යාලයේ හමුදා නිලධාරීන් 25 දෙනෙකුගෙන් සමන්විත ඉන්දිය නියෝජිත කණ්ඩායමක්, 2012 සැප්තැම්බර් 11 වැනි දින විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත පැමිණි අතර, එහිදී විදේශ කටයුතු ලේකම්වරයා සමඟ සාකච්ඡා පැවැත්විය.

- ඉන්දිය කර්මාන්ත බල මණ්ඩලයේ සභාපති ආදී ගොඩ්රිජ් මහතාගේ නායකත්වයෙන් යුත් ඉන්දිය නියෝජිත කණ්ඩායමක් 2012 නොවැම්බර් මස 18 - 20 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම ඉන්දිය නියෝජිත කණ්ඩායම, අතිගරු ජනාධිපතිතුමා සහ ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා හමුවී සාකච්ඡා පැවැත්විය.

**ඉන්දියාව වෙත සිදු කරන ලද නිල සංචාර**

- මධ්‍ය ප්‍රදේශ් ප්‍රාන්තයේ මහ ඇමති ශ්‍රී ශිව්රාජ් චව්හාන් මහතාගේ ආරාධනයක් මත, බෞද්ධ සහ භාරතීය අධ්‍යයන පිළිබඳ සාන්චි විශ්ව විද්‍යාලයට මුල්ගල තැබීම සඳහා, අතිගරු ජනාධිපතිතුමා 2012 සැප්තැම්බර් 21 වැනි දින මධ්‍ය ප්‍රදේශ්හි සාන්චි හි සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුර අතිගරු ජනාධිපතිතුමා, ඉන්දිය ජනාධිපති අතිගරු ශ්‍රී ප්‍රනාබ් මුකර්ජි මහතා සහ ඉන්දිය අග්‍රාමාත්‍ය ගරු මන්මෝහන් සිං මහතා සමඟ සාකච්ඡා පැවැත්විය.

- විදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, අයි. අන්සාර් මහතාගේ නායකත්වයෙන් යුත් සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත වන නිල නියෝජිත කණ්ඩායමක්, න්‍යෂ්ටික අනතුරකදී ඒ පිළිබඳව දැනුම් දීමේ යාන්ත්‍රණයක් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සහ සමවබෝධිත න්‍යෂ්ටික සහයෝගිතා ගිවිසුමක් පිළිබඳව සාකච්ඡා ආරම්භ කිරීම සඳහා, 2012 ඔක්තෝබර් 12 වැනි දින නවදිල්ලියේ සංචාරයක නිරත විය.

- බස්නාහිර පළාතේ ගරු සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා සහ නියෝජිත කණ්ඩායමක් 2012 නොවැම්බර් 21 - 27 දිනවලදී ඉන්දියාවේ සංචාරයක නිරත විය. කළමනාකරුවන්ගේ සහ අතුරු වෛද්‍ය කාර්ය මණ්ඩලවල ශක්‍යතා වර්ධනය කිරීමෙහිලා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය සැලසුම් කරමින් සිටියි.

**මාලදිවයින**

**ශ්‍රී ලංකාවේ සිදු කරන ලද නිල සංචාර**

- මාලදිවයිනේ විදේශ ලේකම් මොහොමඩ් නසීර් මහතා 2012 ජනවාරි 25 වැනි දින ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

- මාලදිවයිනේ විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය අතිගරු දුන්යා මන්මූන් මිය 2012 මාර්තු 19 වැනි දින ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

- හිටපු මාලදිවයින් ජනාධිපති අතිගරු මයූමුන් අබ්දුල් ගයූම් මහතා 2012 අප්‍රේල් 19-22 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

- මාලදිවයිනේ පොලිස් කොමසාරිස් අබ්දුල්ලා රියාස් මහතා ඇතුළු නියෝජිත කණ්ඩායමක් 2012 මැයි 10-13 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

- මාලදිවයින් ජනාධිපති ආචාර්ය මොහොමඩ් වහීඩ් මහතා කැබිනට් අමාත්‍යවරුන් කිහිප දෙනෙකුද සමග 2012 අගෝස්තු 23-25 දිනවලදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුරදී ඒ මහතා අතිගරු ජනාධිපතිතුමා සමග නිල සාකච්ඡා පැවැත්වූ අතර, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා - මාලදිවයින් ද්විපාර්ශ්වික ව්‍යාපාරික සභාව ද ඇමතුවේය.

- දිවෙහි භාෂා අධ්‍යයන ආයතනයේ නිලධාරීන් පිරිසක් 2012 නොවැම්බර් 12 සිට 21 දක්වා ශ්‍රී ලංකාවේ අධ්‍යයන චාරිකාවක නිරත විය. මෙය, මාලදිවයින් නිලධාරීන් සඳහා වූ ඉතිහාස පර්යේෂණ අධ්‍යාපන චාරිකාවක් විය.

**මාලදිවයින වෙත සිදු කරන ලද නිල සංචාර**

- විදේශ කටයුතු අමාත්‍ය, ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා, 2012 අප්‍රේල් 5-8 දිනවලදී මාලදිවයිනේ නිල සංචාරයක නිරත විය

**පකිස්තානය**

**පකිස්තානය වෙත සිදු කරන ලද නිල සංචාර**

- ශ්‍රී ලංකාවේ යුද හමුදාපතිවරයා 2012 අප්‍රේල් 1-6 දිනවලදී පකිස්තානයේ සංචාරයක නිරත විය.

- පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු ආරුමුගම් තොණ්ඩමන් මහතා, 2012 මාර්තු 19-21 දිනවලදී පකිස්තානයේ සංචාරයක නිරත විය.

- කථානායක ගරු චමල් රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුතු පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක්, 2012 මාර්තු 11-16 දක්වා දිනවලදී පකිස්තානයේ සංචාරයක නිරත විය.

- 2012 පෙබරවාරි 10-12 දිනවලදී ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා පකිස්තානයේ රාජ්‍ය සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුරදී, අතිගරු ජනාධිපතිතුමා පකිස්තාන ජනාධිපති අතිගරු අසිෆ් අලි සර්දාරි මහතා ද පකිස්තාන අග්‍රාමාත්‍ය ගරු සයෙද් යූසුෆ් රාසා ගිලානි මහතාද සමග සාකච්ඡා පැවැත්විය. මාධ්‍ය, වෘත්තිය පුහුණුව යන ක්ෂේත්‍රවල සහයෝගිතාවය උදෙසා සහ ඇ.ඩො.මිලියන 200 ක ණය පහසුකමක් පිළිබඳවද අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබිණ.

- 2012 නොවැම්බර් 4-6 දිනවලදී පකිස්තානයේ ඉස්ලාමාබාද්හි පැවති සාර්ක් රටවල කථානායකවරුන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමයේ හයවැනි සම්මේලනයට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය, නියෝජ්‍ය කථානායක, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් දරන ලදී.

**ශ්‍රී ලංකාව වෙත සිදු කරන ලද නිල සංචාර**

- ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නිලධාරීන් 18 දෙනෙකුගෙන් සමන්විත වන පකිස්තාන නියෝජිත කණ්ඩායමක්, 2012 අප්‍රේල් 18 වැනි දින විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත පැමිණි අතර, එහිදී විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා පැවැත්වීය.

**<u>සංස්කෘතික සබඳතා</u>**

**නේපාලය**

- බුදුරජාණන් වහන්සේගේ උප්පත්තියෙන් වසර 2556 ක් ඉක්ම යාම සහ 2012 ලුම්බිණි දිනය නිමිත්තෙන්, කථානායක සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චමල් රාජපක්ෂ මහතා ඇතුළු රජයේ නිලධාරීන් කණ්ඩායමක් ලුම්බිණියෙ හි සංචාරයක නිරත විය. (2012 මැයි 05 - 07)

**ඉන්දියාව**

- ඉන්දියාවේ සංස්කෘතික අමාත්‍ය ගරු කුමාරි සෙල්ජා මහත්මිය, පූජනීය කපිලවස්තු ධාතු රැගෙන මෙරටට පැමිණියාය. මෙම පූජනීය ධාතු 2012 අගෝස්තු 19 සිට සැප්තැම්බර් 12 දක්වා දිනවලදී ශ්‍රී ලංකාව පුරා ප්‍රදර්ශනය කෙරිණ.

- සංස්කෘතික අමාත්‍ය ගරු කුමාරි සෙල්ජා මහත්මිය, මන්නාරම තිරුකදිරේෂ්වරන් කෝවිලේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමේ උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස ද සහභාගී වූවාය.

**ඇෆ්ගනිස්තානය**

- ඇෆ්ගනිස්තානයේ ගරු විදේශ අමාත්‍යවරයා 2012 දෙසැම්බර් 18-21 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුර දෙරට අතර සංස්කෘතික සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමකටද, ආර්ථික, අධ්‍යාපනික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ ගිවිසුමකටද අත්සන් තැබිණ.

**<u>අධ්‍යාපනය</u>**

**පකිස්තානය**

- පකිස්තාන තාක්ෂණික සහයෝගිතා වැඩසටහන (PTAP) යටතේ 2011-2012 අධ්‍යයන වර්ෂය සඳහා උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන් 6 දෙනෙකුට පකිස්තාන රජය විසින් අවස්ථාව ලබාදෙන ලදී.

- විදේශ රටවල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබාදෙන උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව 100 වැඩසටහන යටතේ, ශ්‍රී ලංකා රජය විසින් පකිස්තාන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 3 දෙනෙකුට අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා අවස්ථාව ලබා දී ඇත.

**<u>ධීවර කටයුතු</u>**

- ධීවර කටයුතු පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කමිටුවේ 4 වැනි රැස්වීම, 2012 ජනවාරි 13-14 දිනවල කොළඹ දී පැවැත්විණ.

**<u>වෙනත්</u>**

- ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපායික අධ්‍යයනය පිළිබඳ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය (LKIIRSS) සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වන පර්යේෂණ හා තොරතුරු පද්ධතිය (RIS) අතර ගිවිසුමට ග්‍රාමීය සංවර්ධන, පානීය ජලය සහ සනීපාරක්ෂාව පිළිබඳ ඉන්දියානු අමාත්‍ය ගරු ජයරාම් රමේෂ් මහතාගේ සංචාරය අතරතුර 2012 ජූලි මස 12 දින අත්සන් තැබීම සඳහා මෙම අංශය විසින් පහසුකම් සලසන ලදී.

## සාර්ක් අංශය

**මෙම අංශයේ නිලධාරීන් සහභාගී වූ රැස්වීම්:**

2012 පෙබරවාරි 27-29 දිනවල සාර්ක් මහ ලේකම් කාර්යාලයේදී පැවති සාර්ක් මහ ලේකම් කාර්යාලයේ මහ ලේකම්වරයාගේ, අධ්‍යක්ෂවරුන්ගේ සහ සාමාන්‍ය සේවා සපයන නිලධාරීන්ගේ 1 කාණ්ඩයේ, වැටුප් සහ දීමනා ඉහළ දැමීමින් සංශෝධනය කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සඳහා පැවති රැස්වීමට සාර්ක් අංශයේ නිලධාරීහු සහභාගී වූහ.

ජනාධිපති නීතිඥ සහ ත්‍රස්තවාදය පිළිබඳ එක්සත් ජාතීන්ගේ තත්කාර්ය කමිටුවේ සභාපති ආචාර්ය රොහාන් පෙරේරා මහතා විදේශ කටයුතු අමාත්‍යාංශයේ දකුණු ආසියා හා සාර්ක් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පෝෂිත පෙරේරා මහතා සහ නියෝජ්‍ය පොලිස්පති හා පොලිස් දෙපාර්තමේන්තුවේ උපදේශක සී.එස්.වාකිෂ්ඨ මහතා, 2012 පෙබරවාරි 9-10 දිනවලදී නවදිල්ලි හි පැවති, ත්‍රස්තවාදයට එරෙහි සාර්ක් යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා වන සුප්‍රසිද්ධ විශේෂඥ කණ්ඩායමේ ඉහළ මට්ටමේ රැස්වීමට සහභාගී විය. මෙම රැස්වීමේදී, ත්‍රස්තවාදය මැඩලීම හා ත්‍රස්තවාදයට එරෙහි සාර්ක් යාන්ත්‍රණය ශක්තිමත් කිරීම පිළිබඳ සංකල්ප පත්‍රිකාව, අපරාධ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අන්‍යෝන්‍ය සහාය ලබාදීම පිළිබඳ සාර්ක් සම්මුතිය, බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම සහ පොලිස් කටයුතුවලදී සහාය, ත්‍රස්තවාදය මර්දනය කිරීම සඳහා ගනු ලබන සුවිශේෂී පියවර සහ මානවසම්පත් සංවර්ධනය හා සබඳතා වර්ධනය කිරීම පිළිබඳවසාකච්ඡා කෙරිණ. 2013 වසරේදී පැවැත්වෙන මීළඟ රැස්වීම සඳහා සත්කාරකත්වය ලබාදීමට මෙම ඉහළ මට්ටමේ රැස්වීම විසින් ශ්‍රී ලංකාවට නිර්දේශ කෙරිණ. සාමාජික රටවල් සමඟ උපදේශනයෙන් යුතුව, කරුණු පැහැදිලි කිරීමේ සටහනක් සහිතව ආදර්ශ නීතියක් සකස් කිරීම සඳහා වූ ශ්‍රී ලංකාවේ යෝජනාව මෙම රැස්වීමේදී පිළිගැනීමට ලක්විය. මරාගෙන මැරෙන ත්‍රස්තවාදී කටයුතු මර්දනය කිරීම පිළිබඳව වැඩමුළුවක් අනාගතයේදී පවත්වන ලෙසට ද ශ්‍රී ලංකාවට නිර්දේශ කෙරිණ.

දකුණු ආසියා හා සාර්ක් අංශයේ අධ්‍යක්ෂ ජනරාල් වී.ක්‍රිෂ්ණමූර්ති මහතා, 2012 මැයි 23-24 දිනවල භූතානයේදී පැවති, මහලේකම් කාර්යාලය සහ කලාපීය මධ්‍යස්ථාන ඇතුළු සාර්ක් යාන්ත්‍රණ ශක්තිමත් කිරීම හා සම්බන්ධයෙන් යොමු කිරීම් අනුදේශ සැකසීම සඳහා පැවැත්වූ ජාතික කේන්ද්‍රස්ථානවල රැස්වීමට සහභාගී විය. ව්‍යවස්ථාපිත ආයතනවල සිට රාජ්‍ය නොවන සංවිධාන දක්වා විවිධ දකුණු ආසියාතු ආයතන, සාර්ක් සංවිධානය සමඟ සමීප සබඳතාවයක් ඇති කර ගැනීමේ හෝ එහි පිළිගැනීමට නතුවීමේ අපේක්ෂාවෙන් පසුවන බව මෙම රැස්වීමේදී සඳහන් කෙරිණ. කලාපය තුළ පවතින ආයතන සමඟ නව ආකාරයේ සබඳතා නිර්මාණය කර ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ සලකා බලන ලෙස මෙම රැස්වීමේදී මහ ලේකම් කාර්යාලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් විය.

දෙවැනි දකුණු ආසියා සංසදය, 2013 මුල් භාගයේදී මාලදිවයිනේ පැවැත්වීමට නියමිතය. ඒ අනුව, දෙවන දකුණු ආසියා සංසදය සඳහා මෙහෙයුම් කමිටුව, 2012 ජූනි 6-7 දිනවලදී කත්මණ්ඩු සාර්ක් මහ ලේකම් කාර්යාලයේදී රැස්විය. දකුණු ආසියා සහ සාර්ක් අංශයේ අධ්‍යක්ෂ ජනරාල් වී.ක්‍රිෂ්ණමූර්ති මහතා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මෙම රැස්වීමට සහභාගී විය. දකුණු ආසියා සංසදයේ අරමුණ, දකුණු ආසියාව සහ එහි අනාගත සංවර්ධනය පිළිබඳ විවාද, සාකච්ඡා සහ අදහස් හුවමාරු කර ගැනීම් පැවැත්වීමට විවෘත වේදිකාවක් සලසා දීම වන බව මෙම මෙහෙයුම් කමිටු රැස්වීමේදී සිහිපත් කෙරිණ.

**සාර්ක් අංශය, රේඛීය අමාත්‍යාංශ / නියෝජිතායතන සමඟ එක්ව සංවිධානය කරන ලද රැස්වීම්.**

සාර්ක් සංවිධානයේ මහ ලේකම් අතිගරු අහ්මඩ් සලීම් මහතා සහ නියෝජිත කණ්ඩායම, 2012 මැයි 28-30 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර එම සංචාරය අතරතුරදී,

1. අතිගරු ජනාධිපතිතුමා
2. ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා
3. ලේකම්/ විදේශ කටයුතු

බැහැ දුටුවේය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වූ සියලු කටයුතු සූදානම් කිරීම්, සන්ධාන අංශය සමඟ සහයෝගිතාවයෙන් යුතුව සාර්ක් අංශය විසින් සිදු කරන ලදී.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව, 2012 පෙබරවාරි 20-23 දිනවලදී සංස්ථාපිත බදුකරණය හා සම්බන්ධයෙන් පවතින ගැටලු පිළිබඳව සාර්ක් සම්මන්ත්‍රණයක් සංවිධානය කළේය. මෙම සම්මන්ත්‍රණය ඉතා සාර්ථක වූ අතර, සියලුම සාර්ක් සාමාජික රටවල් නියෝජිතයෝ ඊට සහභාගී වූහ.

**විද්‍යාගාර ජාලගතකරණය පිළිබඳ කලාපීය වැඩමුළුව**

2012 මාර්තු 28-29 දිනවලදී කොළඹදී ද, බෝවන රෝග සම්බන්ධයෙන් සාර්ක් කලාපීය ක්‍රමෝපාය පිළිබඳ සාකච්ඡා කර අවසාන තීරණයකට එළඹීම සඳහා විශේෂඥ කමිටු රැස්වීම, ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගිතාවයෙන් යුතුව, 2012 මාර්තු 30 වන දින කොළඹ දී ද පැවැත්විණ. මෙම රැස්වීම සහ වැඩමුළුව සංවිධානය කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සාර්ක් අංශය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. මෙම රැස්වීමට සහ වැඩමුළුවට සියලුම සාර්ක් සාමාජික රටවල නියෝජිතයෝ සහභාගී වූහ. මීට අමතරව, ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ සාර්ක් ලේකම් කාර්යාලයේ නියෝජිතයෝ මෙම රැස්වීමට සහභාගී වූහ.

2012 ජනවාරි 29 වැනි දින ඩකා හිදී පැවති සාර්ක් මුදල් ලේකම්වරුන්ගේ පස්වැනි රැස්වීමෙන් පසු, **සාර්ක් මුදල් අමාත්‍යවරුන්ගේ පස් වැනි රැස්වීම** 2012 ජනවාරි 30 වැනි දින ඩකාහිදී පවත්වන ලදී. සාර්ක් මුදල් අමාත්‍යවරුන්ගේ හය වැනි රැස්වීම 2013 වසරේදී කොළඹ දී පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ ඉදිරිපත් වීම සම්බන්ධයෙන් මෙම සාර්ක් මුදල් අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී ප්‍රසාදය පළවිය.

**සාර්ක් රාජ්‍ය ණය කළමනාකරුවන්ගේ සංසදයේ ප්‍රථම රැස්වීම** 2012 ජූලි 19-20 දිනවලදී ශ්‍රී ලංකාවේ කොළඹදී පැවැත්විණි. වොෂින්ටන් ඩී.සී. හි ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු සහ කැනේඩියානු මහාචාර්යවරයෙකු වන ණය වෙළඳපළේ ඉතා කීර්තිමත් පාර්ශවකරුවන් කිහිපදෙනෙකුට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මේ සඳහා ආරාධනා කොට තිබිණ. විදේශ කටයුතු අමාත්‍යාංශය ඉහත රැස්වීම පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය.

කොළඹ පිහිටි සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය (SCC), විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව, මූර්ති සහ සැරසිලි කලාව හා සම්බන්ධ දකුණු ආසියාවේ පොදු උරුමය පිළිබඳ සිම්පෝසියම, චාරිත්‍රවාරිත්‍ර, ආචාර ධර්ම සහ සමාජයීය ස්ථාවරත්වය පිළිබඳ සම්මන්ත්‍රණය, චිත්‍රපට උළෙල, පිරිහීමට ලක්වන සංස්කෘතීන් පිළිබඳ සම්මේලනය, කලා ප්‍රදර්ශනය සහ කඳවුර වැනි වැඩසටහන් ගණනාවක් පැවැත්විය. සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය මෑතකදී සාර්ක් චිත්‍ර ශිල්පීන්ගේ කඳවුර සහ චිත්‍ර ප්‍රදර්ශනය පවත්වන ලද අතර, ශ්‍රී ලංකාවේ අලංකාර පාරිසරික දර්ශනවලින් නිර්මාණාත්මක ආභාෂය ලබමින් එක් ස්ථානයකට රැස්වී නිර්මාණකරණයේ යෙදීමට සාර්ක් කලාපයේ චිත්‍ර ශිල්පන්ට මෙහිදී අවස්ථාව ලැබිණ. ඇෆ්ගනිස්තානයේ, බංග්ලාදේශයේ, ඉන්දියාවේ, මාලදිවයිනේ සහ ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ චිත්‍ර ශිල්පීන් මෙම කඳවුරට සහභාගී වූ අතර කැන්වසය මත ඇඳි ඔවුන්ගේ චිත්‍ර නිර්මාණ

කෙටිකාලීනව/ දීර්ඝකාලීනව බද්දට ලබා ගැනීමට මේ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්වවලට දැන් අවස්ථාව ලැබී තිබේ.

"සාර්ක් චිත්‍ර නිර්මාණ" ලෙස ප්‍රවර්ධනය කෙරෙන මෙම විශිෂ්ට කලා නිර්මාණ, සාර්ක් සාමාජික රටවල සහ නිරීක්ෂක රටවල තානාපති කාර්යාලවලට සහ දූත මණ්ඩලවලට, චිත්‍රාගාරවලට සහ වාණිජ ආයතනවලට ප්‍රමුඛතාවය ලබා දෙමින්, මේ පිළිබඳව උනන්දුවක් දක්වන පුද්ගලයන්ට කුලියට දෙනු ලැබේ. මේ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්වවලට, සුදුසු ආකාරයේ ප්‍රදර්ශන කිරීමේ තත්ත්ව යටතේ සහ සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයට සහ අදාල චිත්‍ර ශිල්පියාට සුදුසු පිළිගැනීම ලැබෙන පරිදි මෙම චිත්‍ර ප්‍රදර්ශනය කිරීමට භාර ගත හැක. "සාර්ක් චිත්‍ර නිර්මාණ" ලෙස ප්‍රවර්ධනය කෙරෙන මෙම චිත්‍ර, සමස්ත චිත්‍ර එකතුවක්, රටවල් අනුව වර්ග කළ චිත්‍ර එකතුවක් හෝ ඒ ඒ ශිල්පියාගේ චිත්‍ර එකතුවක් ලෙස සැලකිය හැක.

සාර්ක් සංවර්ධන අරමුදල (SDF) සතුව කලාපීය සහයෝගීතාවයේ ප්‍රධාන පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ හැකියාවක් පවතින බැවින්, කලාපය තුළ වැදගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සාර්ක් සංවර්ධන අරමුදලෙන් අරමුදල් ලබා ගැනීම සඳහා සාමාජික රටවල් අතර කැමැත්තක් ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතී. ශ්‍රී ලංකාව හා සම්බන්ධයෙන් ගත් කළ, ශ්‍රී ලංකාවේ පිහිටි නිවසේ සිට රැකියාවක යෙදෙන්නන් සඳහා වන සාර්ක් ව්‍යාපාරික සංගමය (SABAH) පූර්ණ වශයෙන් සක්‍රියව පවතින අතර ශ්‍රී ලංකාවේ පිහිටි මෙම සංගමය ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක හයක් ආවරණය කරන 2500 ක පමණ පාරිභෝගික පිරිසකින් යුක්ත වන බව දිරි ගන්වන සුළු කාරණාවක් ලෙස පැවසිය හැක. නිවසේ සිට රැකියාවක යෙදෙන්නන් 200 කට අධික ප්‍රමාණයකට, ශ්‍රී ලංකාවේදී සහ ඉන්දියාවේ ස්වයං රැකියාවෙහි යෙදෙන කාන්තා සංගමයේදී (SEVA) සෘජු තාක්ෂණ සහ කළමනාකරණ පුහුණුව ලබා දී ඇත. "ළමයින්ට එරෙහි හිංසනය නැවැත්වීම පිළිබඳ දකුණු ආසියානු මූලික ක්‍රියාමාර්ග සහ "ජලය ලබා ගැනීමට ඇති හැකියාව" පිළිබඳ ව්‍යාපෘති දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පවතින අතර, ශ්‍රී ලංකාවේ සිදු කිරීමට නියමිත වෙනත් ව්‍යාපෘති තුනක් සාර්ක් සංවර්ධන අරමුදලේ පාලක මණ්ඩලය විසින් මෙම වසරේදී අනුමත කොට තිබේ.

**ආර්ථික සහයෝගීතාවය පිළිබඳ කමිටුවේ 15 වැනි රැස්වීම**

2012 ජූලි 15-16 දිනවලදී මාලදිවයිනේදී පැවැත්විණ. ඊට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය, අධ්‍යක්ෂ/වාණිජ නිමල් කරුණාතිලක මහතා විසින් දරන ලදී. ආර්ථික සහයෝගීතාවය පිළිබඳ කමිටුව වසර තුනකට අධික කාල සීමාවකින් අනතුරුව මෙහිදී ප්‍රථම වතාවට යළිත් රැස්විය.

තීරුබදු පිළිබඳ සීමා අඩු කිරීමේ ක්‍රියාවලිය යටතේ, 2012 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි සංවේදී ලැයිස්තු අඩු කිරීමේ II වන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා ද ශ්‍රී ලංකාව කටයුතු සම්පාදනය කරමින් සිටියි. කෙසේ වුවද, දශක තුනකට ආසන්න කාල සීමාවක් පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමෙන් පසු ශ්‍රී ලංකා ආර්ථිකය වේගයෙන් වෙනස් වීමකට ලක්වන කාල පරිච්ඡේදයකට පියනගා ඇති බැවින්, II වන අදියර යටතේ සංවේදී ලැයිස්තුවෙන් ඉවත් කිරීම සඳහා නිෂ්පාදන හඳුනා ගැනීම සඳහා පාර්ශ්වකරුවන්ගෙන් නැවත උපදෙස් විමසීමේ අවශ්‍යතාවයක් මතු වී තිබේ. මෙම අවශ්‍යතාවය හේතුවෙන් යම් ප්‍රමාදයක් ඇති වී තිබුණද, ශ්‍රී ලංකාවේ සංවේදී ලැයිස්තුවෙන් ඉවත් කරන නිෂ්පාදන ලැයිස්තුව පිළිබඳ හැකි ඉක්මණින් අවසාන තීරණයකට එළඹීමට ශ්‍රී ලංකාව බලාපොරොත්තු වෙයි.

**සාර්ක් අභ්‍යන්තර/ස්වදේශීය අමාත්‍යවරුන්ගේ පස්වැනි රුස්වීම**

2012 සැප්තැම්බර් 26 වැනි දින මාලදිවයිනේදී පැවැත්විණ. රාජ්‍ය පරිපාලන සහ ස්වදේශීය කටයුතු අමාත්‍ය ගරු ඩබ්.ඩී.ජේ.සෙනෙවිරත්න මහතා විසින් මේ සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය දරන ලද අතර, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු එම නියෝජිත කණ්ඩායමට අයත් විය. මත්ද්‍රව්‍ය, මොළයේ මධ්‍ය ස්නායු පද්ධතියට බලපෑම් ඇති කළ හැකි ද්‍රව්‍ය සහ සුළු අවි ජාවාරම් කිරීම සහ ත්‍රස්තවාදී කටයුතු අතර තිබෙන සම්බන්ධතාවය සැලකිල්ලට ගනිමින්, ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමටද, ත්‍රස්තවාදය මර්දනය කිරීම සඳහා සම්බන්ධීකරණයෙන් යුතුව ඒකාබද්ධ ප්‍රයත්න යෙදීමටද නායකයන් මෙහිදී අධිෂ්ඨාන කර ගත් අතර, ජාත්‍යන්තර ත්‍රස්තවාදය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමවබෝධිත සම්මුතියට හැකිතාක් ඉක්මණින් එළඹීම සහ සාපරාධී කටයුතු පිළිබඳ කටයුතු කිරීමේදී අන්‍යෝන්‍ය සහාය ලබා දීම පිළිබඳ සාර්ක් සම්මුතිය තහවුරු කිරීම පිළිබඳව මෙහිදී නායකයන්ගේ අවධානය යොමු වන ලදී. මෙම රුස්වීමේදී අභ්‍යන්තර/ ස්වදේශීය අමාත්‍යවරුන්ගේ හයවැනි රුස්වීම සහ ඊට පෙරාතුව පැවැත්වෙන සාර්ක් රටවල අභ්‍යන්තර/ ස්වදේශය ලේකම්වරුන්ගේ රුස්වීම හා සංක්‍රමණය පිළිබඳ සාර්ක් රටවල ආගමන බලධාරීන්ගේ හයවැනි රුස්වීම සඳහා 2013 වසරේද සත්කාරකත්වය ලබා දීම සඳහා ශ්‍රී ලංකාව ඉදිරිපත් විය.

මෙම කාල සීමාව ඇතුළතදී, සාර්ක් සංවිධානයේ පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා මෙම අමාත්‍යාංශය, අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය.

1. කෘෂිකර්ම අමාත්‍යාංශය
   - හයිද්‍රාබාද් හි කෘෂිකර්ම ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනයේදී, 2012 පෙබරවාරි 18-29 දිනවලදී පැවති " කෘෂිකර්ම ව්‍යාප්ති කළමනාකරණයේ නව පැතිකඩ " පිළිබඳ පුහුණු වැඩසටහන.
   - 2012 ජනවාරි 28 පෙබරවාරි 4 කාල සීමාව ඇතුළත ශ්‍රී ලංකාවේ දී පැවති "දකුණු ආසියාව තුළ ආහාර සුරක්ෂිතතාව සහ ජල සම්පත්වල තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා අස්වනු නෙලා ගැනීමේදී යොදා ගන්නා ක්‍රමවේද පිළිබඳ ආදර්ශ සැකසීමේ හැකියාව වැඩි දියුණු කිරීම" පිළිබඳ සාර්ක් - ඕස්ට්‍රේලියා ව්‍යාපෘතිය.
   - සාර්ක් රටවල පසු අස්වනු කළමනාකරණය සහ පෝෂක ප්‍රදේශවලදී නිෂ්පාදන කටයුතු සිදු කිරීමේදී පළතුරුවලට වටිනාකමක් එක් කිරීම භූතානය, 2012 නොවැම්බර් 14 - 16.
   - සාර්ක් රටවල කෘෂිකර්මාන්තය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, 2012 දෙසැම්බර් 12 - 15 - භූතානය.
   - සාර්ක් රටවල කෘෂිකාර්මික තොරතුරු හා දැනුම සඳහා ප්‍රවේශය ලබා දීම උදෙසා වන සමූහ ක්‍රියාකාරීත්වය පිළිබඳ කලාපීය උපදේශනය, 2012 දෙසැම්බර් 12 - 15 - භූතානය.

2. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

   - 2012 මාර්තු 6-7 දිනවලදී ඉස්ලාමාබාද් දී පැවති සාර්ක් සාමාජික රටවල විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳ වැඩමුළුව.

3. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

- 2012 සැප්තැම්බර් 24-28 දිනවලදී, නවදිල්ලි හි මධ්‍යම සත්වෝද්‍යාන අධිකාරියේ පැවති "සත්වෝද්‍යානවල සිටින සතුන් දමනය කිරීම සහ ඔවුන් ප්‍රවාහනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන".
- දිළිඳු බව තුරන් කිරීම පිළිබඳ සාර්ක් ඒකාබද්ධ ව්‍යාපෘති යෝජනාව - 2012 නොවැම්බර් 26 - 30 භූතානය
- සාර්ක් සංවර්ධන ඉලක්ක පිළිබඳ වැඩමුළුව 2012 නොවැම්බර් 20 - 22 - ඉන්දියාව
- සාර්ක් කලාපයේ රැකියා ගැටලු මැඩලීම සඳහා සංවර්ධන ක්‍රමෝපාය - 2012 දෙසැම්බර් 18 - 20, ඩකා
- නිවසේ සිට රැකියාවක යෙදෙන්නන්ගේ සාර්ක් ව්‍යාපාරික සංගමයේ (SABAH) ව්‍යාපාරික සැලසුම් රැස්වීම, 2012 දෙසැම්බර් 29 - 30 - ඉන්දියාව

4. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

- මුදල් වෙබ් අඩවිය පිළිබඳ සම්මන්ත්‍රණය - නොවැම්බර් 26 - 27 - ඉන්දියාව
- බඳු ව්‍යාපෘති සේවා පිළිබඳ සාර්ක් සම්මන්ත්‍රණය - 2012 නොවැම්බර් 27 - 30 - නේපාලය
- වෙළඳ පළ ප්‍රවේශ පියවර ගැඹුරින් විශ්ලේෂණය කිරීම පිළිබඳ ජාත්‍යන්තර වාණිජ මණ්ඩල (ICC) වැඩමුළුව, දෙසැම්බර් 3 - 6 - චෙන්නායි
- සංඛ්‍යා ලේඛන පිළිබඳ සාර්ක් කණ්ඩායමේ (SAARC STAT) දත්ත සංස්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන, 2012 දෙසැම්බර් 10 - 14 - ඉන්දියාව

5. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

- 2012 මාර්තු 29 සිට 2012 අප්‍රේල් 18 දක්වා කොරියාවේදී පැවති දේශගුණික විපර්යාස සහ ආපදා කළමනාකරණය පිළිබඳ සාර්ක් විශේෂ පුහුණු වැඩහටන.
- දකුණු ආසියාව තුළ ගංවතුර අවදානම කළමනාකරණය කිරීම පිළිබඳ ඉස්ලාමාබාද් හි දී පැවති වැඩමුළුව, 2012 ඔක්තෝබර් 9 - 10
- දකුණු ආසියාවේ ලැව් ගිනි ආපදා කළමනාකරණය - නව දිල්ලිය - 2012 නොවැම්බර් 5 - 9

6. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය

- කලාපීය ශක්‍යතා වර්ධන සේවකයන් (පොලීසිය) - පකිස්තානය - 2012 නොවැම්බර් 19 - 20

7. සෞඛ්‍ය අමාත්‍යාංශය

- ක්ෂය රෝගය තුරන් කිරීම/ පාලනය කිරීම සඳහා සාර්ක් කලාපීය ක්‍රමෝපාය - 2012 දෙසැම්බර් 6 - 7 කත්මණ්ඩු

8. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

- සාර්ක් පාරම්පරික අත්යන්ත්‍ර පේෂකර්ම උළෙල - 2012 ඔක්තෝබර් 28 - නොවැම්බර් 07 - ඉන්දියාව
- සාර්ක් කලාපයේ පාරම්පරික බෙර වාදනය පිළිබඳ සංස්කෘතික උළෙල - 2012 නොවැම්බර් 21 - 24, භූතානය
- සංවර්ධන ඉලක්ක ජය ගැනීම සඳහා වාර්තා චිත්‍රපට ඒකාබද්ධව නිෂ්පාදනය කිරීම පිළිබඳ වැඩමුළුව - 2012 දෙසැම්බර් 17 - 19, ඉස්ලාමාබාද්

9. ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය

- ළමුන් සහ කාන්තාවන් පිළිබඳ කලාපීය ශක්‍යතා වර්ධන වැඩමුළුව - නොවැම්බර් 19 - 20 - නව දිල්ලිය
- කාන්තාවන් හා ළමුන් පිළිබඳ ජාතික ක්‍රියාකාරී හා සම්බන්ධීකරණ කමිටුවේ 4 වැනි රැස්වීම - 2012 නොවැම්බර් 26 - 28, භූතානය

10. ශ්‍රී ලංකා අක්ත ගැන්වීමේ මණ්ඩලය

- 2012 සැප්තැම්බර් 3-4 දිනවලදී මාලදිවයිනේ පැවති අක්ත ගැන්වීම පිළිබඳ සාර්ක් විද්වත් කණ්ඩායමේ (SEGA) ප්‍රථම රැස්වීම සහ ඉන් අනතුරුව 2012 සැප්තැම්බර් 05 වැනි දින පැවති වැඩමුළුව.

11. ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

- කෘෂිකර්මාන්තය සම්බන්ධ සංඛ්‍යාලේඛන සම්බන්ධයෙන් පැවති "සංඛ්‍යාලේඛන පිළිබඳ සාර්ක් කණ්ඩායමේ" (SAARCSTAT) පුහුණු වැඩසටහන, 2012 අගෝස්තු 27-31, ඉන්දියාව.

- ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධ ගැටලු සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංඛ්‍යාලේඛන හා සම්බන්ධයෙන් පැවති "සංඛ්‍යාලේඛන පිළිබඳ සාර්ක් කණ්ඩායමේ" (SAARCSTAT) පුහුණු වැඩසටහන, 2012 සැප්තැම්බර් 24-28.

- "සංඛ්‍යාලේඛන පිළිබඳ සාර්ක් කණ්ඩායමේ" (SAARCSTAT) අධ්‍යයනයන් පිළිබඳ සාර්ක්- ආසියා සංවර්ධන බැංකු වැඩමළුව, සාර්ක් මහ ලේකම් කාර්යාලය, කත්මණ්ඩු, 2012 ජූනි 23.

12. විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය

- පුනර්ජනනීය බල ශක්ති ප්‍රතිපත්ති විධිමත් කිරීම සහ විදුලි ජනක ස්ථාන සම්බන්ධ කරන සම්ප්‍රේෂණ මාර්ග පද්ධතිය ආශ්‍රිත සම්බන්ධ කිරීමේ ගැටලු - නොවැම්බර් 21 - 22, භූතානය

**කල් දමන ලද සාර්ක් රැස්වීම්**

1. සාර්ක් සංගමයේ ක්‍රියාකාරකම් කාල සටහන අනුව, රේගු සහයෝගිතාවය පිළිබඳ සාර්ක් උප කමිටුවේ නව වැනි රැස්වීම 2012 වසරේ දෙවන කාර්තුවේදී කොළඹ දී පැවැත්වීමට නියමිතව තිබිණි. එනමුත්, යම් යම් හේතු නිසා එම රැස්වීම පැවැත්වීමට රේගු දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය කටයුතු සූදානම් නොකරන ලදි. (මෙම රැසවීම 2013 ජූනි 18 - 23 දිනවලදී කොළඹදී පැවැත්වෙනු ඇත)

2. කෘෂිකාර්මික පර්යේෂණ හා ව්‍යාප්තිය පිළිබඳ අන්තර් - ආණ්ඩු ප්‍රධාන කණ්ඩායමේ තෙවැනි රැස්වීම, 2011 ඔක්තෝබර් 3 - 4 දිනවලදී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිතව තිබිණ. සාර්ක් මහලේකම් කාර්යාලයෙන් ලැබුණු ඉල්ලීමක් පරිදි, එම රැස්වීම 2012 වසර දක්වා කල් දැමීමට සිදුවිය. 2012 වසර සඳහා අවශ්‍ය තරම් ප්‍රතිපාදන නොමැති බැවින් එම රැස්වීම පැවැත්වීමට නොහැකි බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබේ.

3. බලශක්තිය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සත්වැනි රැස්වීම, 2012 නොවැම්බර් 23 - 24 දිනවල ශ්‍රී ලංකාවේ මාරවිල දී පැවැත්වීමට නියමිතව තිබිණ. සමහර සාමාජික රටවල ඉල්ලීම පරිදි එම රැස්වීම 2013 මාර්තු දක්වා කල් දැමිණ. (මෙම රැස්වීම 2013 මාර්තු 15-16 දිනවලදී මාරවිලදී පැවැත්විණ)

ශ්‍රී ලංකාව 2013 වර්ෂයේදී ජූලි/අගෝස්තු මාසවලදී පහත සඳහන් රැස්වීම් පවත්වනු ඇත.

1. සමෝධානික වෙරළ කලාප කළමනාකරණය හා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දැක්මට අනුව අත්දැකීම් හුවමාරු කර ගැනීම පිළිබඳ වැඩමුළුව, (සාර්ක් වෙළඳ කලාප කළමනාකරණ මධ්‍යස්ථානය), 2013 ජූලි 2-7, මීගමුව
2. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ (SAFTA) විද්වත් කමිටුවේ අටවැනි රැස්වීම, 2013 අගොස්තු 22, කොළඹ
3. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ අමාත්‍ය කවුන්සිලයේ හත්වැනි රැස්වීම, 2013 අගොස්තු 23, කොළඹ
4. සාර්ක් මුදල් ලේකම්වරුන්ගේ හයවැනි රැස්වීම, 2013 අගෝස්තු 29, කොළඹ
5. සාර්ක් මුදල් අමාත්‍යවරුන්ගේ හයවැනි රැස්වීම, 2013 අගොස්තු 30, කොළඹ

අභ්‍යන්තර/ සවදේශීය කටයුතු අමාත්‍යවරුන්ගේ පස්වැනි රැස්වීම සහ ඊට පෙරාතුව පැවති අභ්‍යන්තර/ ස්වදේශීය කටයුතු ලේකම්වරුන්ගේ පස්වැනි රැස්වීම හා සාර්ක් ආගමන බලධාරීන්ගේ පස්වැනි රැස්වීම 2012 සැප්තැම්බර් 24-26 දිනවලදී පැවැත්විණ. මෙම රැස්වීම අතරතුරදී, අභ්‍යන්තර/ස්වදේශීය කටයුතු අමාත්‍යවරුන්ගේ හයවැනි රැස්වීම සහ ඊට පෙරාතුව අභ්‍යන්තර/ස්වදේශීය කටයුතු ලේකම්වරුන්ගේ හයවැනි රැස්වීම සහ සාර්ක් ආගමන බලධාරීන්ගේ හයවැනි රැස්වීම පැවැත්වීමට තීරණය කරන ලදි. මෙම රැස්වීම පිළිබඳ දින වකවානු නේපාලය විසින් තහවුරු කර ඇත. (2013 නොවැම්බර් 11-13)

“අ” ඇමුණුමේ දැක්වෙන සාර්ක් රැස්වීම්, 2012 ඔක්තෝබර් 01 සිට 2012 දෙසැම්බර් 31 දක්වා වන සමාලෝචනයට බඳුන් කෙරෙන කාලය තුළ සාර්ක් සාමාජික රටවලදී පවත්වා තිබේ.

රැස්වීම්වලට වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වලින් නියෝජිතයන් සහභාගී වූ විට, අමාත්‍යාංශය, ශ්‍රී ලංකාවේ අදාල රේඛීය අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුව සමඟ සබඳතාවයෙන් යුතුව කටයුතු කර ඇත.

අවශ්‍ය වූ අවස්ථාවලදී, සාර්ක් අංශය, ශ්‍රී ලංකාවෙන් සහභාගී වන නියෝජිත කණ්ඩායම් සමඟ සාකච්ඡා පවත්වා ඇති අතර, පහත සඳහන් සහාය ලබා දී තිබේ.

- සාර්ක් රැස්වීම්වලට සහභාගී වන්නන් වෙත සියලු න්‍යායපත්‍ර අයිතම සහ සටහන් යොමු කොට තිබේ.

- ශ්‍රී ලංකාව සඳහා උපරිම ප්‍රතිඵල අත්පත් කර ගැනීමේ අරමුණෙන්, එම නියෝජිතයන් විසින් ශ්‍රී ලංකාවට වාසි සහගත ලෙස සහ සාර්ක් කාර්යය රාමුව ඇතුළත, සිය කරුණු ඉදිරිපත් කරන බව තහවුරු කිරීම සඳහා අංශය විසින් න්‍යාය පත්‍රයේ දැක්වෙන අයිතම අධ්‍යයනය කර, න්‍යායපත්‍ර වල අඩංගු වන අයිතම පිළිබඳ සහභාගීවන්නන් සමඟ සාකච්ඡා කරන ලදී.

- ශ්‍රී ලංකාව සහ සාර්ක් සාමාජික රටවල් පොදුවේ මුහුණ දෙනු ලබන ගැටලු සහ ශ්‍රී ලංකාව විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන් පිළිබඳ නියෝජිත කණ්ඩායම්වලට අවශ්‍ය උපදෙස් ලබා දී තිබේ.

- වෙනත් සාර්ක් සාමාජික රටවල් අදාල ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ලබා ගෙන ඇති අත්දැකීම් මඟින් පරිචය ලබා, මෙම ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවේ යහපත උදෙසා ශ්‍රී ලංකාවේදී යොදා ගැනීමේ අරමුණෙන් යුතුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී තිබේ.

- ඔවුන්ගේ සංචාර සඳහා සාර්ක් වීසා නිකුත් කිරීමට පහසුකම් සලසා දී තිබේ.

ශ්‍රී ලංකාවේ පැවති/ පැවැත්වීමට නියමිත රැස්වීම් සඳහා ලබා දෙන ලද මාර්ගෝපදේශනය

ත්‍රස්තවාදය වැලැක්වීම පිළිබඳ සාර්ක් ක්‍රමෝපායික කළමනාකරණ පුහුණු වැඩසටහන සහ බලශක්තිය පිළිබඳ සාර්ක් ක්‍රියාකාරී කණ්ඩාමේ 7 වැනි රැස්වීම 2013 මාර්තු මසදී ශ්‍රී ලංකාවේ පැවැත්විණි. සාර්ක් පිළිවෙත අනුගමනය කරමින්, ඉහත සඳහන් කළ සාර්ක් රැස්වීම් පැවැත්වීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට හා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දීම සඳහා එම ආයතන දෙකෙහි නිලධාරීන් සමඟ රැස්වීම් ගණනාවක් පවත්වන ලදී. රැස්වීම් පැවැත්වීමේදී අනුගමනය කරන පිළිවෙත්, රැස්වීම් සඳහා වන න්‍යාය පත අයිතම, රැස්වීම්වලට අවශ්‍ය වන කෙටුම්පත් කරන ලද කතා සහ සහභාගීත්වය තහවුරු කිරීම සඳහා සාර්ක් මහලේකම් කාර්යාලය සමඟ සම්බන්ධ වීම යනාදිය 2013 වසරේදී පැවැත්වීමට අපේක්ෂිත රැස්වීම්වලට කටයුතු සූදානම් කිරීමේදී අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

"අ" ඇමුණුම

| උප ශීර්ෂය/ විෂයය | කෙටි විස්තර | වෙනත් කරුණු |
|---|---|---|
| ද්විපාර්ශ්වික සබඳතා | - | |
| බහු පාර්ශ්වික සබඳතා | - | |
| ආර්ථික සබඳතා | මුදල් වෙබ් අඩවිය පිළිබඳ සම්මන්ත්‍රණය - නොවැම්බර් 26 - 27, ඉන්දියාව<br><br>බහු ව්‍යාපෘති සේවා පිළිබඳ සාර්ක් සම්මන්ත්‍රණය - 2012 නොවැම්බර් 27 - 30, නේපාලය<br><br>වෙළඳ පළ ප්‍රවේශ පියවර ගැඹුරින් විශ්ලේෂණය කිරීම පිළිබඳ ජාත්‍යන්තර වාණිජ මණ්ඩල (ICC) වැඩමුළුව - දෙසැම්බර් 03 - 06, චෙන්නායි<br><br>සංඛ්‍යා ලේඛන පිළිබඳ සාර්ක් කණ්ඩායමේ (SAARC STAT) දත්ත සංස්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන, 2012 දෙසැම්බර් 10 - 14, ඉන්දියාව | |
| සංස්කෘතික සබඳතා | සාර්ක් පාරම්පරික අත් යන්ත්‍ර පේෂ කර්ම උළෙල - ඉන්දියාව - 2012 ඔක්තෝබර් 28 - නොවැම්බර් 07<br><br>සාර්ක් කලාපයේ පාරම්පරික බෙර වාදනය පිළිබඳව සංස්කෘතික උළෙල - 2012 නොවැම්බර් 21 - 24, භූතානය<br><br>සංවර්ධන ඉලක්ක ජය ගැනීම සඳහා වාර්තා චිත්‍රපට ඒකාබද්ධ වශයෙන් නිෂ්පාදනය කිරීම පිළිබඳ වැඩමුළුව - 2012 දෙසැම්බර් 17 - 19, ඉස්ලාමාබාද් | |
| කම්කරු සුභ සාධනය | - | |
| විදේශ ආයෝජනය | - | |
| සංචාරක ප්‍රවර්ධනය | - | |
| වෙළඳ ප්‍රවර්ධනය | - | |
| පරිසර සහ ආපදා කළමනාකරණය | දකුණු ආසියාව තුළ ගංවතුර අවධානම කළමනාකරණය පිළිබඳ වැඩ මුළුව - ඉස්ලාමාබාද් 2012 ඔක්තෝබර් 09 - 10<br><br>දකුණු ආසියාවේ ලැව් ගිනි ආපදා කළමණාකරණය - නව දිල්ලිය - 2012 නොවැම්බර් 5 - 9 | |
| ආරක්ෂාව | කලාපීය ශක්‍යතා වර්ධන සේවකයන් (පොලීසිය) - පකිස්තානය, 2012 නොවැම්බර් 19 - 20 | |

| | | |
|---|---|---|
| දේශපාලනය | සාර්ක් කතානායකවරුන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමයේ 6 වැනි සමුළුව - පකිස්තානය - 2012 නොවැම්බර් 03 - 07<br><br>සහශ්‍ර සංවර්ධන ඉලක්ක පිළිබඳ දකුණු, අග්නිදිග සහ මධ්‍යම ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදය - 2015 ඉන් පසු සංවර්ධන න්‍යාය පත්‍රය - ඩකා, 2012 දෙසැම්බර් 09 - 12 | |
| කෘෂි කර්මාන්තය | සාර්ක් රටවල පසු අස්වනු කළමනාකරණය සහ පෝෂක ප්‍රදේශවලදද නිෂ්පාදක කටයුතු සිදු කිරීමේදී පළතුරුවලට වටිනාකම එකතු කිරීම - භූතානය, 2012 නොවැම්බර් 14 - 16<br><br>සාර්ක් රටවල කෘෂිකර්මාන්තය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - 2012 දෙසැම්බර් 12 - 15, භූතානය<br><br>සාර්ක් රටවල කෘෂිකාර්මික තොරතුරු හා දැනුම සඳහා ප්‍රවේශය ලබා දීම උදෙසා වන සමූහ ක්‍රියාකාරිත්වය පිළිබඳ කලාපීය උපදේශනය - 2012 දෙසැම්බර් 12 - 15, භූතානයය<br><br>සාර්ක් රටවල තෝරාගත් එළවළු සම්බන්ධයෙන් අනුවර්තනය වීම් පිළිබඳ සිදු කරන අත්හදා බැලීම් - ඉන්දියාව | |
| බලශක්තිය | පුනර්ජනනීය බලශක්ති ප්‍රතිපත්ති විධිමත් කිරීම සහ විදුලිජනක ස්ථාන සම්බන්ධ කරන සම්ප්‍රේෂණ මාර්ග පද්ධතිය ආශ්‍රිත සම්බන්ධ කිරීමේ ගැටලු - නොවැම්බර් 21 - 22, භූතානය | |
| කාන්තාවන් හා ළමුන් | කාන්තාවන් හා ළමුන් පිළිබඳ කලාපීය ශක්‍යතා වර්ධන වැඩමුළුව, නොවැම්බර් 19 - 20, නවදිල්ලිය<br><br>කාන්තාවන් හා ළමුන් පිළිබඳ ජාතික ක්‍රියාකාරී හා සම්බන්ධීකරණ කමිටුවේ 4 වැනි රැස්වීම, 2012 නොවැම්බර් 26 - 28, භූතානය | |
| දිළිඳු බව තුරන් කිරීම | සාර්ක් සංවර්ධන ඉලක්ක පිළිබඳ වැඩමුළුව - ඉන්දියාව - 2012 නොවැම්බර් 20 - 22<br><br>දිළිඳු බව තුරන් කිරීම පිළිබඳ සාර්ක් ඒකාබද්ධ ව්‍යාපෘති යෝජනාව - නොවැම්බර් 26 - 30, භූතානය<br><br>සාර්ක් කලාපයේ රැකියා ගැටලු මැඩලීම සඳහා සංවර්ධන ක්‍රමෝපාය - 2012 දෙසැම්බර් 18 - 20, ඩකා<br><br>නිවසේ සිට රැකියාවක යෙදෙන්නන්ගේ සාර්ක් ව්‍යාපාරික සංගමයේ (SABAH) ව්‍යාපාරික සැලසුම් රැස්වීම - 2012 දෙසැම්බර් 29 - 30, ඉන්දියාව | |

| | | |
|---|---|---|
| පරිපාලනය | සාර්ක් සාමාජික රටවල රාජ්‍ය/ සිවිල් සේවා කොමිෂන් සභා ප්‍රධානීන්ගේ 2 වැනි රැස්වීම - 2012 දෙසැම්බර් 4 - 6, ඉස්ලාමාබාද් | |
| සෞඛ්‍යය | ක්ෂය රෝගය තුරන් කිරීම/ පාලනය කිරීම පිළිබඳ සාර්ක් කලාපීය ක්‍රමෝපාය - 2012 දෙසැම්බර් 6 - 7, කත්මණ්ඩු | |
| පශු සම්පත් | වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා සිටින ජීවීන් ආරක්ෂා කිරීම පිළිබඳව සත්වෝද්‍යාන නිලධාරීන් සඳහා පැවති පුහුණු වැඩසටහන - ඉන්දියාව, 2012 නොවැම්බර් 17 - 21 | |

# නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශය

**<u>නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශය</u>**

| | | |
|---|---|---|
| **ආවරණය වන රටවල්** | : | ඕස්ට්‍රේලියාව, බෘනායි දරුස්සලාම්, චීනය, කාම්බෝජය, කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී මහජන ජනරජය, ෆීජි, ඉන්දුනීසියාව, ජපානය, කොරියානු ජනරජය, ලාඕසය, මැලේසියාව, මොන්ගෝලියාව, මියන්මාරය, නවසීලන්තය, පිලිපීනය, පැපුවා නිව් ගිනියාව, සිංගප්පූරුව, තායිලන්තය, වියට්නාමය, වනුවාටු සහ හොංකොං විශේෂ පරිපාලනමය ප්‍රදේශය. |
| **නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව** | : | 11 (ඕස්ට්‍රේලියාව, චීනය, ඉන්දුනීසියාව, ජපානය, කොරියානු ජනරජය, මැලේසියාව, මියන්මාරය, පිලිපීනය, සිංගප්පූරුව, තායිලන්තය, වියට්නාමය) |
| **කොන්සල් කාර්යාල සංඛ්‍යාව** | : | 04 (ඕස්ට්‍රේලියාව - සිඩ්නි, චීනය - ෂැංහයි, චෙන්ග්ඩු, ගුවැන්ෂු) |
| **සමගාමීව අක්ත ගැන්වීම්** | : | |
| කැන්බරා (ඕස්ට්‍රේලියාව) | : | ෆීජි, නවසීලන්තය, පැපුවා නිව් ගිනියාව, වනුවාටු |
| සිඩ්නි | : | තස්මේනියාව, දකුණු ඕස්ට්‍රේලියාව |
| චීනය | : | කොරියානු ප්‍රජාතන්ත්‍රිවාදී මහජන ජනරජය, මොන්ගෝලියාව |
| සිංගප්පූරුව | : | බෘනායි දරුස්සලාම් |
| තායිලන්තය | : | කාම්බෝජය, ලාඕසය |
| **බහුපාර්ශ්වීය / කලාපීය සංවිධාන** | : | ආසියාන් කලාපීය සංසදය (ARF), ෂැංහයි සහයෝගිතා සංවිධානය (SCO) |
| **ආවරණය කරන වෙනත් සංවිධාන** | : | බාලි ප්‍රජාතන්ත්‍රවාදී සංසදය, ෂැංග්‍රිලා සංවාදය |

**<u>නැගෙනහිර ආසියා සහ පැසිෆික් අංශයේ ප්‍රධාන කාර්යය ක්ෂේත්‍ර පහත සඳහන් ආකාරයට පුළුල්ව වර්ගීකරණය කළ හැක.</u>**

- ජනාධිපතිතුමාගේ, අග්‍රාමාත්‍යවරයාගේ, විදේශ කටයුතු අමාත්‍යවරයාගේ, වෙනත් කැබිනට් අමාත්‍යවරුන්ගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ද්විපාර්ශ්වික සංචාර පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- විදේශීය සම්භාවනීය පුද්ගලයන් ශ්‍රී ලංකාවේ සිදු කරන සංචාර සඳහා කටයුතු සූදානම් කිරීම.

- දේශපාලනික, අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික ප්‍රවණතා පිළිබඳ අනුගාමී සහ සම්බන්ධීකරණ කටයුතු.

- ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව සහ කලාපයේ පවතින ව්‍යවස්ථාදායක ආයතන අතර කාර්යය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- දේශපාලනික, විද්‍යාත්මක, තාක්ෂණික, අධ්‍යාපනික සහ සංස්කෘතික ක්ෂේත්‍ර පිළිබඳව ද්විපාර්ශ්වික ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් කිරීම පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- සමළු හා වෙනත් අදාල රැස්වීම් සඳහා සැපයුම් සංවිධානය හා සම්බන්ධ ගැටලු සහ වැදගත් වන වෙනත් ගැටලු පිළිබඳව කටයුතු කිරීම ඇතුළුව ආසියාන් කලාපීය සංසදය(ARF), ෂැංහයි සහයෝගිතා සංවිධානය (SCO) සහ බාලි ක්‍රියාදාමය සම්බන්ධයෙන් වන කාර්යය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- ෂැංග්‍රිලා සංවාදය සහ බාලි සංසදය සඳහා වැදගත් සහ සැපයුම් සංවිධානය පිළිබඳ ගැටලු සහ වෙනත් වැදගත් ගැටලු සම්බන්ධයෙන් කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- ශිෂ්‍යත්ව වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

- විදේශ රටවල දූත මණ්ඩලවලින් ලැබෙන මාසික තොරතුරු වාර්තා පිළිබඳව දත්ත සැකසීම.

- කලාපයට අදාළ සංචාර සහ සමුළු සඳහා ලුහුඬු සටහන් සකස් කිරීම.

- මෙම කලාපයේ විෂය පථය යටතේ ආවරණය කෙරෙන රටවල් වලින් නිකුත් කෙරෙන එක් එක් රටවල සංචාරය කිරීම පිළිබඳ උපදේශන මාලා (Travel Advisory) අධීක්ෂණය කිරීම.

- කලාපය තුළ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට උපදෙස් දීම, අවශ්‍ය මාර්ගෝපදේශ/ තොරතුරු ලබා දීම.

**මහජන චීන ජනරජය**

චීනය වෙත සිදු කරන ශ්‍රී ලංකාවේ අපනයන, 2011 වසරේදී ඇ.ඩො.මිලියන 153 දක්වා සුවිශාල ලෙස වර්ධනය වී තිබේ. මෙය වසර 2010 දී ඇ.ඩො.මිලියන 102 ක් වූ සමස්ත අපනයන වටිනාකමෙහි 50 % ක වර්ධනයකි.

ටියැන්ජින් වෛද්‍ය විද්‍යාලය විසින් පවත්වන ලද ගුරු පුහුණු වැඩ සටහනක විශේෂ අමුත්තා ලෙස සහභාගී වීම සඳහා ජනාධිපති ආර්යාව බෙයිජිං හි සහ ටියැන්ජින් හි සංචාරයක නිරත විය.

අතිගරු වූ බන්ග්ගුඕ මහතාගේ ආරාධනයක් මත, ගරු කථානායකවරයා චීනයේ සංචාරයක නිරත වූ අතර, අතිගරු වූ බන්ග්ගුඕ මහතා ද 2012 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම රැස්වීම අවසානයේදී, වීසා බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම, සාමුදීය සංවර්ධනයේ සිට තාක්ෂණික සහයෝගිතාවය දක්වා පුළුල් පරාසයක පැතිර පවතින විෂය ගණනාවක් සම්බන්ධයෙන් ගිවිසුම් 16 කට අත්සන් තැබිණ.

නිදහස ලැබීමේ 64 වැනි සංවත්සරය සහ ශ්‍රී ලංකාව සහ චීනය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 55 වැනි සංවත්සරය සමරනු වස් සංවිධානය කෙරුණු උත්සවයේ විශේෂ අමුත්තා ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ගෝඨාභය රාජපක්ෂ මහතා සහභාගී විය.

චීනයේ ආරක්ෂක අමාත්‍යවරයෙකු විසින් මෙරට සිදු කරන ලද ප්‍රථම සංචාරය, මෙම වසරේ අගෝස්තු මාසයේදී සිදු කෙරිණ. මෙම සංචාරය අතරතුරදී, දියතලාවේ පිහිටි ශ්‍රී ලංකා හමුදා අධ්‍යයන ආයතනය සඳහා ශ්‍රවණාගාරයක් ලබා දීම පිළිබඳ ගිවිසුමකට අත්සන් තැබිණ.

චීන සංවර්ධන බැංකුව විසින් සංවිධානය කරන ලද ආයෝජන සංසදයට සහභාගී වීම සඳහා, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පී.බී.ජයසුන්දර මහතා චීනයේ සංචාරයක නිරත වූ අතර, එහිදී චීනයේ එක්සිම් බැංකුව (EXIM Bank) සමඟ එළඹීමට නියමිත ව්‍යාපෘතිවලට අරමුදල් සැපයීමේ ගිවිසුම් පිළිබඳ කටයුතු නිම කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කළේය.

2012 ඔක්තෝබර් මසදී ඉදිකිරීම් කටයුතු ආරම්භ වූ නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ සැලැස්ම පිළිබඳ කටයුතු නිම කිරීම සඳහා විදුලි සන්දේශ අමාත්‍යාංශයේ ලේකම්වරයා චීනයේ සංචාරයක නිරත විය.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා, දෙරටේ විදේශ කටයුතු අමාත්‍යාංශ අතර 8 වැනි ද්විපාර්ශ්වික දේශපාලනික උපදේශන සඳහා සහභාගී වීම සඳහා බෙයිජිං හි සංචාරයක නිරත විය.

වෙළඳ සහ ආර්ථික සහයෝගීතාවය පිළිබඳ චීන - ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටුවේ 5 වැනි සැසිවාරය, මෙම වසර අවසාන වීමට පෙර පැවැත්වීම සඳහා දින වකවානු තීරණය කෙරෙමින් පවතී.

චීනයේ සංස්කෘතික අමාත්‍යවරයාගේ ආරාධනය මත, පැංහයි සහයෝගිතා සංවිධානයේ සංස්කෘතික අමාත්‍යවරුන්ගේ 9 වැනි රැස්වීමට සහභාගී වීම සඳහා, සංස්කෘතික සහ කලා කටයුතු අමාත්‍ය ගරු ටී.බී.ඒකනායක මහතා 2012 ජූනි මස බෙයිජිං හි සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුරදී, ශ්‍රී ලංකාවේ චීන සංස්කෘතික මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබිණ.

ප්‍රවාහන අමාත්‍ය ගරු කුමාර වෙල්ගම මහතා සහ විද්‍යා කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ගරු තිස්ස විතාරණ මහතා යන අමාත්‍යවරුන් චීනයේ සිදු කළ ඉහළ පෙළේ සංචාර සඳහා පහසුකම් සැලසීය.

ශ්‍රී ලංකා සංචාර ප්‍රවර්ධන වැඩසටහනක් හැන්ග්ෂු සහ චෙන්ග්ඩු හි දී සංවිධානය කරන ලද අතර, "චයිනා ඉන්ටර්නැෂනල් ට්‍රැවල්මාට්" හි දී තානාපති කාර්යාලයට හොඳම සංවිධායක සම්මානය පිරිනැමිණ.

ශිෂ්‍ය ශිෂ්‍යාවන් සම්බන්ධ කරුණුවලදී තානාපති කාර්යාලය ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහාය ලබා දුන්නේය.

**චෙන්ග්ඩු**

ශ්‍රී ලංකාව සහ චීනයේ සිචුවාන් සහ යුන්නන් ප්‍රාන්ත අතර සමීප දේශපාලනික, ආර්ථික සහ සංස්කෘතික සබඳතා සඳහා ඉඩප්‍රස්ථා ඇති කරමින්, ගරු කථානායකවරයාගේ නායකත්වයෙන් යුත් පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක් චෙන්ග්ඩු හි සංචාරයක නිරත විය.

චීන ජාතික මහජන කොන්ග්‍රසයේ ස්ථාවර කමිටුවේ කථානායකවරයා විසින් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද සංචාරය අතරතුර, වේයන්ගොඩ සිට කළුතර දක්වා විදුලි දුම්රිය පද්ධතියක් ස්ථාපනය කිරීම පිළිබඳ ව්‍යාපෘතියක ආයෝජනය කිරීම සඳහා "ඩොන්ග්ෆැන් ඉලෙක්ට්‍රික් කෝපරේෂන්" සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී.

**ෂැංහයි**

පෙජ්යැං ප්‍රාන්තය සහ ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත් සභාව අතර සහෝදර නගර සහයෝගිතාවයක් ස්ථාපනය කිරීම සඳහා මූලික සාකච්ඡා දැනට සිදු කෙරෙමින් පවතී.

හැන්ග්ෂූ සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර අතර සහෝදර නගර සහයෝගිතාවයක් ඇති කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබිණ.

හැන්ග්ෂූ ජාත්‍යන්තර සහෝදර නගර නගරාධිපතිවරුන්ගේ සම්මේලනයට සහභාගී වීම සඳහා, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරාධිපති ගරු ආර්.ඒ.ඩී. රණවක මහතා විසින් සිදු කළ ඉහළ පෙළේ සංචාරය සඳහා පහසුකම් සලසන ලදී. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරාධිපතිවරයාගේ චීන සංචාරයට ප්‍රතිචාර වශයෙන් සහ සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගිතාවය වර්ධනය කිරීම උදෙසා, හැන්ග්ෂූ හි උප නගරාධිපතිවරයා 2012 ඔක්තෝබර් මස ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

පෙජ්යැං ප්‍රාන්තයේ, තායිෂූ හි ගුඕ ක්විං ආරාමයට අතිගරු ජනාධිපතිතුමා විසින් බෞද්ධ ප්‍රතිමාවක් පරිත්‍යාග කරන ලදී.

ශ්‍රී ලාංකක ආභරණ මැණික්, ආහාර, තේ සහ රූපාලංකාර ද්‍රව්‍ය ෂැංග්හයි හි දී ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රදර්ශන කිහිපයක්ද සංවිධානය කෙරිණි.

**ගුවැන්ෂූ**

දකුණු චීනයේ සිදුවෙමින් පවතින සීඝ්‍ර ආර්ථික සංවර්ධනය සැලකිල්ලට ගනිමින් සහ වෙළඳ, ආයෝජන සහ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණෙන්, කොන්සල් ජනරාල් කාර්යාලයේ කාර්යය කටයුතු 2012 ජනවාරි මසදී ආරම්භ විය. කැන්ටන් වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය ඇතුළුව සංචාරක ප්‍රවර්ධනය සහ ඒ සඳහා පහසුකම් සැලසීම කොන්සල් කාර්යාලය විසින් සිදු කරයි.

**ඕස්ට්‍රේලියාව**

ඕස්ට්‍රේලියානු ආගමන කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු ක්‍රිස් බොවෙන් මහතා 2012 මැයි මස ශ්‍රී ලංකාවේ සිදු කළ සංචාරය, ෆෙඩරල් පාර්ලිමේන්තු මන්ත්‍රී හා ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා මිත්‍රත්ව කණ්ඩායමේ උප සභාපති ගරු ඩොන් රැන්ඩෝල් මහතා 2012 සැප්තැම්බර් මස ශ්‍රී ලංකාවේ සිදු කළ සංචාරය වැනි ඉහළ පෙළේ සංචාර කිහිපයක් හේතුවෙන්, ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් විය.

වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ මානව හිමිකම් පිළිබඳ විශේෂ නියෝජිත ගරු මහින්ද සමරසිංහ මහතා 2012 මැයි මාසයේද, රාජ්‍ය පරිපාලන අමාත්‍ය ගරු ජෝන් සෙනෙවිරත්න මහතා 2012 අප්‍රේල් මාසයේද, විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මහතා 2012 මැයි මාසයේද ඕස්ට්‍රේලියාවේ සංචාරවල නිරත වූහ.

ශ්‍රී ලංකා රජය පමණක් පිළිගන්නා බව ඕස්ට්‍රේලියාව විසින් ප්‍රසිද්ධියේ නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද අතර, ශ්‍රී ලංකාවට එරෙහිව කටයුතු කිරීමට විවිධාකාර ප්‍රවේශයන් අනුගමනය කළද, ශ්‍රී ලංකා දේශයෙන් පිටත පිහිටි දෙමළ ඊළාම් ආණ්ඩුව (TGTE) සමඟ කටයුතු කිරීම ඕස්ට්‍රේලියාව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

වර්ධනය වෙමින් පවතින නීති විරෝධී සංක්‍රමණ පිළිබඳ ගැටලුව මැඩලීමේ අරමුණෙන්, නීති විරෝධී ලෙස මිනිසුන් ප්‍රවාහනය කිරීම සහ දේශ සීමා ආරක්ෂාව පිළිබඳව පවතින ගැටලු සම්බන්ධයෙන් පිහිටුවීමට යෝජිත ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ ප්‍රථම රැස්වීම කැඳවීම සඳහා දෙපාර්ශ්වය සාකච්ඡා පවත්වමින් සිටිති.

ඕස්ට්‍රේලියාව විසින් ලබාදෙන ද්විපාර්ශ්වික ආධාර ප්‍රමාණය තවදුරටත් ඉහළ දමමින්, ඕස්ට්‍රේලියාව විසින් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 43.6 ක ආධාර ලබා දී ඇත. ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලයාව අතර ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුමකට 2012 මැයි මස දී අත්සන් තැබිණ.

දෙරට අතර පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නිව් සවුත් වේල්ස් හි ගරු මහ ඇමතිවරයා සහ නිව් සවුත් වේල්ස් හි අතිගරු ආණ්ඩුකාරවරයා සමඟ රැස්වීම් සංවිධානය කරන ලද අතර, දෙරට අතර බහුපාර්ශ්වීය සහයෝගිතාවය වර්ධනය කිරීම සඳහා, සංස්කෘතික ක්‍රියාකාරකම්, වෙළඳ හා සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරන ලදී. ඕස්ට්‍රේලියානු විදේශ අමාත්‍ය සෙනට් සභික ගරු බොබ් කාර් මහතා, ප්‍රථම ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

**ජපානය**

ශ්‍රී ලංකාව සහ ජපානය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ආරම්භ කිරීමේ 60 වන සංවත්සරය 2012 වසරේදී සමරන ලදී. මෙම අවස්ථාව නිමිත්තෙන්, ජපානයේ මුදල් අමාත්‍යාංශය විසින් සමරු කාසියක් නිකුත් කරන ලදී. මෙම අවස්ථාව සමරනු වස් අතිගරු ජනාධිපතිතුමා 2012 දෙසැම්බර් 11 සිට 15 දක්වා දිනවලදී ජපානයේ සංචාරයක නිරත විය.

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා, විදේශ කටයුතු අමාත්‍ය ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා, වැවිලි කර්මාන්ත අමාත්‍ය හා මානව හිමිකම් පිළිබඳ විශේෂ නියෝජිත ගරු මහින්ද සමරසිංහ මහතා, රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු නවීන් දිසානායක මහතා, ගරු නාමල් රාජපක්ෂ මහතා, ගරු ප්‍රියංකර ජයරත්න මහතා ජපානයේ සංචාරවල නිරත වූහ.

මේ අතරතුර, ජපානයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය ගරු කත්සුයා ඔකදා මහතා සහ සාමය ගොඩනැගීම පිළිබඳ ජපාන රජයේ විශේෂ නියෝජිත හා තානාපති ගරු යසුෂි අකාෂි මහතා, පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් කරමින්, ශ්‍රී ලංකාවේ සංචාරවල නිරත විය.

සැලකිය යුතු වශයෙන් සංවර්ධන ආධාර ශ්‍රී ලංකාවට ලබා දීමට ජපානය විසන් අඛණ්ඩව කටයුතු කරන ලදී. ලබා දෙන නිල සංවර්ධන සහාය මෙම වසරේදී ඇ.ඩො. මිලියන 525 දක්වා වැඩි කරන ලදී. ශ්‍රී ලංකාව වෙත ලබාදෙන ආධාර අතුරින් වැඩිම ආධාර ප්‍රමාණයක් ලබාදෙන රට ජපානය වේ. මෙම වසරේ ජූලි මස ආරම්භ කරන ලද ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලබා දෙන ලද්දේද ජපානය විසිනි.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව හා සම්බන්ධයෙන් සිදුව ඇති සාධනීය පවණතා පිළිබඳ තානාපති කාර්යාලය, විදේශ කාර්යාලයසහ අදාළ බලධාරීන් දැනුවත් කළේය. 2012 නොවැම්බර් මස ජිනීවා හි දී පැවති විශ්වවාර සමාලෝචන සැසියේදී ජපානය විසින් ශ්‍රී ලංකාවට යහපත් වන ප්‍රකාශයක් සිදු කරන ලදී.

ගරු අමාත්‍ය සරත් අමුණුගම මහතාගේ, මහ බැංකු අධිපතිවරයාගේ සහ මහ බැංකුවේ හා මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සංචාර සඳහා පහසුකම් සලසන ලදී.

2012 ඔක්තෝබර් මස ටෝකියෝ හි දී පැවති ශ්‍රී ලාංකික ආයෝජන දිනයේදී ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් බැඳුම්කර ජපාන යෙන් මිලියන 600ක වටිනාකමකට ද්විතික වෙළඳ පොළෙන් මිලට ගන්නා බව ජපාන ආයෝජකයන් විසින් තහවුරු කරන ලදී.

ලැයිස්තු ගත ශ්‍රී ලාංකක සමාගම්, ටෝකියෝ කොටස් වෙළඳ පොළ තුළ ලැයිස්තු ගත කිරීම සඳහා ආකර්ශනය කර ගැනීමට ටෝකියෝ කොටස් වෙළඳ පොළ කැමැත්ත පළ කර සිටියේය.

දෙරට අතර වෙළඳ හා ආර්ථික පාර්ශ්වකාරිත්වය පිළිබඳ තවත් ගිවිසුම්වලට එළඹීමට පහසුකම් සැලසීම සඳහා සහ ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් නව තවත් රැකියා ඉඩප්‍රස්ථා නිර්මාණය කර දීම සඳහා දූත මණ්ඩලය, ජපානයේ ආර්ථික වෙළඳ හා කර්මාන්ත අමාත්‍යාංශය (METI)සමඟ සාකච්ඡා පවත්වමින් සිටී. ජපාන විදේශ වෙළඳ සංවිධානයේ ආයෝජක නියෝජිත පිරිස ශ්‍රී ලංකාවේ සිදු කළ සංචාරය සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී.

ශ්‍රී ලංකා - ජපාන ව්‍යාපාරික සහයෝගිතා කමිටුවේ 17 වැනි ඒකාබද්ධ රැස්වීම 2012 දෙසැම්බර් 5 - 7 දිනවලදී කොළඹ දී පැවැත්විණ.

ශ්‍රී ලංකාවේ වෙළඳ හා සංචාරක කටයුතු ජපානයේදී ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් සංවිධානය කරන ලදී.

**කොරියානු ජනරජය**

දෙරට අතර සිදුවූ ඉහළ පෙළේ සංචාර කිහිපයක් සමඟම, කොරියානු ජනරජය සමඟ පවතින සබඳතා 2012 වර්ෂයේදී අඛණ්ඩව වර්ධනය විය. අතිගරු ජනාධිපතිතුමා අප්‍රේල් මාසයේදී කොරියානු ජනරජයේ රාජ්‍ය සංචාරයක නිරත වූ අතර, එහිදී කොරියානු ජනරජයේ ජනාධිපති අතිගරු ලී මියුන්-බක් සමඟ ඵලදායි සාකච්ඡා පැවැත්විය. තොරතුරු තාක්ෂණය, ආර්ථික සංවර්ධනය සහ විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ තාක්ෂණික සහයෝගීතාවය යන ක්ෂේත්‍ර තුන සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික ගිවිසුම් තුනකට ද මෙහිදී අත්සන් තැබිණ.

ගරු චමල් රාජපක්ෂ මහතාගේ ආරාධනය මත, කොරියානු ජනරජයේ ජාතික සභාවේ (පාර්ලිමේන්තුව) කථානායක ගරු පාර්ක් හි ටී මහතාගේ නායකත්වයෙන් යුත් කොරියානු පාර්ලිමේන්තුවේ නියෝජිත කණ්ඩායමක්, 2012 ජනවාරි මස ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය.

ධීවර අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මහතා 2012 අගෝස්තු මාසයේ කොරියානු ජනරජයේ සිදු කරන ලද සංචාරය අතරතුරදී, ශ්‍රී ලංකාව තුළ ටින් කළ මාලු කර්මාන්ත ශාලාවක් ස්ථාපනය කිරීමේ හැකියාව සොයා බැලීම සඳහා මෙන්ම කොරියාව වෙත මුහුදු ආහාර අපනයනය කිරීම සඳහා වෙළඳපළක් නිර්මාණය කිරීම සඳහා ද කටයුතු කරන ලදී.

කොරියාව විසින් ශ්‍රී ලංකාව වෙත ද්විපාර්ශ්වික සහාය ලබා දෙනු ලබන ප්‍රධාන මූලාශ්‍රයක් වන එක්සිම් බැංකුවේ අරමුදල් යටතේ එන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා, එක්සිම් බැංකුව, කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය (KOICA) සහ ශ්‍රී ලංකාවේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සබඳතා පවත්වා ගෙන යාම, අංශය විසින් සිදු කරන ලදී.

සිවිල් ගුවන් සේවා පිළිබඳ ගරු අමාත්‍යවරයා, මූල්‍ය සහයෝගිතාවය පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ගරු ආචාර්ය සරත් අමුණුගම මහතා සහ ස්වාධීන රූපවාහිනී සේවයේ (ITN) සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් සිදු කරන ලද සංචාර ඇතුළුව ඉහළ පෙළේ සංචාර සඳහා පහසුකම් සලසන ලදී. ලෝක හරිත සංසදයේදී සහ 2012 ලෝක මානව සම්පත් සංසදයේදී තානාපති කාර්යාලය ශ්‍රී ලංකාව නියෝජනය කළේය. පේරාදෙණිය - අනුරාධපුර මාර්ගය අලුත් වැඩියා කිරීම සඳහා කොරියාවේ එක්සිම් බැංකුව සමඟ ඇ.ඩො. මිලියන 11ක අතිරේක ණය ගිවිසුමකට අත්සන් තබන ලදී. ශ්‍රී ලංකාවේ විගමනික ශ්‍රමිකයන් 630ක් කොරියාවට පැමිණීම සඳහා තානාපති කාර්යාලය විසින් සහාය ලබා දෙන ලදී. සෘජු ගුවන් සේවා ආරම්භ කිරීම සඳහා "කොරියන් එයාර්" (Korean Air) නියෝජිතයන් සමඟ සාකච්ඡා පැවැත්විණ. කොරියානු ජනරජයේ ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රයෝජනය සඳහා "e - people" නම් වෙබ් අඩවිය දියත් කරන ලදී.

**තායිලන්තය**

අතිගරු ජනාධිපතිතුමා 2012 මැයි මස තායිලන්තයේ සංචාරයක නිරත වූ අතර, එමගින් දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් විය. මෙම සංචාරය අතරතුර, දෙරටේ විදේශ අමාත්‍යාංශ අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනය පිළිබඳ ගිවිසුමකට අත්සන් තබන ලද අතර, සාපරාධී කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අන්‍යෝන්‍ය නෛතික සහාය ලබා දීම සම්බන්ධයෙන් තහවුරු කිරීමේ ලේඛන හුවමාරු කරගන්නා ලදී. වාණිජ සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීමෙහිලා ව්‍යාපාරික සහ ආයෝජන සංසදයක් පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ සියම් නිකාය ආරම්භ කිරීමේ 260 වැනි සංවත්සරය යෙදෙන ඓතිහාසික අවස්ථාව සැමරීම සඳහා ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් දෙරට කටයුතු කරමින් සිටියි.

විදේශ අමාත්‍යාංශ දෙක විසින් ප්‍රථම ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන මෙම වසරේ අගෝස්තු මස කොළඹ දී පවත්වන ලදී.

සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ ගරු අමාත්‍යවරයා, අගෝස්තු මස තායිලන්තයේ දී පැවති තායි-ශ්‍රී ලංකා සංස්කෘතික උළෙලට විශේෂ අමුත්තෙකු ලෙස සහභාගී විය. ශ්‍රී දළදා මාළිගාවේ රන් වියන අලුත්වැඩියා කිරීමේ කටයුතු ද තායිලන්තය විසින් බාර ගෙන ඇත.

විදේශ කටයුතු ලේකම්වරයාගේ නායකත්වයෙන් යුතු නියෝජිත කණ්ඩායමක්, 2012 දෙසැම්බර් 14වන දින බැංකොක් හිදී පැවති, සියම් නිකාය ආරම්භ කිරීමේ 260 වැනි සංවත්සර සැමරුම පිළිබඳ රැස්වීමට සහභාගී විය.

තායිලන්තයේ අයුත්තයා නගරය සහ ශ්‍රී ලංකාවේ මහනුවර නගරය පූජනීය සහෝදර නගර ලෙස ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ කෙටුම්පත් ගිවිසුමක්ද දෙරට අතර හුවමාරු කර ගන්නා ලදී. තායිලන්ත ආයෝජකයන් කණ්ඩායමක් 2012 නොවැම්බර් 27 - දෙසැම්බර් 01 යන දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. දෙරට අතර වාණිජ සහ ව්‍යාපාරික සහයෝගිතාවයට පහසුකම් සැලසීම සඳහා සංචාරක ප්‍රවර්ධන සහ වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක්ද තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.

**වියට්නාමය**

ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර සබඳතා 2012 වර්ෂයේදී තවදුරටත් වැඩි දියුණු විය. දෙරට අතර ඒකාබද්ධ කොමිෂන් සභාවේ 3 වැනි සැසිවාරය ජූලි මස හැනොයි හි දී පවත්වන ලදී. ඒකාබද්ධ කොමිෂන් සභා සැසිවාරයේදී, ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුමට ද අත්සන් තබන ලදී. ඒකාබද්ධ කොමිෂන් සභා සැසිවාරය නියෝජනය කළ නියෝජිත කණ්ඩායමේ නායකත්වය ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් දරන ලද අතර, පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් කරමින්, වියට්නාමයේ අතිගරු අග්‍රාමාත්‍යවරයා ගරු අධිකරණ අමාත්‍යවරයා සහ ගරු විදේශ අමාත්‍යවරයා සමඟ ශ්‍රී ලංකාවේ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සාකච්ඡා පැවැත්විය.

ඒකාබද්ධ කොමිෂන් සභාවේ 3 වන සැසිවාරයට පෙරාතුව, මැයි මස කොළඹ දී දෙරටේ විදේශ අමාත්‍යාංශ අතර ද්විපාර්ශ්වික දේශපාලනික උපදේශන පවත්වන ලදී.

කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද යාපා අබේගුණවර්ධන මහතා,සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය ගරු ටී.බී.ඒකනායක මහතා සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු දොස්තර රාජිත සේනාරත්න මහතා වියට්නාමයේ සංචාරවල යෙදුණු අතර, වියට්නාම අධිකරණ අමාත්‍ය ගරු හා හුන්ග් කුවොං මහතා ඇතුළු හය දෙනෙකුගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජලජීවී වගා සංවර්ධනය සඳහා වියට්නාම රජය ඇ.ඩො.100,000 ක මුදල් ප්‍රමාණයක් වෙන් කර ඇත.

සාපරාධී කටයුතු වැළැක්වීම සහ මර්දනය කිරීම පිළිබඳ ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා, ශ්‍රී ලංකා යුද හමුදාවේ මාණ්ඩලික ප්‍රධානීවරයාගේ නායකත්වයෙන් යුත් ත්‍රිපුද්ගල ආරක්ෂක නියෝජිත කණ්ඩායමක්, වියට්නාමයේ මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සහයෝගිතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හමුවිය.

රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා 2012 නොවැම්බර් මස වියට්නාමයේ සංචාරය කළ අතර, එහිදී වියට්නාම මහජන හමුදාවේ නියෝජ්‍ය සාමාන්‍ය මාණ්ඩලික ප්‍රධානී හමුවී සාකච්ඡා කළේය.

බෞද්ධ නියෝජන කණ්ඩායමක් 2012 නොවැම්බර් මස පැවති 7 වැනි ජාතික බෞද්ධ කොන්ග්‍රසයට සහභාගී වූ අතර, ඉන් අනතුරුව ආගමික උත්සවයකට සහභාගී වීම සඳහා හෝ චි මිං නගරයේ සංචාරයක නිරත විය.

ශ්‍රී ලාංකික ආහාර, ලංකා තේ සහ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා 2012 නොවැම්බර් 25 වැනි දින "ඇනුවල් චැරිටි බසාර්" (Annual Charity Bazaar) වෙළඳ සල්පිල පවත්වන ලදී.

**පිලිපීනය**

2012 ජනවාරි 26 වැනි දින, පිලිපීන රජයේ ගංවතුර ආධාර අරමුදල වෙත ඇ.ඩො.50,000 ක සංකේතාත්මක පරිත්‍යාගයක් සිදු කිරීමත් සමඟ 2012 වසරේ වැඩ කටයුතු ආරම්භ වූ අතර, එම පරිත්‍යාගය අපගේ ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට හේතු විය.

ගරු විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා 2011 සැප්තැම්බර් මස පිලිපීනයේ සිදු කළ සංචාරය අතරතුරදී කරන ලද ආරාධනයකට අනුව, ප්‍රතිපත්ති පිළිබඳ උපලේකම් ගරු අර්ලින්ඩා එෆ්. බැසිලියො මහත්මියගේ නායකත්වයෙන් යුත් ත්‍රිපුද්ගල නියෝජිත කණ්ඩායමක් මෙම වසරේ මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු නියෝමාල් පෙරේරා මහතා සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මහතා මෙම පිලිපීන නියෝජිත කණ්ඩායම සමඟ සාකච්ඡා පැවැත්වූහ.

ආසියා හා ශාන්තිකර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය, ආචාර්ය බර්නාඩෝ විලෙගාස් මහතාගේ නායකත්වයෙන් යුත් ව්‍යාපාරික දූත පිරිසක් 2012 මැයි 24-28 දිනවලදී කොළඹ සංචාරයක නිරත වූ අතර, ආයෝජන මණ්ඩලයේ සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ අදාළ නිලධාරීන් සමඟ සාර්ථක සාකච්ඡා පැවැත්විය.

2012 අප්‍රේල් 27 වන දින නිව්යෝර්ක් හි පැවති ඡන්ද විමසීමේදී, ජාත්‍යන්තර අධිකරණය සඳහා පිලිපීනයේ අපේක්ෂකත්වයට ශ්‍රී ලංකාව සහාය ලබා දෙන ලදී.

"බෝපා"සුළි කුණාටුවෙන් විපතට පත් දවාවො ප්‍රාන්තයේ යළි ගොඩනැගීමේ කටයුතු සඳහා ශ්‍රී ලංකාව ඇ.ඩො. 25000ක් පරිත්‍යාග කරන ලදී. මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා, පිලිපීනයේ විදේශ ලේකම්වරයාට මෙරට සංචාරයක යෙදෙන ලෙස ආරාධනා කර සිටියේය. 2012 නොවැම්බර් 22 - 25 දිනවලදී ජිනීවා හිදී පැවති විශ්වවාර සමාලෝචනයේ 14 වන සැසිවාරයේදී පිලිපීනය විසින් ශ්‍රී ලංකාවට සහාය ලබා දෙන ලදී. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි ගුරුවරුන් සඳහා පුහුණුව ලබා දීමට පිලිපීනය එකඟ වූ අතර, ඒ පිළිබඳ සාකච්ඡා මේ වන විට සිදු කෙරෙමින් පවතී. විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ ලේකම් නිශ්ශංක විජේරත්න මහතා, සංක්‍රමණය පිළිබඳ ගෝලීය සංසදයට සහ සංවර්ධන වැඩමුළුවට සහභාගී විය.

**මැලේසියාව**

ආර්ථික, දේශපාලනික, සමාජයීය හා සංස්කෘතික සබඳතා ආදී ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරමින්, මැලේසියාව සමඟ සබඳතා පසුගිය වසර කිහිපය තුළ වැඩි වර්ධනය වී තිබේ. යෞවන කටයුතු හා නිපුණතා පිළිබඳ අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මහතා මාර්තු මස සිදුකළ සංචාරය අතරතුරදී, ශ්‍රී ලාංකීය නිපුණ ශ්‍රමිකයන් පුහුණු කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. මූල්‍ය ස්ථාවරත්ව මණ්ඩලයේ ආසියානු කලාපීය කණ්ඩායමේ රැස්වීම්වලට සහ භාගී වීම සඳහා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා මැයි මස මැලේසියාවේ සංචාරයක නිරත විය.

ආයෝජනය සම්බන්ධයෙන්, විශේෂයෙන්ම නැවෙන් නැවට බඩු මාරු කිරීම, නැව් මගින් භාණ්ඩ ප්‍රවාහන සේවා සහ ඉන්ධන පිරවීමේ සේවා ඇතුළු වරාය ක්ෂේත්‍රයේ ආයෝජනය සම්බන්ධයෙන් පවතින ඉඩ ප්‍රස්ථා සොයා බැලීම සඳහා, වසර 20 කට පසු, මැලේසියාවේ ජාතික වාණිජ සහ කර්මාන්ත මණ්ඩලයේ ඉහළ පෙළේ නියෝජිත කණ්ඩායම් දෙකක් ජූලි මස ශ්‍රී ලංකාවේ සංචාරය කළේය.

දෙරට අතර අත්සන් තබන ලද කම්කරු සබඳතා පිළිබඳ අවබෝධතා ගිවිසුම මත පදනම්ව, විගමනික ශ්‍රමිකයන්ගේ සේවා තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා වැඩසටහනක් ආරම්භ කරන ලදී.

යුද්ධයෙන් පසු රජය විසින් දියත් කර තිබෙන වැඩපිළිවෙලට සහාය ලබා ගැනීම සඳහා සහ විශ්වවාර සමාලෝචන සැසියේදී ශ්‍රී ලංකාව වෙත සහාය ලබා දෙන ලෙස ඉල්ලා සිටීම සඳහා දූත මණ්ඩලය විසින් ද්විපාර්ශ්වික දේශපාලනික සබඳතා ශක්තිමත් කිරීම පිළිබඳව මැලේසියානු ආයතන සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. දෙරට අතර සබඳතා වර්ධනය කර ගැනීම සඳහා පවතින තත්ත්ව වැඩි දියුණු කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන මැලේසියාවේ ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳ සල්පිලකට හා ප්‍රදර්ශනයකට කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සහයෝගීතාවයෙන් යුතුව සහභාගී වන ලදී.

**ඉන්දුනීසියාව**

ද්විපාර්ශ්වික සබඳතාවල සුවිශේෂී වර්ධනයක් සනිටුහන් කරමින්, දෙරට අතර ප්‍රථම ඒකාබද්ධ කොමිෂන් සභාව ජනවාරි මාසයේදී පවත්වන ලදී. විදේශ කටයුතු අමාත්‍ය අතිගරු ආචාර්ය මාර්ටි නතාලෙගාවා මහතා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ඒකාබද්ධ කොමිෂන් සභාවට සහභාගී වීම සඳහා මෙරටට පැමිණියහ. සහයෝගිතාවයෙන් යුතුව තවදුරටත් කටයුතු කිරීම සඳහා සහයෝගිතාව ඇති කර හැකි බහුවිධ ක්ෂේත්‍ර පිළිබඳ එහිදී සොයා බැලුණු අතර ඒවා පිළිබඳ එකඟතාවයකට පැමිණෙන ලදී. ඒකාබද්ධ කොමිෂන් සභා රැස්වීම අතරතුර, රාජ්‍යතාන්ත්‍රික අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ සහ සංස්කෘතික සහයෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම් දෙකකට අත්සන් තැබිණි. මීට අමතරව, දෙරට අතර සම්බන්ධකතාවය වැඩි දියුණු කරමින්, ද්විපාර්ශ්වික ගුවන් සේවා සහයෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුමකට 2012 මැයි මස දී අත්සන් තැබිණ.

අගෝස්තු මස පැවති නොබැඳි ජාතීන්ගේ සමුළුවට සමගාමීව, විදේශ කටයුතු අමාත්‍ය ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා සහ ඉන්දුනීසියාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා අතර එළදායි සාකච්ඡාවක් පැවැත්විණ. ගරු රාවුෆ් හකීම්, ගරු දොස්තර රාජිත සේනාරත්න, ගරු සාලින්ද දිසානායක, ගරු මහින්ද අමරවීර, ගරු රිෂාඩ් බතියුදින් යන අමාත්‍යවරු ඉන්දුනීසියාවේ ද්විපාර්ශ්වික සංචාරවල නිරත විය.

ගරු මහින්ද අමරවීර මහතා, අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති ජනක රත්නායක මහතා, විදේශ කටයුතු අමාත්‍ය ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා සහ ගරු පාඨලී චම්පික රණවක මහතා වියට්නාමයේ සඳු කළ ඉහළ පෙළේ සංචාරවලට පහසුකම් සලසන ලදී. ශ්‍රී ලංකාවේ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ නියෝජිත කණ්ඩායමක්, 2012 ඔක්තෝබර් මස ඉන්දුනීසියාවේ සංචාරයක නිරත විය.

**සිංගප්පූරුව**

ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර ද්විපාර්ශ්වික සබඳතා 2012 වසරේදී ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ වැඩි දියුණු විය. 2012 පෙබරවාර මස අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සිදුකළ රාජ්‍ය සංචාරයත් සමඟම, දෙරට අතර පවතින මිත්‍රශීලී සබඳතා තවදුරටත් පුළුල් විය. මෙම සංචාරය අතරතුර, අතිගරු ජනාධිපතිතුමා, සිංගප්පූරු ජනාධිපති අතිගරු ටෝනි ටැන් මහතා, අග්‍රාමාත්‍ය අතිගරු ලී හ්සියෙන් ලූන්ග් මහතා සහ ආරක්ෂක අමාත්‍ය අතිගරු න්ග් එන්ග් හෙන් මහතා සමඟ සාකච්ඡා පැවැත්වූ අතර, දෙරට අතර ව්‍යාපාරික සහ ආයෝජන සබඳතා වර්ධනය කිරීම පිළිබඳව අවබෝධතා ගිවිසුමකට ද අත්සන් තැබීය. දකුණු ආසියානු අධ්‍යයන ආයතනය (ISAS) සහ ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපායික අධ්‍යයනය පිළිබඳ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය (LKIIRSS) අතර අවබෝධතා ගිවිසුමකටද එළඹෙන ලදී.

සිංගප්පූරුවේ විදේශ අමාත්‍ය සහ නීති පිළිබඳ අමාත්‍ය ගරු කේ.ශන්මුගම් මහතා, සිංගප්පූරු ව්‍යාපාරික බලමණ්ඩලයේ ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක්ද කැටුව, ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

ගරු විදෙශ කටයුතු අමාත්‍යවරයාගේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුතු ඉහළ පෙළේ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායමක් 2012 ජනි මස පැවති ෂැංග්‍රිලා සංවාදයට සහභාගී විය.

වෙළඳ හා ආයෝජන ක්ෂේත්‍රවල ද්විපාර්ශ්වික සහයෝගිතාවය වැඩිදියුණු කරගත හැකි ආකාර හා ක්‍රමවිධි හඳුනා ගැනීම සඳහා සිංගප්පූරුවසහ ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ අධ්‍යයන කණ්ඩායමක් ස්ථාපනය කිරීම සඳහා මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී.

වෙළඳ සබඳතා තවදුරටත් ශක්තිමත් කරමින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ සිංගප්පූරු ව්‍යාපාරික බලමණ්ඩලය අතර ආයෝජන සහයෝගිතා ගිවිසුමකට 2012 පෙබරවාරි මස අත්සන් තැබිණ.

මහ කොමසාරිස් කාර්යාලයේ සහ ශ්‍රී ලංකා - සිංගප්පූරු ව්‍යාපාරික කවුන්සිලයේ ඒකාබද්ධ වැඩසටහනක් ලෙස, ශ්‍රී ලංකා- සිංගප්පූරු සංසදය 2012 මැයි මස කොළඹ දී පවත්වන ලදි. විදේශ කටයුතු සහ නීතිය පිළිබඳ සිංගප්පරු අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදි.

ගරු නිරෝෂන් පෙරේරා මහතා සහ ගරු වසන්ත සේනානායක මහතා වෙළඳ කටයුතු සහ සාකච්ඡා සඳහා තෙමාසෙක් පදනම් මධ්‍යස්ථානය වෙත (TFCTN - WTO) සංචාරයක යෙදුණ අතර, දූත මණ්ඩලය විසින් මෙම සංචාරය සඳහා පහසුකම් සලසන ලදි.

සංස්කෘතික, සංචාරක හා වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් ද දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලදි.

**මියන්මාරය**

මියන්මාරය සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා, වෙළඳ, ආර්ථික, සංස්කෘතික සහ සංචාරක ක්ෂේත්‍ර සම්බන්ධයෙන් 2012 වසරේදී අඛණ්ඩව වර්ධනය විය.

මියන්මාර රජය විසන්, ගාල්ල, මාලිගස්පේ සුබද්‍රාරාම පුරාණ විහාරාධිකාරි පූජ්‍ය පල්ලත්තර ශ්‍රී සුමනජෝති හිමිපාණන් වහන්සේ වෙත, අග්ග මහා පණ්ඩිත ගෞරව නාමය 2012 මාර්තු මස නේ පි ටෝ හිදී පිරිනමන ලදි.

මියන්මාර නියෝජිත කණ්ඩායමක්, 2012 මාර්තු මස කොළඹ දී පැවති "එක්ස්පො ශ්‍රී ලංකා 2012" පදර්ශනයට සහභාගී විය.

# මැද පෙරදිග අංශය

## මැද පෙරදිග අංශය

**හැඳින්වීම**

මැද පෙරදිග අංශය, මැද පෙරදිග කලාපයේ පිහිටි බහරේන්, ඉරානය, ඉරාකය, ඊශ්‍රායලය, ජෝර්දානය, කුවේට්, ලෙබනන්, ඕමානය, පලස්තීනය, කටාර්, සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිරියාව සහ යේමනය යන රටවල් සමඟ ශ්‍රී ලංකාව පවත්වන දේශපාලනික සබඳතා, මෙම රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ එක්ව සහ සමගාමීව අක්ත ගැන්වීම් හරහා ආවරණය කරයි.

මැදපෙරදිග රටවල් සමඟ ශ්‍රී ලංකාව පවත්වන සබඳතා නිරන්තරයෙන්ම සුහදශීලී හා මිත්‍රශීලී සබඳතා වෙයි.ශතවර්ෂ ගණනාවකට පෙර ආදී ජනතාව හා මෙහි පැමිණි අරාබි වෙළඳුන් අතර ව්‍යාපාරික කටයුතු ප්‍රාණවත්ව හා ලාභදායීව පැවති අවධියේදී දකුණු ආසියානු රටවලට අරාබි ජාතිකයන්ගේ පිවිසුම් මග වූයේ ඉන්දියානු සාගරයයි. 1948 දී යළි නිදහස ලබා ගැනීමෙන් පසුව, මැද පෙරදිග රටවල් සමඟ ශ්‍රී ලංකාව පවත්වන සබඳතා, විශේෂයෙන්, මැදපෙරදිග රටවල පැවති ප්‍රධාන ගැටලුවලදී ප්‍රතිපත්තිමය වශයෙන් ශ්‍රී ලංකාව ක්‍රියාකාරිව ප්‍රතිචාර දැක්වීමත් සමඟම බොහෝ තීව්‍ර වී තිබේ.

**මෙම අංශය සතු ප්‍රධාන කාර්ය කටයුතු :-**

- මැදපෙරදිග කලාපයේ රටවල දේශපාලන ප්‍රවණතා නිරීක්ෂණය කිරීම සහ විස්තරාත්මක වාර්තා, නිරීක්ෂණ සහ ඇගයීම් පිළියෙල කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් විදේශ රටවල නායකයන්, ජනාධිපතිවරුන්, අග්‍රාමාත්‍යවරුන් හා විදේශ කටයුතු අමාත්‍යවරුන් වෙත යවන ආරාධනා, සුභාශිංසන, ශෝක පණිවිඩ හා පණිවුඩ ලැබුණු බව දන්වමින් යවන ලිපි වැනි ජාත්‍යන්තර සුහදතා වවර්ධනය කරන දෑ පිළියෙළ කිරීම.
- රට පිළිබඳ ලුහුඬු වාර්තා පිළියෙළ කිරීම.
- ද්විපාර්ශ්වික රුස්වීම්වලදී අතිගරු ජනාධිපතිතුමා ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ප්‍රයෝජනය තකා රට පිළිබඳ ලුහුඬු වාර්තා කථා කිරීම සඳහා යෝජනා කර ඇති කරුණු පිළියෙල කිරීම.
- අදාල අමාත්‍යාංශ සහ විදේශ රටවල පිහිටි දූත මණ්ඩල සමඟ එක්ව ඉහළ පෙළේ සංචාර, සාකච්ඡා සම්බන්ධීකරණය සහ ගිවිසුම්වලට එළඹීම පිළිබඳ කටයුතු අවසන් කිරීම.
- මැදපෙරදිග රටවල් නියෝජනය කරමින් කොළඹ පිහිටි තානාපති කාර්යාල සහ නිර්වේතනික කොන්සල් කාර්යාල සමඟ ජාලගතව කටයුතු කිරීම.
- මැදපෙරදිග කලාපයේ රටවල රජයන් හා නියෝජිතායතන මගින් ශ්‍රී ලංකාවට පිරිනමන ලද ශිෂ්‍යත්ව සහ අධි ශිෂ්‍යත්ව පිළිබඳ කටයුතු සම්බන්ධීකරණ කිරීම.

**ද්විපාර්ශ්වික සබඳතා**

**බහරේන්**

- අතිගරු ජනාධිපතිතුමාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය යටතේ 2013 පෙබරවාරි මසදී ශ්‍රී ලංකාව බහරේන් හි මැනමා හි අපගේ පළමු නේවාසික තානාපති කාර්යාලය විවෘත කරනු ඇත.

**කුවේට්**

- මානව හිමිකම් කවුන්සිල සැසිවාරය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම සඳහා, අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයකු ලෙස අධිකරණ අමාත්‍ය රාවුෆ් හකීම් මහතා 2012 මාර්තු 13 - 15 දිනවලදී කුවේට් හි සංචාරය කරන ලද අතර, ඉක්රා ඉස්ලාමීය කමිටුවේ 20 වැනි සංවත්සරයට සහභාගී වීම සඳහා 2012 මැයි 31 - ජූනි 05 දිනවලදී නැවත කුවේට් හි සංචාරයක නිරත විය.
- විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍ය ගරු ඩිලාන් පෙරේරා මහතා 2012 මැයි 09 - 12 දිනවලදී කුවේට් හි සංචාරයක නිරත වූ අතර මෙම සංචාරය අතරතුරදී, කම්කරුවන් බඳවා ගැනීම සහ මිනිස් බල සංවර්ධනය ක්ෂේත්‍ර පිළිබඳව දෙරට අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී.
- ආසියානු සහයෝගිතා සංවාදයේ පළමු සමුළුව 2012 ඔක්තෝබර් 13 - 17 දක්වා පවත්වන ලදී. අතිගරු ජනාධිපතිතුමා, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සහ නියෝජිත කණ්ඩායමක් මීට සහභාගී වූහ. මෙම සමුළුවට සමගාමීව ජපානය, තායිලන්තය හා පකිස්තානය සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පවත්වන ලදී.

**ඉරානය**

- කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතා 2012 දෙසැම්බර් 08 - 12 දිනවලදී ඉරානයේ සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුරදී, ඉරානයේ වාණිජ, ඛනිජ තෙල් හා විදේශ කටයුතු අමාත්‍යවරුන් සමඟ සහ මහ බැංකුවේ මුස්තාෆා සෙන් පදනමේ ඉමාම් කොමෙයි හි පදනමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත් විය.
- අධිකරණ අමාත්‍ය ගරු රාවුෆ් හකීම් මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.ටී. හසන් මහතා, 2012 දෙසැම්බර් 22 - 23 දිනවලදී ඉරානයේ සංචාරයක නියැලුණහ. රාවුෆ් හකීම් මහතාගේ මෙම සංචාරය අතරතුරදී, ඉරාන අධිකරණ අමාත්‍යවරයා, අධිකරණ කටයුතු අංශයේ ප්‍රධානියා සහ පාර්ලිමේන්තුවේ කථානායකවරයා ඇතුළු ඉරාන සම්භාවනීය පුද්ගලයන් කිහිප දෙනෙකු සමඟ සාකච්ඡා පැවැත්විය.

**ඉරාකය**

- 2012 පෙබරවාරි 07 වැනි දින අතරතුර තානාපති මට්ටමෙන් ශ්‍රී ලංකා දූත මණ්ඩලය විවෘත කරන ලදී.
- 2012 නොවැම්බර් 01 දින ජිනීවා හි දී පැවති විශ්වවාර සමාලෝචන 14 වැනි සැසිවාරයේදී ශ්‍රී ලංකාවට සහාය ලබා දෙන ලෙස 2012 ඔක්තෝබර් 24 දින පැවති වැඩ බලන දූත මණ්ඩල ප්‍රධානීන්ගේ රැස්වීමේදී ඉරාක රජයෙන් ඉල්ලා සිටින ලදී.

**ජ්‍යශ්‍රායලය**

- වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතාගේ නායකත්වයෙන් යුතු පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක්, 2012 ජනවාරි 29- පෙබරවාරි 01 දිනවලදී ඊශ්‍රායලයේ සංචාරයක නිරත විය. විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු නියෝමාල් පෙරේරා මහතා ද මෙම නියෝජිත කණ්ඩායමට අයත් විය.

**ඕමානය**

- ඕමාන් සුල්තාන් රාජ්‍යයේ තෙල් සහ ගෑස් පිළිබඳ අමාත්‍ය අතිගරු ආචාර්ය මොහොමඩ් බින් හවාඩි අල්-රුම්හි මහතා 2012 ජනවාරි 26-28 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුර, ඒ මහතා ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මහතා හමුවී සාකච්ඡා පැවැත්වීය.

- විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍ය ගරු ඩිලාන් පෙරේරා මහතා 2012 මැයි 17-19 දිනවලදී ඕමානයේ මිනිස් බල අමාත්‍යවරයා සහ ඕමාන වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සභාපතිවරයා සමඟ සාකච්ඡා පැවැත්වීය.

- ඕමාන සුල්තාන් රාජ්‍යයේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර ද්විපාර්ශ්වික උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුමකට 2012 ඔක්තෝබර් හි දී අත්සන් තබන ලදී. මෙම අවබෝධතා ගිවිසුමේ වැදගත් ලක්ෂණ වනුයේ; දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතා වර්ධනය පරීක්ෂා කිරීම සහ දේශපාලන, ආර්ථික සංස්කෘතික, තාක්ෂණික, විද්‍යාත්මක හා අධ්‍යාපන සබඳතා ඇතුළුව පොදුවේ උනන්දුවක් දක්වන කලාපීය හා ජාත්‍යන්තර ගැටළු සම්බන්ධයෙන් අදහස් හා මත හුවමාරු කර ගැනීමයි.

**කටාර්**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරාධනයකට අනුව, කටාර් රාජ්‍යයේ එමීර්වරයා වන අතිගරු ෂෙයික් හමාඩ් බින් ඛලීෆා අල් තානි මහතා 2012 ජනවාරි 15 - 16 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැළිණි. එරට රාජ්‍ය නායකයින් ශ්‍රී ලංකාවේ නියැලුණු ප්‍රථම සංචාරය මෙය විය. කටාර් එමීර්වරයා සමඟ මෙහි පැමිණි ඉහළ පෙළේ නියෝජිත කණ්ඩායම අමාත්‍යවරුන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික නායකයන් කණ්ඩායමකින් සමන්විත විය.

ශ්‍රී ලංකා - කටාර් සබඳතාවල වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කරමින් කටාර් හා ශ්‍රී ලංකාව අතර ඉහළ පෙළේ ඒකාබද්ධ කමිටුවක් ස්ථාපනය කිරීම සඳහා අත්සන් තබන ලද ගිවිසුමට අමතර වශයෙන් ආයෝජන, ආර්ථික සහයෝගීතාවය, සංචාරක කටයුතු, අධ්‍යාපන, කෘෂිකර්මය හා නීති යන ක්ෂේත්‍ර ආවරණය කරමින් දෙරට ද්විපාර්ශ්වික ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් නමය (09) කට අත්සන් තබන ලදී.

**ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් පහත පරිදි වේ.**

- ඉහළ පෙළේ ඒකාබද්ධ කමිටුවක් ස්ථාපනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම.
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ විද්‍යාත්මක පර්යේෂණ යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සහයෝගිතාව සඳහා අවබෝධතා ගිවිසුම.
- ආර්ථික, වාණිජ හා තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ ගිවිසුම.
- සංස්කෘතික ක්ෂේත්‍රයේ සහයෝගිතා ගිවිසුම.
- නීති ක්ෂේත්‍රයේ සහයෝගිතාව සඳහා ගිවිසුම.
- සංචාරක කටයුතු ක්ෂේත්‍රයේ සහ යෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම.
- නිශ්චල දේපළ ආයෝජනය සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම.

කටාර් රාජ්‍යයේ එමීර්වරයාගේ ආර්යාවවන අතිගරු ෂෙයිඩා මොසැහ් බින්ට් නසර් අල් මිස්නෙඩ් මැතිණියගේ ආරාධනයෙන් ශ්‍රී ලංකාවේ ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂ මැතිණිය "අර්බුද, ආරවුල් සහ නොහැකියාව: සමානාත්මතාව තහවුරු කිරීම " මැයෙන් පැවති ජාත්‍යන්තර ෆොල්ලන් පස් වැනි සංසදයට සහභාගී වීම සඳහා 2012 ජනවාරි 22 - 24 දිනවලදී කටාර් හි සංචාරයක නියැළිණි.

ශ්‍ර ලංකා ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මහතා 2012 මැයි 20 - 22 දිනවලදී පැවති 12 වැනි දෝහා සංසදයට සහභාගී වීම සඳහා කටාර් රාජ්‍යයේ සංචාරයක නියැළිණි. ජනාධිපතිවරයා මෙම සංසදයට සහභාගී වූයේ කටාර් හි එමීර්වරයා වන අතිගරු ෂෙයික් හමාඩ් බලීෆා අල් තානි මහතාගේ ආරාධනයෙන් ජාත්‍යන්තර අමුත්තෙකු ලෙසය.

**එක්සත් අරාබි එමීර් රාජ්‍ය**

- 2012 ජූනි 27-28 දිනවලදී ඩුබායි හිදී පැවති පොදුවේ හෝ පෞද්ගලිකව මුහුදු කොල්ලකෑම මැඩලීම පිළිබඳ ඉහළ මට්ටමේ සම්මේලනයට සහභාගී වූ සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් නියෝජිත කණ්ඩායමේ නායකත්වය විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු නියෝමාල් පෙරේරා මහතා විසින් දරන ලදී. ඩුබායි හිදී පැවැති ලෝක බලශක්ති සංසදයට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා, 2012 ඔක්තෝබර් 22-24 දිනවලදී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංචාරයක නිරත විය.

**සෞදි අරාබිය**

- විදේශ කටයුතු අමාත්‍ය ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා 2012 මාර්තු 12 වැනි දින සවුදි අරාබියේ සංචාරයක නිරත වූ අතර, එහිදී විදේශ කටයුතු පිළිබඳ වැඩ බලන අමාත්‍ය අබ්දුල් අසීස් බින් අබ්දුල්ලා කුමරු රියාද් හි ආණ්ඩුකාර සත්තම් බින් අබ්දුල් අසීස් කුමරු සහ ශුරා කවුන්සිලයේ සභාපති අබ්දුල්ලාහ් අල්-අෂෙයික් මහතා හමු වී සාකච්ඡා පැවැත්විය.

- සංවර්ධනය සඳහා සෞදි අරමුදලේ නියෝජිත කණ්ඩායමක් 2012 ඔක්තෝබර් 27 - 30 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැළිණි. සෞදි අරාබියේ මුදල් අමාත්‍යවරයා සහ සංවර්ධනය සඳහා සෞදි අරමුදලේ සභාපතිවරයා සහ සංවර්ධනය සඳහා සෞදි අරමුදලේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා මෙම නියෝජිත කණ්ඩායමට අයත් වූහ.

බහු පාර්ශ්වික සබඳතා

කටාර්

- වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ 13 වැනි සැසිවාරයට (UNCTAD XIII) සහභාගි වීම සඳහා, කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු රිෂාඩ් බද්යුදීන් මහතා සහ නියෝජිත කණ්ඩායමට, 2012 අප්‍රේල් 21-26 දිනවලදී කටාර් රාජ්‍යයේ දෝහා හි සංචාරයක නිරත වූහ.

- තැපැල්පති ඩී.එල්.පී.ආර. අබේරත්න මහතා සහ ශ්‍රී ලංකා තැපැල් සේවාවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සිව් දෙනෙක් 2012 සැප්තැම්බර් 24 - ඔක්තෝබර් 15 දක්වා කාලය තුළ පැවති සර්ව ලෝක තැපැල් සංගමයේ (UPU) - දෝහා 25 වැනි කොන්ග්‍රස් රැස්වීමට සහභාගි වූහ.

- දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම, වාරිමාර්ග, ගොවිජන සංවර්ධන, කාර්මික හා පාරිසරික අමාත්‍ය ගරු විජය එස්. වීරසිංහ මහතා මධ්‍යම පළාතේ කෘෂිකර්ම හා පාරිසරික අමාත්‍ය ගරු නිමල් පියතිස්ස මහතා සහ පරිසර අමාත්‍යාංශයේ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු සහ වෙනත් අදාළ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නිලධාරීහු, 2012 නොවැම්බර් 26 සිට දෙසැම්බර් 07 දක්වා පැවති එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ සමුළුව - COP18, CMP8, දෝහා - 2012ට සහභාගි වූහ.

- ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිලධාරී පිරිසක් 2012 ඔක්තෝබර් 02 - 04 දිනවලදී පැවති "ෆොල්කන් (3) 2012 ඒකාබද්ධ පුහුණු/ ඊගල් රිසෝල්ව් - කටාර් සඳහා සහභාගි විය.

එක්සත් අරාබි එමීර් රාජ්‍යය

ගරු කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ඩුබායි හි සංචාරයක නියැලුණු අතර 2012 මැයි 01 - 03 දිනවලදී පවත්වන ලද වාර්ෂික ආයෝජන රැස්වීම සඳහා සහභාගි විය. මෙම සංචාරය අතරතුරදී ගරු අමාත්‍යවරයා සහ නියෝජිත කණ්ඩායම ශ්‍රී ලංකාවේ බිහි වී ඇති ආයෝජන ඉඩ ප්‍රස්ථා පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම් කරන ලදී.

ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති, 2012 ඔක්තෝබර් 22 - 24 දිනවලදී පැවති ලෝක බලශක්ති සංසදය 2012 සඳහා සහභාගි වීම සඳහා ඩුබායි හි සංචාරයක නියැලුණි. මෙම නියෝජිත කණ්ඩායමට ජනාධිපති ආර්යාව සහ විදේශ කටයුතු සඳහා අධීක්ෂණ මන්ත්‍රී ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා ද අයත් විය.

ශ්‍රී ලංකාවේ ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂ මැතිණිය 2012 ඔක්තෝබර් 23 වැනි දින ඩුබායි හි දී පැවති තිරසාර සංවර්ධනය පිළිබඳ ජනාධිපති ආර්යාවන්ගේ සමුළුවට සහභාගි විය.

ආර්ථික සබඳතා

කුවේට්

- උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු එස්.බී. දිසානායක මහතා සහ නියෝජිත කණ්ඩායම කුවේට් හි සංචාරයක නිරත වූ අතර, එහිදී ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල සමඟ සාකච්ඡා පවත්වන ලදී. අග්නි දිග විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති ඇගයීම් කටයුතු සඳහා ඇ.ඩො. මිලියන 12ක් අනුමත වී තිබේ.

**එක්සත් අරාබි එමීර් රාජ්‍යය**

- වාර්ෂික ආයෝජන රැස්වීමට සහභාගී වීම සඳහා ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා, 2012 මැයි 1-3 දිනවලදී ඩුබායි හි සංචාරයක නිරත විය.

- ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා එක්සත් අරාබි එමීර් රාජ්‍ය වෙත සංචාරය කළ අතර එහිදී දෙරට අතර ඒකාබද්ධ කොමිෂන් සභාවක් ස්ථාපනය කළේය. එහිදී පොදුවේ උනන්දුවක් දක්වන සහ දෙරට අතර සහයෝගිතාව සහ ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීමෙහිලා ඇති මාර්ග පිළිබඳ සාකච්ඡා පැවැත්වුන.

- 2012 ඔක්තෝබර් 22 - 24 දිනවලදී ඩුබායි හි දී පැවති ලෝක බල ශක්ති සංසදය - 2012ට සමගාමීව, අතිගරු මහින්ද රාජපක්ෂ මහතා, පොදුවේ උනන්දුවක් දක්වන කරුණු සාකච්ඡා කිරීම සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අමාත්‍යවරු කිහිප දෙනෙක් හමුවිය.

**සෞදි අරාබිය**

සංවර්ධනය සඳහා සවුදි අරමුදල කොළඹ ජාතික රෝහලේ ජාතික ස්නායු - ක්ෂති මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු. මිලියන 3,000 ක ආධාරයක්ද, අපස්මාර රෝහල සහ සෞඛ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. මිලියන 20ක ආධාරයක්ද නිදහස් කොට ඇත. කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. මිලියන 46 ට අනුරූප වන ණය ආධාර ලබා දෙන බවද සංවර්ධනය සඳහා වන සවුදි අරමුදලක් සහතික වශයෙන් දක්වා තිබේ. සවුදි රජයෙන් ලැබුණු සවුදි රියාල් මිලියන 440ක මූල්‍යාධාර භාවිතයෙන්, මීටර් 396 දිගකින් යුත් පාලමක් ඉදිකරන ලදි. ඇ.ඩො. මිලියන 40ක වියදමක් දරමින් ශ්‍රී ලංකාවේ හෙදියන් පුහුණු කිරීමේ ආයතනයක් ඉදිකිරීම් සඳහා ආධාර ලබාදීමද සවුදි සෞඛ්‍ය ආයෝජන සමාගම පොරොන්දු වී තිබේ. ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය ඉදිකිරීම සඳහා සවුදි රියාල් මිලියන 223 ක මූල්‍යාධාර ද සවුදි අරාබි රාජධානිය විසින් ලබා දී තිබේ.

**සංස්කෘතික සබඳතා**

**ඕමානය**

2012 ජනවාරි 28 - පෙබරවාරි 03 දක්වා කාලයේදී පැවති ඕමාන සුල්තාන් රාජ්‍යයේ "මස්කට් උළෙල"සඳහා අපගේ දූත මණ්ඩලය සහභාගී විය. ශ්‍රී ලංකාව සඳහා වෙන් කළ කුටියේදී, ශ්‍රී ලංකාව පිළිබඳ විදහා දක්වමින් නිෂ්පාදන රැසක් ප්‍රදර්ශනය කරන ලදි. මස්කට් හි ශ්‍රී ලාංකික පාසල්වල හා මස්කට් හි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහය ඇතිව සංස්කෘතික වැඩසටහන් ප්‍රදර්ශනය කරන ලදි.

**කටාර්**

දෝහා කටාර් හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය, 2012 සැප්තැම්බර් 06 වැනි දින "කටාර් මියුසියම් ඔතෝරිටි ගැලරි" හි දී සංස්කෘතික අංගයක් පැවැත්විය. ශ්‍රී ලංකාවේ ඡායා රූප ප්‍රදර්ශනයක් සහ "ශ්‍රී ලංකා තේ" සංග්‍රහ කිරීමේ කුටියක් මීට අයත් විය. "ශ්‍රී ලංකන් එයාර් ලයින්ස්" සමාගමද මෙම අවස්ථාවට සහභාගී විය.

**සෞදි අරාබිය**

රියාද් හි හා ජෙඩා හි පිහිටි අපගේ දූත මණ්ඩල විසින් හජ්ජ් හා උම්රා වන්දනාකරුවන් සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලදි. ජෙඩා ගුවන් තොටුපළට වන්දනාකරුවන් පැමිණීමේදී පිළිගැනීම, හජ්ජ් කාලය තුළදී මක්කා, මදීනා, මිනා, අරෆා වන්දනාකරුවන්ගේ සුභ සාධන කටයුතු ඉටු කර දීම සහ ජෙඩා හි දී වන්දනාකරුවන් පිටත්ව යන අවස්ථාවේ අවශ්‍ය සහාය ලබා දීම මීට අයත් විය. සෞදි බලධාරීන්, වන්දනාකරුවන් 3000ක කෝටාවක් ශ්‍රී ලංකාවට ලබා දී තිබේ.

**එක්සත් අරාබි එමීර් රාජ්‍යය**

මැදපෙරදිග රටවල වෙසෙන කුසලතා පූර්ණ ශ්‍රී ලාංකික සේවකයන් හඳුනාගෙන සම්මාන පිරිනැමීමේ අරමුණින් යුතුව"ද රණවිරු ටැලන්ට්ස්ටාර්"වැඩ සටහනට විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍ය ගරු ඩිලාන් පෙරේරා මහතා සහභාගී විය.

# අප්‍රිකා අංශය

අප්‍රිකා අංශය

**අප්‍රිකාව සමග ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික සබඳතා**

අප්‍රිකා කලාපයේ රටවල් 62ක් තිබේ. නමුත්, ස්වෛරී රාජ්‍යයන් වන්නේ ඉන් රටවල් 54ක් පමණි. අනෙකුත් රාජ්‍ය, ස්වාධීන රාජ්‍ය ලෙස අර්ධ වශයෙන් පිළිගැනුණු, ස්වාධීන රාජ්‍ය ලෙස පිළිනොගැනුණු හෝ ස්වාධීන නොවන දේශයන්ය.

ශ්‍රී ලංකාව **රුවන්ඩාව, කොන්ගෝ ජනරජය (බ්‍රසාවිල්)** සහ **මාලි ජනරජය** සමග පිළිවෙළින්, 2011 අප්‍රේල් 20, 2012 පෙබරවාරි 01 හා 2012 ජනවාරි 19 වැනි දිනවලදී නිල රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කළාය.

**දකුණු සුඩානය** සමග රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම සඳහා, 2011 අගෝස්තු 17 වැනි දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාදුන් අතර, රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇතිකර ගැනීම සඳහා ශ්‍රී ලංකාව **දකුණු සුඩානයේ** බලධාරීන්ගේ ප්‍රතිචාරය අපේක්ෂාවෙන් පසුවෙයි.

නිල රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දුන් රටවල් 15* අතුරින්, මොරිටේනියාව සමඟ 2012 දෙසැම්බර් 21 වැනි දින ද, බර්කිනා ෆාසෝ සමඟ 2012 නොවැම්බර් 15 වැනි දිනද අවශ්‍ය ක්‍රියාපටිපාටි සම්පූර්ණ කර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමට අමාත්‍යාංශයට හැකිවිය. **එබැවින් අප්‍රිකානු රටවල් 37ක් (තද කළු අකුරින් දක්වා ඇත) සමග ශ්‍රී ලංකාව දැන් නිල රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වන අතර,** රාජ්‍යතාන්ත්‍රික සබඳතා ආරම්භ කිරීම සඳහා තවත් රටවල් 13ක අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටියි.

නැගෙනහිර අප්‍රිකාව:

බුරුන්ඩි, කොමොරොස්, ***ජිබුටි**, **එරිත්‍රියාව, ඉතියෝපියාව, කෙන්යාව**, මැඩගස්කරය,***මලාවි, මුරුසිය,** මයොත්(ප්‍රංශය),**මොසැම්බික්**, රෙයුනියොන් (ප්‍රංශය), **රුවන්ඩාව, සීෂෙල්ස්, සෝමාලියාව,** ටැන්සානියාව, **උගන්ඩාව, සැම්බියාව.**

මධ්‍යම අප්‍රිකාව:

**ඇන්ගෝලාව,** * කැමරූන්, * මධ්‍යම අප්‍රිකානු ජනරජය, *චැඩ්, **කොන්ගෝ ජනරජය,කොන්ගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජය (සයිරේ ලෙස තිබූ),** *එක්වටෝරියල් ගිනියා, *ගැබෝන්, සාඕ තොමේ ඇන්ඩ් ප්‍රින්සිප්

උතුරු අප්‍රිකාව:

**ඇල්ජීරියාව, ඊජිප්තුව, ලිබියාව, මොරොක්කෝව, සුඩානය,** දකුණු සුඩානය, **ටියුනීසියාව,** සහ්රාවි අරාබි ප්‍රජාතාන්ත්‍රික ජනරජය.

උතුරු අප්‍රිකාවේ ස්පාඤ්ඤසහ පෘතුගීසි දේශයන් :

කැනරි දූපත් (ස්පාඤ්ඤය), සයුටා (ස්පාඤ්ඤය)**,** මැඩෙයිරා දූපත් (ඕලන්ද), මෙලිල්ලා (ස්පාඤ්ඤය)

<u>දකුණු අප්‍රිකාව</u> :

**බොට්ස්වානා, ලෙසොතෝ, සිම්බාබ්වේ, නැමීබියාව, දකුණු අප්‍රිකාව, ස්වාසිලන්තය.**

<u>බටහිර අප්‍රිකාව:</u>

**බෙනින්**, ***බර්කිනා ෆාසෝ**, *කේප් වර්ඩ්, ***අයිවරි කෝස්ට්**, *ගැම්බියාව, **ඝානාව, ගිනියාව, ගිනි - බිසව්, ලයිබීරියාව, මාලි,*මොරිටේනියාව**, *නයිජර්, **නයිජීරියාව,** සෙන්ට් හෙලෙනා, *ඇසෙන්ෂන් හා ට්‍රයිස්ටැන් ද කුන්හා (එක්සත් රාජධානිය), **සෙනෙගාල්**, *සියෙරා ලියෝන්, *ටෝගෝ

අප්‍රිකාවේ ශ්‍රී ලංකා නේවාසික දූත මණ්ඩල 4ක් තිබේ. ඊජිප්තුව - ඇල්ජීරියාව, ටියුනිසියාව, මොරොක්කෝව, සූඩානය, එරිත්‍රියාව, ඝානාව, නයිජීරියාව හා මාලි: කෙන්යාව - ඉතියෝපියාව, උගන්ඩාව, රුවන්ඩාව සහ ටැන්සානියාව: දකුණු අප්‍රිකාව - ඇන්ගෝලාව, බොට්ස්වානාව, ලෙසොතෝව, මුරුසිය, මැඩගස්කරය, මොසැම්බික්, නැම්බියා, සීෂෙල්ස්, ස්වාසිලන්තය, සැම්බියාව සහ සිම්බාබ්වේ: ලිබියාව - තාවකාලික වසා තිබේ.

**සීෂෙල්ස් :**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරාධනයෙන්, සීෂෙල්ස් හි ජනාධිපති අතිගරු ජේම්ස් ඇලික්ස් මිෂෙල් මහතා 2012 අගෝස්තු 20-23 දක්වා දිනවලදී ශ්‍රී ලංකාවේ තෙදින රාජ්‍ය සංචාරයක නියැලුනේය. අතිගරු මිෂෙල් මහතා සමඟ එරට විදේශ අමාත්‍ය ගරු ජීන්-පෝල් ඇඩම් මහතා, ස්වාභාවික සම්පත් හා කර්මාන්ත අමාත්‍ය, ගරු පීටර් සිනොන් මහතා සහ ඉහළ පෙළේ සාමාජිකයින් 15න් යුත් නියෝජිත කණ්ඩායමක් මෙහි පැමිණියහ. සීෂෙල්ස් හි සිට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංචාරයක නියැලුණ ප්‍රථම අවස්ථාව මෙය විය.

දූපත් රාජ්‍ය ලෙස ශ්‍රී ලංකාව හා සීෂෙල්ස්, සාගර සම්පත් ආරක්ෂා කිරීම සඳහා මීට සමාන අදහස් දක්වන වෙනත් රටවල් සමඟ එක්ව කටයුතු කළ බව අතිගරු මිෂෙල් මහතා ප්‍රකාශ කර සිටියේය. අතිගරු මිෂෙල් මහතා, සීෂෙල්ස් හි සංචාරය කරන ලෙස සහ නැගෙනහිර හා දකුණු අප්‍රිකාව සඳහා පොදු වෙළඳපොළ (COMESA) හරහා සුවිශාල අප්‍රිකානු වෙළඳපොළ වෙත ප්‍රවේශ වන ලෙස ශ්‍රී ලංකා ව්‍යාපාරික ප්‍රජාවට ආරාධනා කළේය. ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ගුවන් යානාවලට වික්ටෝරියා වෙත පියාසර කරන ලෙස ද ඔහු ආරාධනා කර සිටියේය. සමුද්‍රික ආරක්ෂාව හා මුහුදු කොල්ල කෑම පිළිබඳව ඇති විශේෂඥභාවය සහ දැනුම බෙදා හදා ගැනීමට ශ්‍රී ලාංකික ආරක්ෂක නිලධාරීන්ටද ඔහු ආරාධනා කර සිටියේය.

අතිගරු මිෂෙල් මහතා කොළඹ දී, "ගෝලීය කරළියේදී කුඩා දූපත් රාජ්‍යවල කාර්යභාරය" මැයෙන් දේශනයක් ද පැවැත්විය. මොහු ඉහළ පෙළේ ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්ද හමුවිය. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ගරු චමල් රාජපක්ෂ මහතා ද හමු වූ මෙතුමා, ඉන් අනතුරුව ශ්‍රී ලංකා - සීෂෙල්ස් මිත්‍රත්ව කටයුතු කමිටුව ප්‍රකාශයට පත්කිරීමේ අවස්ථාවට සහභාගී විය.

අතිගරු මිෂෙල් මහතා කොළඹ නැව් තටාකාංගණය, කොළඹ ජාත්‍යන්තර නාවික හා ඉංජිනේරු විද්‍යාලය (CINEC) සහ නාවික වෙරළාරක්ෂක මුර යාත්‍රා තැනීමේ ව්‍යාපෘතිය (IPCCP) නැරඹුවේය. ශ්‍රී ලංකාව"නැව් තැනීමේ කේන්ද්‍රස්ථානය" ලෙස ප්‍රවර්ධනය කිරීමට සහ ශ්‍රී ලංකාව සමඟ නාවුක ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ශක්තිමත් සබඳතා ඇතිකර ගැනීමට සීෂෙල්ස් බලාපොරොත්තු වෙයි. සෞඛ්‍යය, අධ්‍යාපනය සහ පුහුණුව, ශ්‍රී ලාංකිකයන් සඳහා සීෂෙල්ස් හි රැකියා අවස්ථා ලබාදීම සහ නීති කටයුතු පිළිබඳ කම්කරු සහයෝගීතාව යන ක්ෂේත්‍ර

සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් කිපයකටද නායක දෙපළ ඉදිරියේ අත්සන් තබන ලදි. රාජ්‍ය සංචාරයේ පසු විපරම් කටයුතු උදෙසා **"කාර්ය සාධන බලකාය/ පසු විපරම් කමිටුව"** ස්ථාපනය කිරීම සඳහා සහ ලංකා බැංකුව (BOC) මගින් **සීෂෙල්ස් වෙනුවෙන් ණය පහසුකමක් විවෘත කිරීම සඳහා** 2012 සැප්තැම්බර් 27 වැනි දින, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලදි. විදේශ කටයුතු ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුතු **"පසු විපරම් කමිටුව"** රාජ්‍ය සංචාරය අතරතුර ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම/ ඒ පිළිබඳ පසු විපරම් කිරීම සඳහා ස්ථාපනය කරන ලදි.

- සීෂෙල්ස් සඳහා ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරයා ලෙස එරල් ෆොන්සේකා මහතාව නම් කරන ලදි.

- කෙටි කාලයක් නැවතී සිටීම සඳහා වීසා බලපත්‍රවලින් නිදහස් කිරීම පිළිබඳ ශ්‍රී ලංකාව සහ සීෂෙල්ස් අතර ගිවිසුමකට, 2012 සැප්තැම්බර් 28 වැනි දින, 67 වැනි එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීමට සමගාමීව නිව්යෝර්ක් හි දී එළඹෙන ලදි.

- ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය දොස්තර රාජිත සේනාරත්න මහතා 2012 ඔක්තෝබර් 24 - 31 දිනවලදී සීෂෙල්ස් හි සංචාරයක නිරත විය. ගරු අමාත්‍යවරයාගේ මෙම සංචාරය අතරතුර, 2012 ඔක්තෝබර් 30 වැනි දින වික්ටෝරියා හි දී ධීවර කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබිණ.

- ලංකා බැංකු ශාඛාවක් සීෂෙල්ස් හි ආරම්භ කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා සහ ණය පහසුකමක් විවෘත කිරීම සඳහා ලංකා බැංකුවේ සභාපතිවරයා සහ විදේශ සබඳතා පිළිබඳ කළමනාකාරීවරයා 2012 ඔක්තෝබර් 14 - 20 සීෂෙල්ස්හි සංචාරයක නිරත විය.

- සීෂෙල්ස් හි ආරක්ෂක හමුදා ප්‍රධානී බ්‍රිගේඩියර් එල්. පයෙට් මහතා, 2012 දෙසැම්බර් 10 - 16 දිනවලදී ශ්‍රී ලංකාවේ පැවති ගාලු සංවාදය - සාමුද්‍රික සම්මේලනයට සහභාගී විය.

**ස්වාසිලන්තය:**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරාධනයෙන්, ස්වාසිලන්තයේ රජු වන III වන මිස්වටි රජතුමා,2012 අගෝස්තු 13 - 15 කාලයේදී ශ්‍රී ලංකාවේ තෙදින රාජ්‍ය සංචාරයක නියැලුණේය.

පෞද්ගලික රාජ්‍ය පාර්ශ්වකාරත්වය සහ දෙරටේ වාණිජ මණ්ඩල අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය ඇති කිරීම දිරි ගැන්වීමේ වැදගත්කම හුවා දක්වමින්, ආර්ථික සහයෝගිතාව වැඩි දියුණු කිරීම සඳහා සහ වෙළඳ කටයුතු නානාංගිකරණය කිරීම සඳහා දෙරට අතර පවතින ඉඩ ප්‍රස්ථා සොයා බැලීමේ වැදගත්කම ද ඔහු අවධාරණය කළේය. කෘෂිකර්මය, මිරිදිය ධීවර කටයුතු, උසස් අධ්‍යාපන, සෞඛ්‍ය, සිවිල් ගුවන් සේවා, තොරතුරු තාක්ෂණය සහ කුඩා ජල විදුලි බලාගාරවල ජල විදුලිය උත්පාදනය යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතු අත්දැකීම්, විධිමත් පුහුණු පැවැත්වීම, හුවමාරු වැඩ සටහන් හා ශිෂ්‍යත්ව තුළින් බෙදා ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ඇත. බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ස්වාසිලන්තය සතුව සුවිශාල ඉඩප්‍රස්ථා තිබෙන අතර, මෙම අංශයේ ආයෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම එරට විසින් සතුටින් පිළිගනු ඇත. මෙම රාජ්‍ය සංචාරය නිසා ශ්‍රී ලංකාව සහ ස්වාසිලන්තය අතර දේශපාලන හා ආර්ථික සහයෝගිතාව වැඩි දියුණු කිරීම සඳහා මං විවර විය.

ද්විපාර්ශ්වික සාකච්ඡාවලින් අනතුරුව, ආර්ථික, වාණිජ හා තාක්ෂණ සහයෝගිතාව පිළිබඳ ගිවිසුමකට ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සහ ස්වාසිලන්ත විදේශ කටයුතු අමාත්‍ය ගරු මිට්ටි ෆකුඩ්සෙ මහතා විසින් අත්සන් තබන ලදි. ස්වාසිලන්ත නියෝජිත කණ්ඩායම, ස්වාභාවික සම්පත් හා බලශක්ති සහ වාණිජ, කර්මාන්ත හා වෙළඳ අමාත්‍යවරුන්ගෙන් සමන්විත විය.

- ස්වාසිලන්තයේ III වැනි මිස්වාටි රජතුමගේ සංචාරයෙන් අනතුරුව ඇති වූ ප්‍රධානතම වෙනසක් ලෙස, ශ්‍රී ලාංකික ට්‍රැක්ටර් සමාගමක් (එඩිනා), ස්වාසිලන්තයේ ට්‍රැක්ටර් එකලස් කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ කර තිබේ. මෙය, 2013 අප්‍රේල් මසදී සියලු පහසුකම් සහිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් බවට වැඩි දියුණු කිරීමට නියමිතයි.

- ශ්‍රී ලාංකක සමාගමක් වන AKLO තොරතුරු තාක්ෂණ සමාගම, ව්‍යාපාරික රුස්වීම් සඳහා ස්වාසිලන්තයේ සංචාරයක නිරත විය. අප්‍රිකාව තුළ ව්‍යාපාරික කටයුතු සිදු කිරීම සඳහා මෙම සමාගම "AKLO අප්‍රිකානු පෞද්ගලික සමාගම" වශයෙන් දකුණු අප්‍රිකානු සමාගමක් ලෙස ලියාපදිංචි වී තිබෙන අතර, අප්‍රිකාව තුළ ව්‍යාපාරික කටයුතු ව්‍යාප්ත කරලීම සඳහා දකුණු අප්‍රිකානු සමාගමක් සමඟ අවබෝධතා ගිවිසුමකට ද අත්සන් තබා ඇත.

**උගන්ඩාව**

- උගන්ඩාවේ ප්‍රථම ශ්‍රී ලාංකික නිර්වේතනික කොන්සල්වරයා ලෙස වී. කනනාදන් මහතාව පත් කරන ලදි.

- වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතාගේ නායකත්වයෙන් යුත් පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක්, 2012 මාර්තු 31 සිට අප්‍රේල් 05 දක්වා දිනවලදී කම්පාලා හි පැවති 126 වැනි අන්තර් පාර්ලිමේන්තු සංගම් සම්මේලනයට සහභාගී වීම සඳහා උගන්ඩාවේ සංචාරයක නියැලුණේය.

- 2012 ජූලි 03 - 06 දිනවලදී උගන්ඩාවේ කම්පාලා නුවර පැවති ජාත්‍යන්තර විදුලි සංදේශ චන්ද්‍රිකා සංවිධානයේ පාර්ශ්වවල මහ සභා රුස්වීමටද ශ්‍රී ලංකාව සහභාගී විය.

**උගන්ඩා ජනාධිපතිවරයාගේ ශ්‍රී ලංකා රාජ්‍ය සංචාරය:**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරාධනය මත, අතිගරු ජනාධිපති යොවෙරි කගුටා මුසවේනි මහතා, ජනාධිපති ආර්යා සහ කරමොජා කටයුතු පිළිබඳ ඇමතිනී අතිගරු ජැනට් කටාහා මුසවේනී මහත්මිය සහ උගන්ඩා නියෝජිත කණ්ඩායම, 2012 නොවැම්බර් 12 - 15 දිනවලදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංචාරයක නිරත වූහ.

මසුලිටා ආයතනය වැඩි දියුණු කිරීම සඳහා සහ "ශ්‍රී ලංකා - උගන්ඩා මිත්‍රත්ව වෘත්තීය සහ තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය" (SLVF - VTTC) ස්ථාපනය කිරීම සඳහා ඇ.ඩො. මිලියන 1.5ක මුදල් ප්‍රමාණයක් වෙන් කර දීම පිළිබඳව අතිගරු ජනාධිපති රාජපක්ෂ මහතාට ස්තුතිය පුද කිරීමට අතිගරු ජනාධිපති මුසවේනි මහතා මෙය අවස්ථාවක් කර ගත් අතර, මෙසේ මුදල් වෙන් කර දීම උගන්ඩාවේ මානව සම්පත් සංවර්ධනය සඳහා උපකාරී වනු ඇත.

සංචාරය අතරතුරදී, අතිගරු ජනාධිපති මුසවේනි මහතා, උගන්ඩාවේ පවතින ව්‍යාපාරික අවස්ථා පිළිබඳව අපනයන සංවර්ධන මණ්ඩලයේදී ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ප්‍රජාව/ මණ්ඩල ඇමතූ අතර, උගන්ඩාවේ, විශේෂයෙන් ම එරට ජල විදුලිය, තේ සහ ඇඟලුම් කර්මාන්තවල ආයෝජනය කරන ලෙස ශ්‍රී ලාංකික ව්‍යාපාරික ප්‍රජාවට ආරාධනා කර සිටියේය. උගන්ඩාවේ කිරිපිටි වැනි අතිරික්ත නිෂ්පාදන සහ වෙනත් නිෂ්පාදන ශ්‍රී ලංකාවට අපනයන කිරීමේ හැකියාවද ඒ මහතා මෙහිදී අවධාරණය කළේය. තවද, උගන්ඩාවේ ජාතික වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය, ලංකා වාණිජ මණ්ඩලය සමඟ ගිවිසුමකටද එළඹෙන ලදී.

ජනාධිපතිවරයා ඇතුළු නියෝජිත කණ්ඩායම, අක්බාර් බ්‍රදර්ස් පෞද්ගලික සමාගමේ සැකසුම්/ වටිනාකම එකතු කිරීමේ කර්මාන්ත ශාලාවක් ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය, වත්තල, කෙලවරපිටිය පිහිටි ලංකා ට්‍රාන්ස්ෆෝමර් ලිමිටඩ් සහ බියගම පිහිටි හේලිස් කෘෂි සැකසුම් කර්මාන්ත ශාලාවද දැක බලා ගැනීමට ගියේය.

ශ්‍රී ලංකා උගන්ඩා මිත්‍රත්ව වෘත්තීය හා තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය (SLVF - VTTC) උගන්ඩාවේ ස්ථාපනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම, ආර්ථික, වාණිජ හා තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ ගිවිසුම, සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම, ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනය පිළිබඳ, අවබෝධතා ගිවිසුම, සංස්කෘතික ක්ෂේත්‍රයේ සහයෝගිතාවය පිළිබඳ ගිවිසුම යන දෙරට අතර අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් පහට 2012 නොවැම්බර් මස 13 වැනි දින එළඹෙන ලදී. උගන්ඩාවේ ජනාධිපතිවරයාගේ ශ්‍රී ලංකා සංචාරය පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අතර, මෙම සංචාරය අතරතුර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම් සඳහා 2012 නොවැම්බර් 18 වන දින ආවරණ අනුමැතිය ලැබිණ.

**දකුණු අප්‍රිකාව**

- හරිප් මෙහ්තා මහතා, ඩර්බන් හි ප්‍රථම ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයා ලෙස පත් කරන ලදී.

- ජොනතන් ජේකබ්ස් මහතා, කේප් ටවුන් හි ප්‍රථම ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයා ලෙස නම් කරන ලදී.

- 2012 මාර්තු මසදී, විදේශ කටයුතු අමාත්‍යවරයා දකුණු අප්‍රිකාවේ සංචාරයක නියැලුනේය. මෙහිදී අමාත්‍යවරයා ජාත්‍යන්තර සබඳතා හා සහයෝගිතා දෙපාර්තමේන්තුවේ (DIRCO) අමාත්‍යවරයා සහ මෙම දෙපාර්තමේන්තුවේ නියොජ්‍ය අමාත්‍යවරයා සහ අතිගරු ජනාධිපති ජේකොබ් සූමා මහතා හමුවිය.

- දකුණු අප්‍රිකාවේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ ආරාධනයෙන්, ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය ගරු දොස්තර රාජිත සේනාරත්න මහතා, ජල ජීවී වගාව පිළිබඳ උප කමිටුවේ 06 වන සැසි වාරයට සහභාගී වීම සඳහා 2012 මාර්තු 26-30 දිනවලදී කේප් ටවුන් හි සංචාරයක නිරත විය.

- ජාත්‍යන්තර සබඳතා සහ සහයෝගිතා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අමාත්‍ය ඊබ්‍රහිම් ඊබ්‍රහිම් මහතා 2011 නොවැම්බර් 15-19 දක්වා කාලයේදිත්, 2012 අගෝස්තු 07-12 දක්වා කාලයේදිත් ශ්‍රී ලංකාවට පැමිණියේය.

- 2012 මාර්තු හිදී ශ්‍රී ලංකාවේ පැවැති "ශ්‍රී ලංකා එක්ස්පෝ 2012" සඳහා සාමාජිකයන් අට දෙනෙකුගෙන් යුතු දකුණු අප්‍රිකානු ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් සහභාගී විය. ශ්‍රී ලංකාවේ සුවිශේෂී නිෂ්පාදන සහ සංචාරක කටයුතු ප්‍රදර්ශනය කිරීම මගින්, මාර්තු 8 සහ 9 දිනවලදී රාජ්‍යතාන්ත්‍රික කටයුතු පිළිබඳ වෙළඳ පොළක් ප්‍රිටෝරියා හිදී සංවිධානය කරන ලදී. SAITEX 2012 සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවන් නව දෙනෙකුගේ සහභාගිත්වය සඳහා අවශ්‍ය කටයුතු ජූලි මසදී සංවිධානය කරන ලදී. කේප් ටවුන් වාණිජ මණ්ඩලය, අප්‍රිකානු ජාතික කොන්ග්‍රස් ප්‍රගතිශීලී ව්‍යාපාරික සංසදය (ANC Progressive Business Forum)සහ කේප් ටවුන්හි ලෝක වෙළඳ මධ්‍යස්ථානය හා එක්ව ජූලි මස කේප්ටවුන් හිදී ව්‍යාපාර ගැලපීමේ වැඩ සටහනක් සංවිධානය කරන ලදී.

- 6000 කට අධික වෙළඳ සමාගම් සංඛ්‍යාවක් සාමාජිකත්වය උසුලන, අප්‍රිකානු ජාතික කොන්ග්‍රස් ප්‍රගතිශීලී ව්‍යාපාරික සංසදයේ (ANC PBF) සාමාජිකයන් 30කින් යුත් ඉහළ පෙළේ ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් 2012 සැප්තැම්බර් 5-19 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම නියෝජිත කණ්ඩායමේ නායකත්වය උසුලනු ලැබුවේ දකුණු අප්‍රිකාවේ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය මහාචාර්ය හ්ලෙන්ගිවි මිකිසේ මහතාය. එහිදී ශ්‍රී ලංකා-අප්‍රිකා හා මැද පෙරදිග ව්‍යාපාරික කවුන්සිලය සහ ලංකා වාණිජ මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක අත්සන් තබන ලදී. මෙම නියෝජිත කණ්ඩායම පාර්ලිමේන්තුව, "ෆැසට්ස්" ප්‍රදර්ශනය, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ,රබර්,ඇඟලුම් සහ පෝසිලේන් කර්මාන්ත ශාලා, තොරතුරු තාක්ෂණ උද්‍යානය, නැනෝ තාක්ෂණ උද්‍යානය සහ යාපනය අර්ධද්වීපය යන ස්ථාන නැරඹීය. පාර්ලිමේන්තුවේදී, ඔවුහු ශ්‍රී ලංකා- දකුණු අප්‍රිකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපති සහ ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා සහ වෙනත් මන්ත්‍රීවරුන් ද හමු වූහ. තවද, ඔවුහු, පාරම්පරික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්ද මහතා සහ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා ද හමු වූහ.

- දකුණු අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ආයතනයේ ආරාධනය මත, ගරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා ද නායකත්වයෙන් යුතු සහ ගරු අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මහතා, නියෝජ්‍ය අමාත්‍යවරුන් වන ගරු නියෝමාල් පෙරේරා මහතා ගරු ෆයිසර් මුස්තාපා මහතා සහ ගරු වී. මුරලිදරන් මහතාගෙන් සමන්විත වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නියෝජිත කණ්ඩායමක් 2012 ඔක්තෝබර් 28 සිට නොවැම්බර් 03 දක්වා දකුණු අප්‍රිකාවේ සංචාරයක නිරත විය.

- ඩර්බන් හි සංචාරක ප්‍රවර්ධන සමාගම් දෙකක්, ශ්‍රී ලංකාව පිළිබඳ අවබෝධයක් ලබා දීම ඔවුන්ගේ වැඩසටහන්වලට එක් කිරීමට එකඟතාවයක් පළ කර තිබේ. ජොහැන්නස්බර්ග් පිහිටි ගොල්ෆ් සංචාරක කටයුතු පිළිබඳ සුවිශේෂිතාවයක් උසුලන 3 වැනි සමාගමක් සමඟ සබඳතාවයක් ගොඩනගා ගෙන ඇති අතර, එම සමාගම ශ්‍රී ලංකාව සමඟ කටයුතු කිරීමට උනන්දුවෙන් පසුවෙයි.

- සමාගම් 12ක් නියෝජනය කරමින්, ලංකා වාණිජ මණ්ඩලයේ නියෝජිත කණ්ඩායමක් 2012 අවසාන කාර්තුවේදී දකුණු අප්‍රිකාවේ සංචාරයක නිරත විය. එරට සංචාරය කළ එම නියෝජිත කණ්ඩායම වෙනුවෙන් ජොහැන්නස්බර්ග්, ප්‍රිටෝරියා සහ කේප් ටවුන් නගරවලදී පැවැත් වූ ව්‍යාපාර ගැලපීමේ සැසිවාරවලට දකුණු අප්‍රිකානු සමාගම් 200ක් පමණ සහභාගී විය.

- දකුණු අප්‍රිකාවේ මෘදුකාංග ඉංජිනේරුවන් සඳහා වන ජොහැන්නස්බර්ග් මධ්‍යස්ථානය සමඟ එක්ව, එරට සංචාරයේ යෙදුණු තොරතුරු තාක්ෂණය මගින් සේවා ලබා දෙන සමාගම්වල නියෝජිත කණ්ඩායමක් සඳහා ජොහැන්නස්බර්ග් සහා කේප් ටවුන් හිදී සම්මන්ත්‍රණ, ව්‍යාපාර ගැලපීමේ සැසි සංවිධානය කරන ලදී. එම මධ්‍යස්ථානයේ පිහිටි මෘදුකාංග සමාගම් මෙන්ම සිලිකන් කේප් ඉනිෂියටිව් හි පිහිටි මෘදුකාංග සමාගම් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් කටයුතු සිදු කිරීම සඳහා කේප් ටවුන් හි තාක්ෂණික නව නිපැයුම් කේන්ද්‍රය වන "බාර්න්හොන්බැන්ඩ්" වෙත යාමේ අවස්ථාව මෙම නියෝජිත කණ්ඩායමට හිමි විය.

- අප්‍රිකානු ජාතික කොන්ග්‍රසයේ ප්‍රගතිශීලී ව්‍යාපාරික සංසදයට සහභාගී වූ සමාගම් තිහක නියෝජිත කණ්ඩායම, ඒ.එම්.පී. හෝල්ඩින්ග්ස් පෞද්ගලික සමාගමේ නිෂ්පාදන පෙළ දකුණු අප්‍රිකාව තුළ අලෙවි කිරීම සඳහා එම සමාගම සමඟ ව්‍යාපාරික සබඳතා ඇති කර ගැනීම සඳහා 2 වන වරට ශ්‍රී ලංකාවේ සිදු කළ සංචාරය අංශය විසින් සංවිධානය කරන ලදී. සමාගම් දෙක මේ සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුමක ද කටයුතු නිමකොට ඇත. හෙට්ටිගොඩ ව්‍යාපාරයේ අධ්‍යක්ෂවරයා දකුණු අප්‍රිකාවේ සංචාරයක නිරත වූ අතර, සැප්තැම්බර් මස අප්‍රිකානු ජාතික කොන්ග්‍රසයේ ප්‍රගතිශීලී ව්‍යාපාරික සංසද නියෝජිත කණ්ඩායමට සහභාගි වූ තවත් දකුණු අප්‍රිකානු සමාගමක් වන "ක්‍රියේටිව් කන්සෙප්ට්ස්"සමඟ පසු විපරම් සාකච්ඡා පැවැත්විය. සිද්ධාලේප වෙළඳ නාමය දකුණු අප්‍රිකාවට හඳුන්වා දීම හා එහි අලෙවි කිරීම සඳහා තවදුරටත් සාකච්ඡා පැවැත්වීමට සොවෙටා හි ව්‍යාපෘති භූමියක් ඇක බලා ගැනීමටද ගියේය.

ඊජිප්තුව :

- 2012 මැයි 09-12 දිනවල ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා ඊජිප්තුවේ සංචාරයක නියැලුන අතර ඊජිප්තුවේ බලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්විය.

- මිනිසුන් නීති විරෝධී ලෙස ප්‍රවාහනය කරන්නන්ට සහ මිනිසුන් බලහත්කාරයෙන් ප්‍රවාහනය කරන්නන්ට එරෙහිව කටයුතු කිරීමට විදේශීය රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ සහාය ලබා ගැනීම සඳහා දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් කයිරෝහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් දියත් කර තිබේ. කයිරෝහි සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තර ආයතනය විසින් නීති විරෝධී ප්‍රවාහනයට ලක්වූ පුද්ගලයන්ට නැවත එම රටවලට යාම සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලදී.

- කයිරෝ ජාත්‍යන්තර ළමා චිත්‍රපට උළෙල, ඉස්මාලියා ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේ 15 වැනි සැසිය සහ ශුද්ධ වූ කුරානය පිළිබඳ මතකය පරීක්ෂා කිරීමේ 20 වැනි විශ්ව තරඟාවලිය යන අවස්ථා ශ්‍රී ලංකාව විසින් නියෝජනය කරන ලදී.

- ඊජිප්තුවේ කයිරෝ වාණිජ මණ්ඩලයේ නියෝජිත පිරිසක් "2012 EXPO SL" සඳහා සහභාගී විය. මෙම නියෝජිත පිරිස කළ සංචාරය අතරතුරදී, කයිරෝ වාණිජ මණ්ඩලය හා ලංකා වාණිජ මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී.

- ගරු විදේශ කටයුතු අමාත්‍යාවරයා, 2012 මැයි 06 - 10 දින වලදි පැවති XV වැනි නොබැඳි ජාතීන්ගේ සමුළුවට සහාභාගි විය.

- ඊජිප්තුවේ බින්දු ජල සම්පාදන තාක්ෂණය ශ්‍රී ලංකාවට ලබා ගැනීමේ හැකියාව සොයා බැලීම සඳහා, ශ්‍රී ලංකා යුද හමුදාවේ ත්‍රිපුද්ගල නියෝජිත කණ්ඩායමක් 2012 නොවැම්බර් 03 සිට 05 දක්වා දිනවලදී ඊජිප්තුවේ සංචාරයක නිරත විය.

- ශ්‍රී ලංකාවේ ජාතික පොහොර ලේකම් කාර්යාලය සඳහා හුණු ගල්, පොස්පේට් ගල් , සුදු වැලි , යූරියා ආනයනය කිරීමට MISR නැමති ඊජිප්තු රජයට අයත් සමාගමකින් මිල ගණන් කැඳවනු ලදී.

- ශ්‍රී ලංකා තේ ඊජිප්තුවේ අලෙවි කිරීම සඳහා පවතින ඉඩප්‍රස්ථා පිළිබඳ වාර්තාවක් සැකසීමට තොරතුරු එක් රැස් කිරීමේ අරමුණෙන් ප්‍රධාන පෙළේ තේ අපනයනකරුවන් සමඟ රැස්වීම් 14ක් පවත්වන ලදී.

**කෙන්යාව:**

- පරිසර අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායමක්, 2012 පෙබරවාරි 20-22 දිනවලදී පැවති එක්සත් ජාතීන්ගේ පරිසර වැඩ සටහනේ පාලක මණ්ඩලයේ / ගෝලීය අමාත්‍ය මට්ටමේ පරිසර සංසදයේ 12 වැනි සැසිවාරයට සහභාගී වීම සඳහා කයිරෝ හි සංචාරයක නිරත විය.

- 2012 ඔක්තෝබර් 29 නොවැම්බර් 02 දිනවලදී නයිරෝබි නුවර පිහිටි එක්සත් ජාතීන්ගේ හැබිටැට් සංවිධානයේ මූලස්ථානයේදී RAUF CCI විසින් පැවැත් වූ වැඩමුළුවට බස්නාහිර පළාත් ලේකම් එස්.ටී. කොඩිකාර මහතාගේ නායකත්වයෙන් යුත් නියෝජිත කණ්ඩායමක් සහභාගී විය.

**ඉතියෝපියාව**

- පෙකඩ්සෙ තදෙස්සෙ මහතා ඉතියෝපියාවේ, අඩිස් අබාබා හි ප්‍රථම ශ්‍රී ලාංකික නිර්වේතනික කොන්සල්වරයා ලෙස පත් කරන ලදී.
- සංචාරක සහ හෝටල් කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ ශිෂ්‍යත්ව 10ක් ඉතියෝපියා රජය වෙත පිරිනැමීමට ශ්‍රී ලංකාව එකඟ විය.

**නයිජීරියාව:**

- නයිජීරියා ෆෙඩරල් ජනරජ ආණ්ඩුව, කොළඹ නේවාසික දූත මණ්ඩලයක් විවෘත කළේය. කොළඹ නේවාසිකව සිටින ශ්‍රී ලංකාවේ ප්‍රථම නයිජීරියානු මහා කොමසාරිස්වරයා වන ෆෙමි ඇකින්සන් රොටිමි මහතා විසින් 2012 සැප්තැම්බර් 14 වැනි දින අතිගරු ජනාධිපතිතුමා වෙත සිය අක්ත පත්‍ර භාර දෙන ලදී.

- නයිජීරියානු ජාතික ආරක්ෂක පීඨයේ සාමාජිකයින් 20 දෙනෙකුගෙන් යුත් නියෝජිත කණ්ඩායමක් 2012 අප්‍රේල් 28 සිට මැයි 05 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලුන අතර එහිදී ශ්‍රී ලාංකික බලධාරීන් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් සාකච්ඡා පැවැත්විය.
- නයිජීරියානු ශිෂ්‍ය ශිෂ්‍යාවන් මාලඹේ පිහිටි තොරතුරු තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලාංකික ආයතනයට (SLIIT) බැඳුණි.

**සෙනෙගාල්:**

- 2012 අප්‍රේල් 07-13 දිනවලදී සෙනෙගාල් හමුදා විශේෂඥයින් හය දෙනෙක් ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලුණහ.

**සූඩාන ජනරජය :**

- ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා, 2012 අගෝස්තු 26-29 දිනවල සූඩාන ජනරජයේ සංචාරයක නිරත විය.

**ටියුනීසියාව**

- මුස්තාෆා ටබෙල්සි මහතාව, නිර්වේතනික කොන්සල් ධූරයෙන් නිර්වේතනික කොන්සල් ජනරාල් ධූරයට උසස් කරන ලදී.
- පොස්පේට් අපනයනය කරන ටියුනීසියානු සමාගම් දෙකකින් මිල ගණන් කැඳවන අතර එම මිල ගණන් ශ්‍රී ලංකාවේ ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලදී.

**මොසැම්බික්**

- වාලි මොමේඩ් හයාම් මහතා මොසැම්බික් හි ප්‍රථම ශ්‍රී ලාංකික නිර්වේතනික කොන්සල්වරයා ලෙස පත්වීම, 2012 අගෝස්තු 24 වන දින ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදී.

**බොට්ස්වානා**

- වුල්පත්මේන්ද්‍ර දහනායක මහතා බොට්ස්වානා හි ප්‍රථම ශ්‍රී ලාංකික නිර්වේතනික කොන්සල්වරයා ලෙස පත්වීම ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලදී.

**සෝමාලියාව**

- 2012 ජනවාරි 02 වැනි දින සිට සෝමාලි මුහුදු කොල්ලකරුවන් විසින් ප්‍රාණ ඇපයේ තබා ගෙන සිටි කේ.ඒ. සරත් චන්ද්‍ර සූරසේන මහතාව නිදහස් කර ගන්නා ලදි.

**එරිත්‍රියාව**

- කයිරෝ හි තානාපතිවරයා, 2012 නොවැම්බර් 22 වැනි දින එරිත්‍රියාවේ ජනාධිපති අතිගරු ඉසායිඅස් අෆ්වර්කි මහතා වෙත සිය අක්ත පත්‍ර පිරිනැමුවේය.

**රුවන්ඩාව**

- 2012 ජුලි 01 වැනි දින පැවති රුවන්ඩාවට නිදහස ලැබීමේ 50 වැනි සංවත්සර සැමරුමට (රුවන්ඩා රජයේ ආරාධනයෙන්) ගරු නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍යවරයා සහභාගී විය.

**නැම්බියාව**

- සැකි ඒජන්සි මහතා, නැම්බියාවේ ප්‍රථම ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයා ලෙස නම් කරන ලදි.
- නැම්බියාව, මාර්තු මස ශ්‍රී ලංකාවේ පැවති ශ්‍රී ලංකා එක්ස්පෝ 2012 සඳහා සහභාගී විය.

**සැම්බියාව**

- එල්මෝ ජයතිලක මහතා, සැම්බියාවේ ප්‍රථම ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයා ලෙස නම් කරන ලදි.

**වෙනත්**

- අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයකු ලෙස ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා 2012 පෙබරවාරි/ මාර්තු හි දි, **කොන්ගෝ ජනරජය, බුර්කිනා ෆාසෝ, බොට්ස්වානා, මොරිටේනියාව, බෙනින්, කැමරූන්, නයිජීරියාව, උගන්ඩාවසහ සෙනෙගාල්** යන රටවල විශේෂ සංචාරයක නියැලුණ අතර මානව හිමිකම් කවුන්සිලයේ 19 වැනි සැසිවාරය හා අදාල වන කරුණු මෙහිදි සාකච්ඡා කළේය.

- අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයෙකු ලෙස, 2012 මාර්තු මසදි, ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා සහ සංචාරක අමාත්‍ය ගරු ෆයිසර් මුස්තාපා මහතා පිළවෙලින් මුරුසියේ, ජිබූටි හා ලිබියාවේ සංචාරවල නියැලී, මානව හිමිකම් කවුන්සිලයේ 19 වැනි සැසිවාරය හා සම්බන්ධ කරුණු පිලිබඳව සාකච්ඡා කළහ.

- ශ්‍රී ලංකාව, ලෝක ආහාර වැඩසටහනේ සහාය ඇතිව, සුදු සහල් මෙට්‍රික් ටොන් දසදහසක් (10,000) සාගින්නේ පීඩා විඳින සෝමාලියාවේ හා නැගෙනහිර අප්‍රිකාවේ ජනතාව වෙත පරිත්‍යාග කළාය.

- ශ්‍රී ලංකාව ශ්‍රී ලංකා රුපියල් මිලියන 3.3 ක වෛද්‍ය ආධාර කොන්ගෝ ජනරජය වෙත පරිත්‍යාග කළාය. අදාළ වෛද්‍ය සැපයුම් තොගය, සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා විසින්, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු නියෝමාල් පෙරේරා මහතා වෙත භාර දෙන ලදී

- ශ්‍රී ලංකාව විසින් ඊජිප්තුවට - 01, කෙන්යාව - 01, නයිජීරියාව - 01, දකුණු අප්‍රිකාව - 01 හා ටැන්සානියාවට - 01ක් වන පරිදි විදේශ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පශ්චාත් උපාධි/ උපාධි 100ක් පිරිනමන ලදී.

# යුරෝපා, ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුළු සහ ඇමරිකා අංශය

**<u>බටහිර අංශය</u>**

**<u>දේශපාලන කටයුතු / බටහිර අංශය, යුරෝපා,ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුළු සහ ඇමරිකා රටවල් සමඟ ශ්‍රී ලංකාව පවත්වන ද්විපාර්ශවික සබඳතා වලට අදාළ වන වැඩ කටයුතු ආවරණය කරයි.</u>**

යුරෝපා :

ආවරණය වන රටවල් : 42

ඇල්බේනියාව, ඇන්ඩෝරා, ඔස්ට්‍රියාව, බෙල්ජියම, බොස්නියාව සහ හර්සගොවිනා, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙක් ජනරජය, ඩෙන්මාර්කය, එස්ටෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හන්ගේරියාව, අයිස්ලන්තය, අයර්ලන්තය, ඉතාලිය, ලැට්වියාව, ලීච්ටන්ස්ටයින්, ලිතුවේනියාව, ලක්සම්බර්ගය, මැසිඩෝනියාව, මෝල්ටාව, මොනැකො, මොන්ටෙනිග්‍රෝ, නොර්වේ, පෝලන්තය, පෘතුගාලය, රොමේනියාව, සැන් මැරිනෝ, සර්බියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය, ස්විට්සර්ලන්තය, වතිකානුව, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය, තුර්කිය

නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව : 12

ඔස්ට්‍රියාව, බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය (බර්ලින් හා ෆ්‍රැන්ක්ෆර්ට්), ඉතාලිය, නොර්වේ, පෝලන්තය, ස්වීඩනය, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය, තුර්කිය

සමගාමීව අක්තගන්වා ඇති සංඛ්‍යාව :

වියනාව වෙත බොස්නියාව හා හර්සගොවිනා, ක්‍රොඒෂියාව, චෙක් ජනරජය, හන්ගේරියාව, මැසිඩෝනියාව, සර්බියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව

බ්‍රසල්ස් වෙත ලක්සම්බර්ග් හා යුරෝපා සංගමය

පැරිසිය වෙත පෘතුගාලය හා ස්පාඤ්ඤය

බර්ලින් වෙත ස්විට්සර්ලන්තය

ජිනීවා වෙත වතිකානුව

රෝමය වෙත ඇල්බේනියාව, සයිප්‍රසය, ග්‍රීසිය, මෝල්ටාව

වෝර්සෝ වෙත බල්ගේරියාව, රොමේනියාව

ස්ටොක්හෝම් වෙත ඩෙන්මාර්කය, එස්ටෝනියාව, ෆින්ලන්තය, අයිස්ලන්තය, ලැට්වියාව, ලිතුවේනියාව

ලන්ඩන් වෙත අයර්ලන්තය

බහු පාර්ශ්වීය සංවිධාන සංඛ්‍යාව : 02

**පොදු රාජ්‍ය මණ්ඩලය හා යුරෝපා සංගමය**

නොබෝදා යුරෝපා සංගමයේ සාමාජිකත්වය ලබා ගත් නැගෙනහිර යුරෝපා රටවල් කිහිපයක් ඇතුළුව සමස්ත නැගෙනහිර යුරෝපය සමග අපගේ ද්විපාර්ශ්වික සබඳතා තහවුරු කර ගැනීම කෙරෙහි පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් යුරෝපා රටවල් සමග කටයුතු කිරීම සම්බන්ධයෙන් පසුගිය වසරේදී අවධානය යොමු කරන ලදී.

2012 වසරේදී සිදු කරනු ලැබූ ඉහළ පෙළේ සංචාර කිහිපයක් :

- අතිගරු ජනාධිපතිතුමා 2012 ජූනි මාසයේදී එංගලන්තයේ ලන්ඩන් නුවර පැවති මහ රැජිනගේ දියමන්ති ජුබිලි සංවත්සර සැමරුම් සඳහා සහභාගී විය. මෙම සංචාරයේදී, ජනාධිපතිවරයා බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍යවරයා සමග අන්‍යෝන්‍ය වශයෙන් ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත් වූ අතර, 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම සඳහා සත්කාරකත්වය ලබා දීමට ශ්‍රී ලංකාව සිදු කරන පෙර සූදානම් කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීමට පොදු රාජ්‍ය මණ්ඩලයීය මහ ලේකම්වරයා සමග හමුවක් පැවැත්විය.

- අතිගරු ජනාධිපතිතුමා ජූනි මාසයේදී වතිකානුවේ නිල සංචාරයක නියැලුණු අතර ශුද්ධ වූ XVI වැනි බෙනඩික් පාප්වහන්සේ සමග සහ වතිකානුවේ රාජ්‍ය ලේකම් ටාර්සිසියෝ බර්ටෝන් කාඩිනල්තුමා සමග සාකච්ඡාවක් පැවැත්විය.

- තිරසාර සංවර්ධනය (Rio + 20) පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවට සහභාගී වීම සඳහා අතිගරු ජනාධිපතිතුමා රියෝ ද ජැනයිරෝ හි නිරත වූ සංචාරය අතරතුරදී මොන්ටෙනෙග්‍රෝ හා හන්ගේරියානු රාජ්‍ය නායකයන් සමග ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්විය.

- ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, 2012 ජූනි මාසයේදී හන්ගේරියාවේ නිල සංචාරයක නියැලුණු අතර එහිදී ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්විය. හන්ගේරියාව, ආසියානු රටවල් සමග තම සබඳතා ව්‍යාප්ත කිරීමේ අපේක්ෂාවෙන් පසුවන අවස්ථාවක එරට සමග සබඳතා තහවුරු කර ගැනීමට මෙම සංචාරය මඟින් මං විවර විය. 2012 වසරේ නොවැම්බර් මසදී හන්ගේරියානු විදේශ අමාත්‍යවරයා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. හන්ගේරියානු පාර්ලිමේන්තුවේ කථානායකවරයාටද ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වන ලෙස ආරාධනා කර තිබේ. ජූනි මසදී ශ ලංකා විදේශ අමාත්‍යවරයා නිරත වූ සංචාරයේදී, දෙරටේ විදේශ අමාත්‍යාංශ අතර ක්‍රමවත් සාකච්ඡා පැවැත්වීමේ අරමුණින් දේශපාලනික උපදේශන හා සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමකට ශ්‍රී ලංකාව හා හන්ගේරියාව අත්සන් තබන ලදී. ඊට ප්‍රතිචාර වශයෙන් හන්ගේරියානු විදේශ අමාත්‍යවරයා 2012 නොවැම්බර් මස දී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලිණි. එහි ප්‍රතිඵලයක් ලෙස ලබුගම - කලටුවාව ජල පිරිපහදු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සැපයීමේ කටයුතු හංගේරියාවේ එක්සිම් බැංකුව විසින් අවසන් කරන ලදී.

- දියමන්ති ජුබිලි සැමරුම් සඳහා සහභාගීවීමට අතිගරු ජනාධිපතිතුමා එක්සත් රාජධානියේ නියැලුණු සංචාරය අතරතුරදී, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, එක්සත් රාජධානියේ විදේශ හා පොදු රාජ්‍ය මණ්ඩලයීය කටයුතු පිළිබඳ රාජ්‍ය ලේකම් අතිගරු විලියම් හේග් මහතා සමඟ ලන්ඩනයේදී ද්විපාර්ශ්වික රැස්වීමක් පවත්වන ලදී. ඉන් අනතුරුව, විදේශ අමාත්‍යවරයා 2012 සැප්තැම්බර් මසදී දේශනයක් පැවැත්වීම සඳහා කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය වෙත ගිය අවස්ථාවේදී, එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු උප රාජ්‍ය ලේකම්වරයා ද්විපාර්ශ්වික කරුණු පිළිබඳව සාකච්ඡාවෙහි නියැලුණේය.

- අමාත්‍යවරයා ජූනි මස රෝමයට ගිය අවස්ථාවේදී ඉතාලියේ නයෝජ්‍ය විදේශ අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික සාකච්ජා පවත්වන ලදී. මෙම රැස්වීමෙන් අනතුරුව, විදේශ අමාත්‍යවරයා විසින්, ඊට පෙර මාසයේදී ඉතාලියේ උතුරු ප්‍රදේශයේ සිදු වූ භූමිකම්පාවෙන් විපතට පත් වූ පුද්ගලයන්ගේ ප්‍රයෝජනය සඳහා සංකේත තේ පරිත්‍යාගයක් ඉතාලි රජය වෙත භාර දෙන ලදී.

- ගරු අමාත්‍යවරයා සැන් මැරිනෝ හි විදේශ අමාත්‍යවරයා ද රෝමයේදී හමු වූ අතර, එහිදී දෙරට අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුමකට ඔවුහු අත්සන් තැබූහ.

- සැප්තැම්බර් මස නිව්යෝර්ක් හි දී පැවති එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීමට සමගාමීව, අමාත්‍යවරයා චෙක් ජනරජයේ, සයිප්‍රසයේ, රොමේනියාවේ සහ හින්ලන්තයේ විදේශ කටයුතු අමාත්‍යවරුන් සමඟ ද්විපාර්ශ්වික සාකච්ජා පැවැත්විය.

- චෙක් ජනරජයේ සහ ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යවරුන් අතර නිල වශයෙන් ද්විපාර්ශ්වික උපදේශන පැවැත්වීම සඳහා ඔක්තෝබරයේදී ගරු විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා චෙක් ජනරජයේ සංචාරයක නියැලිණි.

- යුරෝපයේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරු සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු කිහිප දෙනෙක් මෙම වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සංචාරවල නිරත වූහ.

- ස්විස්ටර්ලන්ත විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආසියා පැසිෆික් අංශයේ නියෝජ්‍ය ප්‍රධානී 2012 පෙබරවාරි මස විදේශ කටයුතු අමාත්‍යාංශ නිලධාරීන් සමඟ සාකච්ජා පැවැත්විය.

- ශ්‍රී ලංකාව පිළිබඳ සර්ව පාක්ෂික පාර්ලිමේන්තු කණ්ඩායමේ සභාපති සහ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ උත්තර මන්ත්‍රී මණ්ඩල, සාමි මන්ත්‍රී මණ්ඩල සාමාජික අතිගරු නසෙබි සාමිවරයා 2012 මාර්තු/ අප්‍රේල් හි දී ශ්‍රී ලංකාවට පැමිණියේය. මෙම සංචාරයේදී ඔහු අතිගරු ජනාධිපතිතුමා බැහැදුටු අතර අමාත්‍යවරු කිප දෙනෙක් සමඟ සාකච්ජා පැවැත්විය. උතුරු හා දකුණු පළාත්වලද මෙතුමා සංචාරය කළේය. මෙම සංචාරයෙන් අනතුරුව එක්සත් රාජධානියට නැවත යාමෙන් අනතුරුව, නසෙබි සාමිවරයා සාමි මන්ත්‍රී මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කළේය.

- ඔස්ට්‍රියාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්, ආචාර්ය වුල්ෆ්ගැන්ග් වොල්ඩ්නර් මහතා 2012 අප්‍රේල්/ මැයි හි දී කොළඹට පැමිණි අතර, ගරු නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ සහ වෙනත් අමාත්‍යවරුන් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්විය.

- පාර්ලිමේන්තු මන්ත්‍රී ජේම්ස් වෝර්ටන් මහතාගේ නායකත්වයෙන් යුත් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක් ජූලි/ අගෝස්තු හි දී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. ඔවුහු අතිගරු ජනාධිපතිවරයා බැහැ දුටු අතර, කැබිනට් අමාත්‍යවරුන් සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රැසක් සමඟ සාකච්ඡා පැවැත් වූ අතර මධ්‍යම, උතුරු හා නැගෙනහිර පළාත්වල සංචාරය කළහ.

- 2012 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ හා බල්ගේරියාවේ විදේශ අමාත්‍යාංශ අතර බල්ගේරියාවේ අගනුවර වන සොෆියා හි දී ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලදී. දෙරට අතර ද්විපාර්ශවික සබඳතා ස්ථාපනය කිරීමේ 50 වැනි සංවත්සරය සැමරීමද මෙම වර්ෂයට යෙදී ඇත.

- 2012 අගෝස්තු මසදී, පෝලන්තයේ විදේශ කටයුතු සඳහා උප රාජ්‍ය ලේකම්වරයා ශ්‍රී ලංකාවට පැමිණියේය. මෙම උප රාජ්‍ය ලේකම්වරයා විදේශ කටයුතු ලේකම්වරයා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත් වූ අතර, ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපායික අධ්‍යයනය සඳහා ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය හා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ පෝලන්ත ආයතනය (PISM) අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී. චෙක් පාර්ලිමේන්තුවේ විදේශ කටයුතු කමිටුවේ සභාපතිවරයාගේ නායකත්වය යටතේ චෙක් ජනරජයේ සිව් සමාජික පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක් 2012 නොවැම්බර් හිදී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලිණි. ජර්මනියේ ආර්ථික සහයෝගීතා අමාත්‍යාංශයේ දකුණු ආසියානු අංශ ප්‍රධානී ද ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලුණු අතර, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කොට ඇති ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇගයීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා පැවැත්විය. ඊට අමතරව, විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟද සාකච්ඡා පැවත්විණි.

- සැලකිය යුතු ප්‍රමාණයක ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණයක් වෙසෙන යුරෝපා අගනගරවල පිහිටා ඇති දූත මණ්ඩල විසින්, ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත සමීප වීමට අඛණ්ඩව කටයුතු කරන ලද අතර, එල්.ටී.ටී.ඊ. යේ ශේෂව ඇති පිරිස් විසින් පතුරුවනු ලබන විකෘති කළ ප්‍රවෘත්ති නිවැරදි කිරීම සඳහා ක්‍රියා කරන ලදී.

**යුරෝපා සංගමය**

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළඳපළක් වන යුරෝපා සංගමය සමඟ ශ්‍රී ලංකාව පවත්වන සබඳතා ශක්තිමත් කිරීමෙහිලා ශ්‍රී ලංකාව විසින් පසුගිය වසර පුරා කටයුතු කරන ලදී. මීළඟ යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිෂන් සභාව 2013 වසරේදී බ්‍රසල්ස් හි දී පැවැත් වීම සඳහා අවශ්‍ය සාකච්ඡා සිදු කෙරෙමින් පවතියි.

- ශ්‍රී ලංකා - යුරෝපා සංගම් ගුවන් සේවා ගිවිසුමටද 2012 සැප්තැම්බර් හි දී අත්සන් තබන ලදී.

- නැවත භාර ගැනීම පිළිබඳ ජාතික සම්බන්ධීකාරක කමිටුව(NCCR)ස්ථාපනය කිරීම මඟින්, ශ්‍රී ලංකා - යුරෝපා සංගම් නැවත භාර ගැනීමේ ගිවිසමේ දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකා යුරෝපා ඒකාබද්ධ නැවත භාර ගැනීමේ කමිටුව කැඳවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට පහසුකම් සැලසීමට හැකි විය.

- පසුගිය වසර පුරා ශ්‍රී ලංකාව, යුරෝපා පාර්ලිමේන්තුව සමඟ අඛණ්ඩව හා සමීපව කටයුතු කළාය. යුරෝපා පාර්ලිමේන්තුවේ දකුණු ආසියානු සබඳතා සඳහා නියෝජිත කණ්ඩායමේ නියෝජිතයෝ 2012 අප්‍රේල්/ මැයි හි දී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. මෙය, 2011 වසරේ පෙබරවාරි මසදී ඔවුන් නියැලුණු සංචාරයේ පසුවිපරම් සංචාරයක් විය. ඔවුන්ගේ පළමු සංචාරයෙන් පසුව මෙරට ඇති වී තිබෙන යහපත් ප්‍රවණතා කිහිපයක් පිළිබඳව මෙම නියෝජිතයන්ගේ කෙටුම්පත් වාර්තාවේ සඳහන් කර ඇත. යුරෝපා පාර්ලිමේන්තුවේ දකුණු ආසියානු නියෝජිත කණ්ඩායම, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජිත කණ්ඩායමකට යුරෝපා පාර්ලිමේන්තුවේ සංචාරයක නියැලෙන ලෙස ආරාධනා කර තිබේ.

**පොදු රාජ්‍ය මණ්ඩලය**

2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම ශ්‍රී ලංකාවේ පැවැත්වීම හේතුවෙන්, පොදු රාජ්‍ය මණ්ඩලය සමඟ ශ්‍රී ලංකාව පවත්වන අන්තර් සබඳතා පසුගිය වසරේදී තව දුරටත් වර්ධනය විය. දියමන්ති ජුබිලි සැමරීම්වලට සහභාගීවීම සඳහා ජූනි මාසයේදී අතිගරු ජනාධිපතිතුමා එක්සත් රාජධානියේ නිරත වූ සංචාරය අතරතුරදී, පොදු රාජ්‍ය මණ්ඩලයේ මහ ලේකම්වරයා හමු විය. පොදු රාජ්‍ය මණ්ඩලයීය මහ ලේකම්වරයා ද 2012 සැප්තැම්බර් මාසයේ ශ්‍රී ලංකාවට පැමිණි අතර, 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම සඳහා සිදු කෙරෙමින් පවතින වැඩකටයුතු පිළිබඳව මෙන්ම ගැටුම්වලින් පසුව රටේ සිදු වෙමින් පවතන සංවර්ධන කටයුතු පිළිබඳව මෙහිදී සාධනීය ලෙස අදහස් දැක්විය. පොදු රාජ්‍ය මණ්ඩලය විසින් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා අරමුදල් සැපයීමට අරමුණු කරගෙන ඇති නැගෙනහිර ප්‍රදේශයේ ද මහ ලේකම්වරයා සංචාරය කළේය. මහ ලේකම්වරයාට අමතරව, පොදු රාජ්‍ය මණ්ඩලයීය ලේකම් කාර්යාලයේ නිලධාරීහු ද, 2013 ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම සඳහා සිදු කෙරෙමින් පවතින වැඩ කටයුතු පිළිබඳ තත්ත්වාකාරයෙන් දැන ගැනීමට සහ ඒ පිළිබඳව සාකච්ඡා පැවැත්වීමට 2012 අප්‍රේල් හා සැප්තැම්බර් මාසවලදී දෙවරක් ශ්‍රී ලංකාවට පැමිණියහ.

- පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම සඳහා වන කාර්යසාධන බලකා ලේකම් කාර්යාලය, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා සංකීර්ණය පිහිටි පරිශ්‍රයේදී 2012 සැප්තැම්බර් 17 වැනි දින විවෘත කරන ලද අතර, 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම සඳහා අවශ්‍ය පෙර සූදානම් කටයුතු සියල්ලම සම්බන්ධීකරණය කරනුයේ මෙම කාර්යාලය මඟින් වීම විශේෂත්වයකි.

- පොදු රාජ්‍ය මණ්ඩලයීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සිදු කරන ලද සංචාරවලින් අනතුරුව, පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික කවුන්සිලයේ නියෝජිතයෝද 2012 ඔක්තෝබර් මසදී ශ්‍රී ලංකාවට පැමිණි අතර, 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදය (CBF) සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ප්‍රමුඛතාවය ලබා දෙන කටයුතු හඳුනාගැනීම සඳහා අදාළ අමාත්‍යවරුන් සමඟ රැස්වීම් රැසක් පැවැත් වූහ. පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික කවුන්සිලයේ නියෝජිත පිරිස අතිගරු ජනාධිපතිතුමා ද බැහැ දුටු අතර ශ්‍රී ලංකාව

කලාපීය ආර්ථික හා වෙළඳ කේන්ද්‍රස්ථානයක් ලෙස යළි නගා සිටුවීම සඳහා වන වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කළ අතර එම අරමුණ සාක්ෂාත් කර ගැනීම පිළිබඳ සාකච්ඡා කළේය. ඔක්තෝම්බර් මාසයේ දී ශ්‍රී ලාංකික ව්‍යාපාරික ප්‍රජාවට හඳුන්වාදුන් පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදය පිළිබඳව මෙහිදී සාකච්ඡා කළහ. මෙම අවස්ථාවට, පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික කවුන්සිලයේ නියෝජිතයන්ට අමතරව අමාත්‍යවරු, කොළඹ සිටින රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව, රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු සහ ඉහළ පෙළේ ව්‍යාපාරිකයෝ ද සහභාගී වූහ.

- පොදු රාජ්‍ය මණ්ඩලයීය යෞවන සංසදය සඳහා අවශ්‍ය කටයුතු පිළිබඳව සාකච්ඡා පැවැත්වීම සඳහා, පොදු රාජ්‍ය මණ්ඩලයීය පදනමේ නියෝජිත පිරිසක් 2012 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණියේය.

**ආ. ඇමෙරිකා අංශය :**

ආවරණය වන රටවල් : 35

ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, කියුබාව, බ්‍රසීලය, ආර්ජන්ටිනාව, ඇන්ටිගුවා ඇන්ඩ් බාර්බියුඩා, බහමාස්, බාබඩෝස්, බෙලීස්, බොලිවියාවා, චිලී, කොලොම්බියා, කොස්ටාරිකාව, ඩොමිනිකා, ඩොමිනිකන් ජනරජය, එක්වදෝරය, එල් සැල්වදෝරය, ග්‍රෙනේඩා, ගෝතමාලා, ගයනා, හයිටි, ජැමෙයිකාව, මෙක්සිකෝව, නිකරගුවාව, පැනමාව, පැරගුවේ, පේරු, සෙන්ට් කිට්ස් ඇන්ඩ් ග්‍රෙනඩීන්ස්, සේන්ට් ලූසියා, හොන්ඩුරාස්, සුරිනාම්, ට්‍රිනිඩෑඩ් ඇන්ඩ් ටොබැගෝ, උරුගුවේ සහ වෙනිසියුලාව

නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව : 04

ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, කියුබාව, බ්‍රසීලය

සමගාමීව අක්ත ගැන්වීම :

| | |
|---|---|
| වොෂිංටන් ඩී.සී | : මෙක්සිකෝව |
| හවානා | : වෙනිසියුලාව හා ජැමෙයිකාව |
| බ්‍රසිලියා | : ආර්ජන්ටිනාව, චිලි, කොලොම්බියාව හා පේරු |

පසුගිය වසරේදී, ශ්‍රී ලංකාව, උතුරු ඇමරිකාව සමඟ ශක්තිමත් සබඳතා පවත්වන අතරවාරයේ ලතින් ඇමරිකානු රටවල් සමඟ සබඳතා ශක්තිමත් කර ගැනීමෙහිලා පියවර ගන්නා ලදී. ලතින් ඇමරිකානු කලාපයේ වර්ධනය වෙමින් පවතින ශක්තිය හේතු කොට ගෙන, කැරිබියානු සහ ලතින් ඇමරිකානු රටවල් දහතුනක් සමඟ සබඳතා ස්ථාපනය කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා තිබෙන අතර නිව්යෝර්ක් නුවර සිටින නිත්‍ය නියෝජිතවරයා හරහා මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ආරම්භ කර තිබේ. මෙම රටවල් දහතුන ගෝතමාලා, බෙලීස්, නිකරගුවාව, බාර්බඩොස්, ග්‍රෙනේනාඩා, සෙන්ට් කිට්ස් ඇන්ඩ් නවිස්, සේන්ට් වින්සන්ට් ඇන්ඩ් ද ග්‍රෙනඩීන්ස්, සුරිනාම්, හොන්ඩුරාස්, ඇන්ටිගුවා ඇන්ඩ් බාබියුඩා, ඩොමිනිකා, හයිටි සහ සෙන්ට් ලූසියාව වේ.

කියුබාව සමඟ ශ්‍රී ලංකාව පවත්වන බෙහෙවින් ශක්තිමත් වූ සබඳතා පිළිබඳව අවධාරණය කරමින් ජූනි මාසයේදී අතිගරු ජනාධිපතිතුමා එහි නිල සංචාරයක නියැලුණු අතර එහිදී කියුබානු ජනාධිපතිවරයා සමඟ සාකච්ඡා පැවැත්විය. දෙරටේ පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා කියුබාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබූහ. සෞඛ්‍යය හා කෘෂිකර්ම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කියුබානු තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා අවශ්‍ය මූලික පියවර ද ගන්නා ලදී.

අතිගරු ජනාධිපතිතුමා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවට (Rio + 20) සහභාගී වීම සඳහා රියෝ ද ජැනයිරෝ හි නියැලුණු සංචාරය අතරතුර දී, චිලී ජනාධිපතිවරයා සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්විය.

පසුගිය වසරේදී, වාණිජ මණ්ඩල අතර සහයෝගිතාව හා කෘෂිකාර්මික සහයෝගිතාව ආවරණය වන පරිදි බ්‍රසීලය සමඟ අවබෝධතා ගිවිසුම් තුනකට ශ්‍රී ලංකාව අත්සන් තැබුවාය.

පසුගිය වසරේදී ශ්‍රී ලංකාව තවදුරටත් ඇමරිකා එක්සත් ජනපදය සමඟ සමීප සබඳතා පැවැත්වූවාය. එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් මහත්මියගේ ආරාධනාවකට අනුව, 2012 මැයි මාසයේදී ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා වොෂින්ටන් ඩී.සී. හි සංචාරයක නියැලුණේය. රාජ්‍ය ලේකම්වරියට අමතරව, එක්සත් ජනපද පරිපාලන ව්‍යුහයේ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සෙනේට්සභිකයන්, කොන්ග්‍රස් සභිකයන් හා විද්වත් පිරිස සමඟද අමාත්‍යවරයා මෙහිදී සාකච්ඡා පැවැත් වූ අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීමෙහිලා මෙම සංචාරය උපකාරී විය.

සැප්තැම්බර් මස පැවති 67 වැනි එක්සත් ජාතීන්ගේ මහ සභා රැස්වීමට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය දරමින් ගරු අමාත්‍යවරයා නිව් යෝර්ක් නුවර සිදු කළ සංචාරය අතරතුරදී, කියුබා විදේශ අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වූ අතර දේශපාලන කටයුතු සඳහා උප රාජ්‍ය ලේකම්වරයාද හමු විය.

දෙරටේම රාජ්‍යතාන්ත්‍රික හා නිල විදේශ ගමන් බලපත්‍ර හිමියන් වීසා බලපත්‍රවලින් නිදහස් කිරීම පිළිබඳ ගිවිසුමකට 2012 ජූනි මාසයේදී ශ්‍රී ලංකාව හා චිලී රාජ්‍යය විසින් අත්සන් තැබිණ.

ශ්‍රී ලංකාව හා ඇමරිකා එක්සත් ජනපදය අතර පවත්වාගෙන යන බහු ආංශක සබඳතාව විදහා දක්වමින්, එක්සත් ජනපද ජ්‍යෙෂ්ඨ නිලධාරීහු කිහිප දෙනෙකු පසුගිය වසරේ මෙරට සංචාරවල නියැලුණහ. දකුණු හා මධ්‍යම ආසියා කටයුතු සඳහා නියෝජ්‍ය සහකාර රාජ්‍ය ලේකම් ජනවාරි මාසයේත්, රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ගෝලීය අපරාධ පිළිබඳ යුක්තිය පසිඳලීමේ කාර්යාලය සඳහා තානාපතිවරයා පෙබරවාරි මාසයේත්, භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සහකාර ලේකම්වරයා පෙබරවාරි මාසයේදීත්, පුරවැසි ආරක්ෂාව, ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් පිළිබඳ උප රාජ්‍ය ලේකම්වරයා පෙබරවාරි මාසයේදීත්, (USAID) හි ආසියාවේ පරිපාලනය සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සහකාර මාර්තු මාසයේදීත්, දකුණු ආසියාව සඳහා සහකාර වෙළඳ නියෝජිතවරයා මාර්තු/ අප්‍රේල් මාසවලදී සහ ජූනි මාසයේදීත්, ජාතික ආරක්ෂක කවුන්සිලයේ අධිකරණ

දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරිවරයෙක් ජුනි/ ජුලි මාසවලදීත්, විදේශ කටයුතු පිළිබඳ නියෝජිත මන්ත්‍රී මණ්ඩල කමිටුවේ කාර්යය මණ්ඩල සාමාජිකයින් අගෝස්තු මාසයේදීත්, දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු සඳහා සහකාර ලේකම්වරයා සැප්තැම්බර් මාසයේදීත්, රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ජනගහන සරණාගත හා සංක්‍රමණික කාර්යාලයේ කලාපීය සරණාගත සම්බන්ධීකාරකවරයා ඔක්තෝම්බර් මාසයේදීත්, දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු සඳහා එක්සත් ජනපද නියෝජිත සහකාර ලේකම්වරයා සහ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු සඳහා එක්සත් ජනපද නියෝජ්‍ය සහකාර ලේකම්වරයා, සහ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂවරයා නොවැම්බර් මාසයේදීත් ශ්‍රී ලංකාවට පැමිණ තිබේ.

කැනඩාවේ පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායම 2012 මාර්තු මසදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

**ස්වාධීන රාජ්‍යත්ගේ පොදු මඩුල්ල:**

ආවරණය වන රටවල් : 12 ආර්මේනියාව, ඇසර්බයිජාන්, බෙලාරස්, ජෝර්ජියාව, කසකස්තානය, කිර්ගිස්තානය, මෝල්ටාව, රුසියාව, ටැජිකිස්තානය, ටර්ක්මෙනිස්තානය, යුක්රේනය, උස්බෙකිස්තානය.

නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව : 01 රුසියාව

සමගාමීව අක්ත ගන්වන ලද රටවල් සංඛ්‍යාව :

මොස්කව් : ආර්මේනියාව, කසකස්තානය, කිර්ගස්තානය, මෝල්ටාව, ටැජිකිස්තානය, යුක්රේනය හා උස්බෙකිස්තානය.

ටෙහෙරානය: ඇසර්බයිජාන්, ටර්ක්මෙනිස්තානය

අන්කාරා: ජෝර්ජියාව

දේශපාලන කටයුතු/ ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුළු අංශය, රුසියානු සමූහාණ්ඩුව සහ ස්වාධීන රාජ්‍යත්ගේ පොදු මණ්ඩලයට අයත් රටවල් මෙන්ම ජෝර්ජියා ජනරජය සමග ශ්‍රී ලංකාව පවත්වන සබඳතාවලට අදාළ වන කටයුතු ආවරණය කරයි. රුසියාව සමග අප පවත්වන සමීප හා සුහදශීලී සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ අවධානය යොමු කර තිබෙන අතරවාරයේ ස්වාධීන රාජ්‍යත්ගේ පොදු මඩුල්ලට අයත් වෙනත් රටවල් සමග සහ ජෝජියාව සමග ශ්‍රී ලංකාව පවත්වන සබඳතා ශක්තිමත් කිරීමේ අපේක්ෂාවෙන් පසුවෙයි.

**රුසියානු සමූහාණ්ඩුව**

ශ්‍රී ලංකාව, 2012 වසරේදී රුසියානු සමූහාණ්ඩුව සමග ශ්‍රී ලංකාව පවත්වන ද්විපාර්ශ්වික සබඳතා තව දුරටත් ශක්තිමත් කළාය. මෙම වසරේදී, දෙරට අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කර වසර 55ක් සපිරෙයි.

2012 මැයි මසදී විදේශ කටයුතු අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා රුසියානු සමූහාණ්ඩුවේ නිරත වූ නිල සංචාරය මෙම වසරේ සිදු වූ වැදගත් සිද්ධියකි. මෙම සංචාරය අතරවාරයේ, රුසියානු සමූහාණ්ඩුවේ විදේශ කටයුතු අමාත්‍ය සර්ජෙයි ලැව්රෝ මහතා සමඟ සහ රුසියානු රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සමඟ කරුණ රැසක් සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන ලදී.

රුසියානු සමූහාණ්ඩුවේ මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍ය පිළිබඳ කොමසාරිස් හා විදේශ කටයුතු අමාත්‍යාශයේ විශේෂ කාර්යභාර තානාපති, කොන්ස්ටන්ටින් ඩොල්ගව් මහතාගේ නායකත්වයෙන් යුත් නියෝජිත කණ්ඩායමක් ගැටුම්වලින් පස අවධියේ ගැටළුවලට විසඳුම් ලබා දීමේදී විශේෂයෙන් ජිනීවා හිදී මානව හිමිකම් සභාවේදී 2012 නොවැම්බර් හිදී සිදු වූ විශ්වවාර සමාලෝචන ක්‍රියාවලිය සැලකිල්ලට ගැනීමේදී අත්කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව කරුණු පැහැදිලි කර ගැනීමේ අරමුණින් සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැළිණි.

මෙම වර්ෂයේ ජුනි මසදී, රුසියාව සමූහාණ්ඩුවේ ෆෙඩරල් සංක්‍රමණික සේවා දෙපාර්තමේන්තුවේ නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණි අතර එහිදී දෙරට අතර නැවත භාර ගැනීම පිළිබඳ ගිවිසුම් කෙටුම්පත සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවලට සහභාගි විය.

**කසකස්තානය**

ශ්‍රී ලංකාව හා කසකස්තානය අතර ද්විපාර්ශ්වික සබඳතා තව දුරටත් ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් 2012 වසරේද සුවිශේෂ වර්ධනයක් පෙන්නුම් කරයි.  කසකස්තානයේ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ආරාධනයෙන්, විදේශ කටයුතු අමාත්‍ය ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා කසකස්ථානයේ සංචාරයක නියැළිණි.  ශ්‍රී ලාංකික විදේශ අමාත්‍යවරයකු කසකස්තානයේ නිල සංචාරයක නියැලුණු පළමු අවස්ථාව මෙය විය. මෙහිදී කරුණු රැසක් සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික සාකච්ජා පවත්වන ලද අතර ගරු මහාචාර්ය පීරිස් මහතා කසකස්ථානයේ අග්‍රාමාත්‍යවරයාද බැහැ දුටුවේය. මෙම සංචාරය අතරතුරදී, දෙරටේ විදේශ අමාත්‍යවරුන් අතර වාර්ෂික ද්විපාර්ශ්වික උපදේශන පැවැත්වීම පිළිබඳ අවබෝධතා ගිවිසුමකට ද අත්සන් තැබිණි.

2012 සැප්තැම්බර් මස දි, පාර්ලිමේන්තු මන්ත්‍රී, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු නියෝමාල් පෙරේරා මහතා ආසියාවේ අන්තර් ක්‍රියාකාරිත්වය සහ විශ්වාසය ගොඩනැගීමේ පියවර ( ICA) පිළිබඳ සමුළුවට සහභාගි වීම සඳහා කසකස්තානයේ සංචාරයක නියැළිණි. තුර්කි හා කසකස්තාන විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ ආරාධනයෙන් "විශේෂ අමුත්තකු" ලෙස මෙම සමුළුවට ශ්‍රී ලංකාවසහභාගී වූ ප්‍රථම අවස්ථාව මෙය විය.

ශ්‍රී ලංකාවේ සහ කසකස්තානයේ විදේශ අමාත්‍යාංශ අතර වාර්ෂික ද්විපාර්ශ්වික උපදේශනවල ප්‍රථම වටය, 2012 ඔක්තෝබර් මස කොළඹ දී පැවැත්විණ. කසකස්තාන විදේශ කටයුතු අමාත්‍යංශයේ ආසියා හා අප්‍රිකා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අයිඩර්බෙක් තුමානොව් මහතා කසකස්තාන කණ්ඩායමේ නායකත්වය දැරූ අතර, විදේශ කටයුතු ලේකම්වරයා විසින් ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය දරන ලදී.

කසකස්තාන ජනාධිපතිවරයා විසින් කරන ලද ආරාධනයකට අනුව, ගරු ජනාධිපතිතුමා 2012 නොවැම්බර් මස කසකස්තානයේ සංචාරයක නිරත වූ අතර එහිදී කසකස්තාන ජනාධිපතිවරයා සමඟ ද්විපාර්ශ්වික සාකච්ජා පැවැත්විය. දෙරට අතර සංචාරක සහයෝගිතාවය පිළිබඳ ගිවිසුමකටද මෙම සංචාරය අතරතුරදී අත්සන් තැබිණ.

**යුක්රේනය**

සමාලෝචනයට බඳුන් කෙරෙන කාල සීමාව ඇතුළත, ශ්‍රී ලංකාව විසින් යුක්රේනය සමඟ සබඳතා අඛණ්ඩව ශක්තිමත් කර ගන්නා ලදී.

2012 අප්‍රේල් හි දී, ද්විත්ව බදුකරණය වැළැක්වීම පිළිබඳ යෝජිත ගිවිසුම පිළිබඳ උපදේශන සඳහා යුක්රේන මුදල් අමාත්‍යංශයේ නියෝජිත කණ්ඩායමක් කොළඹ සංචාරයක නිරත වූ අතර, මෙම වර්ෂයේ මැයි මාසයේදී වෙළඳ සහ ආර්ථික සහයෝගීතාවය පිළිබඳ ඒකාබද්ධ අන්තර් - ආණ්ඩු ගිවිසුම ස්ථාපනය කිරීම පිළිබඳ කෙටුම්පත් ගිවිසුම සහ ආයෝජන ප්‍රවර්ධනය හා සුරක්ෂා කිරීම පිළිබඳ කෙටම්පත් ගිවිසුම පිළිබඳ සාකච්ඡාසඳහා යුක්රේනයේ ආර්ථික සංවර්ධන හා වෙළඳ අමාත්‍යංශයේ නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

**ජෝර්ජියාව**

ජෝර්ජියා ජනරජය විසින් සිදු කරන ලද ඉල්ලීම සලකා බලා, ශ්‍රී ලංකාව සිය සමගාමී අක්ත ගැන්වීම තුර්කියේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත මාරු කළේය.

**ස්වාධීන රාජ්‍යන්ගේ පොදු මඩුල්ලට අයත් රටවල් සමඟ සබඳතා**

ස්වාධීන රාජ්‍යන්ගේ පොදු මඩුළු කලාපයට අයත් අනෙකුත් සියලුම සාමාජික රටවල් සමඟ ශ්‍රී ලංකාව මිත්‍රශීලී සබඳතා පවත්වා ගෙන යයි.

# එක්සත් ජාතීන්ගේ, බහු පාර්ශ්වීය කටයුතු, මානව හිමිකම් සහ සමුළු අංශය

## <u>එක්සත් ජාතීන්ගේ, බහු පාර්ශ්වීය කටයුතු, මානව හිමිකම් සහ සමුළු අංශය</u>

### <u>එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීම</u>

විදේශ කටයුතු අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමේ 67 වැනි සැසිවාරයේ ප්‍රධාන විවාදයට සහභාගී වූ ශ්‍රී ලංකා රජයේ නියෝජිත කණ්ඩායමේ නායකත්වය දැරීය. ගරු අමාත්‍යවරයා මහා මණ්ඩල රැස්වීම ඇමතූ අතර, රටවල් 19ක විදේශ අමාත්‍යවරු සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් ද පැවැත්විය.

### <u>මානව හිමිකම් කවුන්සිලය</u>

2012 මාර්තු, ජූනි හා සැප්තැම්බර් මාසවලදී පවත්වන ලද මානව හිමිකම් කවුන්සිල සැසිවාර සඳහා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සහභාගීත්වය සම්බන්ධයෙන් කටයුතු සම්බන්ධීකරණය කරන ලද්දේ එක්සත් ජාතීන්ගේ අංශය මඟිනි. ශ්‍රී ලංකාව වෙත සහාය ඉල්ලා සිටීම සඳහා, 19 වන සැසිවාරයට පෙර, අප්‍රිකාවේ, මැද පෙරදිග සහ ලතින් ඇමරිකාවේ පිහිටි මානව හිමිකම් කවුන්සිලයෙසාමාජික රටවල් වෙත අමාත්‍ය මට්ටමෙන් සිදු කරන ලද සංචාර කිහිපයක් සම්බන්ධයෙන්ද අංශය විසින් කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

### <u>විශ්වවාර සමාලෝචනය</u>

විශ්වවාර සමාලෝචන ක්‍රියාවලියේ දෙවැනි වටය යටතේ, ශ්‍රී ලංකාව 2012 නොවැම්බර් 01 වැනි දින සමාලෝචනයට ලක්විය. රටේ මානව හිමිකම් හා සම්බන්ධ විවිධ පැතිකඩ පිළිබඳව සමස්ත චිත්‍රයක් ශ්‍රී ලංකාව එහිදී ඉදිරිපත් කළ අතර, ක්‍රියාත්මක කර තිබෙන 2008 දී පිළිගත් නිර්දේශ සම්බන්ධයෙන් අත් කර ගෙන ඇති ප්‍රගතිය පිළිබඳව කරුණු දැක්විය. අතිගරු ජනාධිපතිතුමාගේ මානව හිමිකම් පිළිබඳ විශේෂ නියෝජිත ගරු මහින්ද සමරසිංහ මහතා මීට සහභාගී වූ නියෝජිත කණ්ඩායමේ නායකත්වය දැරූ අතර, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ, අධිකරණ අමාත්‍යාංශයේසහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයන් එම නියෝජිත කණ්ඩායමට ඇතුළත් වූහ.

### <u>එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල යෝජනාවලිය</u>

එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින් ළමුන් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ වූ 1612 වැනි එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල යෝජනාවලියේ II ඇමුණුමෙන් ශ්‍රී ලංකාව ඉවත් කරනු ලැබීම සඳහා සහාය ඉල්ලා සිටීම මඟින් එය සාර්ථකව ඉටු කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකිවිය. මෙය, ළමුන් සේවයට බඳවා ගැනීම පිළිබඳ සිද්ධීන් කිහිපයක් විමර්ශනය කිරීමට සහ ළමුන් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ ආරක්ෂක කවුන්සිලයේ නිර්දේශ සහ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාගේ විශේෂ නියෝජිතවරයාගේ නිර්දේශවලට අනුකූලව කටයුතු කිරීමට යළි යළිත් යෙදූ ප්‍රයත්නවල ප්‍රතිඵලයකි.

### <u>සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය</u>

සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය යටතේ, ශ්‍රී ලංකාව පිළිබඳ 5 වන වාර වාර්තාව සම්බන්ධයෙන් වන පාර්ශ්වකාරීත්වය රැස්වීම්, අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද අතර, එම වාර්තාව ශ්‍රී ලංකාව පිළිබඳ විශ්වවාර සමාලෝචනයට පෙර, 2012 ඔක්තෝබර් මස මානව හිමිකම් කවුන්සිලය වෙත භාර දෙන ලදී. කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභාව (CSW) වෙතින් කාන්තාවන්ගේ මානව හිමිකම් පිළිබඳ 2011 දෙසැම්බර් මසදී ලැබුණු රහස්‍ය තොරතුරු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිචාරය මෙම අංශය විසින් ගොනු කරන ලදී.

බලහත්කාරයෙන් හෝ ස්ව කැමැත්තකින් තොරව අතුරුදහන් කිරීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGEID)

බලහත්කාරයෙන් හෝ සිය කැමැත්තකින් තොරව අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම විසින් ශ්‍රී ලංකා රජයේ අවධානයට යොමු කරවන ලද, සිදු වූවා යැයි කියන අතුරුදහන් වීමේ සිද්ධීන් 59 පිළිබඳ ප්‍රතිචාරය, අදාළ පාර්ශ්වකරුවන්ගේ උපදෙස් විමසීමෙන් අනතුරුව අංශය විසින් සකස් කොට ඉදිරිපත් කරන ලදී. සිදු වූවා යැයි කියන 100 ට අධික අතුරුදහන් වීමේ සිද්ධීන්වල විමර්ශන සම්බන්ධයෙන් අත් කර ගෙන ඇති ප්‍රගතිය පිළිබඳව, ශ්‍රී ලංකාව පිළිබඳ විශ්වවාර සමාලෝචනට පෙර, 2012 ඔක්තෝබර් 24 වැනි දින ක්‍රියාකාරී කණ්ඩායමට කරුණු ඉදිරිපත් කරන ලදී. මෙම ක්‍රියාකාරී කණ්ඩායම විසින් ශ්‍රී ලංකා රජයේ අවධානයට යොමු කරවන ලද සිදුවූවා යැයි පැවසෙන අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා, එක්සත් ජාතීන්ගේ අංශය අදාළ රේඛීය නියෝජිතායතන/ අමාත්‍යාංශ සමඟ අඛණ්ඩව එක්ව කටයුතු කරයි.

මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරයාගේ කාර්යාලයෙ නිලධාරීන්ගේ සංචාරය

ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදෙන ලෙස මානව හිමිකම් මහ කොමසාරිස්වරිය වෙත ශ්‍රී ලංකා රජය විසින් 2011 අප්‍රේල් මස ආරාධනයක් කර ඇති අතර, එතුමියගේ සංචාරයට පූර්වගාමී, මානව හිමිකම් පිළබඳ මහකොමසාරිස් කාර්යාලයේ ආසියා පැසිෆික්, මැද පෙරදිග සහ උතුරු ඇමෙරිකා ශාඛාවේ ප්‍රධානී හැනී මෙගාලි මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු එම කාර්යාලයේ නියෝජිත කණ්ඩායමක් 2012 සැප්තැම්බර් 14 - 21 දිනවලදී මෙරට සංචාරයක නිරත විය. මෙම නියෝජිත කණ්ඩායම් සඳහා පූර්ණ වැඩසටහනක් සකස් කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද්දේ අංශය විසිනි.

නිව් යෝර්ක් හි පිහිටි දේශපාලනික කටයුතු පිළිබඳ එක්සත් ජාතීන්ගේ දෙපාර්තමේන්තුවේ කණ්ඩායමක් විසින් මෙරට සිදු කරන ලද සංචාරය

දේශපාලන කටයුතු පිළිබඳ එක්සත් ජාතීන්ගේ දෙපාර්තමේන්තුවේ ආසියා හා පැසපික් අංශයේ ප්‍රධානී හිතොකි ඩෙන් මහතා සහ ආසියා හා පැසිෆික් අංශයේ දේශපාලන කටයුතු නිලධාරී ජුන්ග් හ්වාන් ලී මහතා, 2012 දෙසැම්බර් මස ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙපළ සංවර්ධන කටයුතු සිදු කෙරෙන උතුරු පළාතේ සංචාරය කළ අතර, යුද්ධයෙන් පසු නැවත ගොඩ නැගීමේ කටයුතු සම්බන්ධයෙන් ලබා ගෙන ඇති ප්‍රගතිය ඇගයීම සඳහා අදාළ නිලධාරීන් ද හමුවිය.

නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය

2012 අගෝස්තු 30 - 31 දිනවල ඉරානයේ ටෙහෙරාන් නුවර පැවති 16 වැනි නොබැඳි සමුළුව සහ ඊට පෙරාතුව 2012 අගෝස්තු 28 සහ 29 දිනවලදී පැවති අමාත්‍ය මට්ටමේ රුස්වීම සඳහා ශ්‍රී ලංකා රජයේ සහභාගීත්වය පිළිබඳ කටයුතු, එක්සත් ජාතීන්ගේ අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් දරන ලද අතර, ජනාධිපතිතුමා මෙම සමුළුවට සමගාමීව රාජ්‍ය නායකයන් 5 දෙනෙකු සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්විය. ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, 2012 මැයි මස ඊජිප්තුවේ ශාම් - එල් - ෂෙයික් හි පැවති නොබැඳ ජාතීන්ගේ අමාත්‍ය මට්ටමේ රුස්වීමට සහභාගී වූ අතර, ද්විපාර්ශ්වික සාකච්ඡා 4ක් පැවැත්විය.

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (රියෝ +20)

2012 වසරේ ජූනි මසදී පැවැත් වූ තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයට (රියෝ +20) සහභාගී වූ නියෝජිත කණ්ඩායමේ නායකත්වය අතිගරු ජනාධිපතිතුමා විසින් දරන ලද අතර, ජනාධිපතිතුමා මෙහිදී වෙනත් රටවල රාජ්‍ය නායකයන් 7 දෙනෙකු සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්වීය. රියෝ +20 සම්මේලනය අවසානයේදී "අපට අවශ්‍ය අනාගතය" යන මැයෙන් සම්මේලනයේ ප්‍රතිඵල දැක්වෙන ලියවිල්ලක් නිකුත් කෙරුණු අතර, තිරසාර සංවර්ධනය පිළිබඳ අනාගත සැලැස්ම තීරණය කර ගැනීම සඳහා එම ලේඛනය මඟින් මනා පදනමක් දැමිණ. මෙම වසරේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමට අනතුරුව, මේ සම්බන්ධයෙන් ක්‍රියාවලි කිහිපයක් ආරම්භ කෙරෙනු ඇත.

දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ (UNCAC) සමාලෝචන ක්‍රියාවලිය

දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් ක්‍රියාත්මක කෙරෙන බව තහවුරු කිරීමට ශ්‍ර ලංකාව අඛණ්ඩව අවශ්‍ය පියවර ගනිමින් සිටියි. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම්වලට අනුකූලව, මෙම සම්මුතිය සහ දූෂණය හා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින නීති අතර විෂමතා හඳුනා ගැනම සඳහා "විෂමතා විශ්ලේෂණයක්"සිදු කිරීමට අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් කටයුතු ආරම්භ කරන ලදී.

මෙම අංශය විසින් සමාලෝචන ක්‍රියාවලියට අදාළ කටයුතු සම්බන්ධීකරණය කරන ලද අතර සමාලෝචනය කරන පාර්ශ්ව රාජ්‍ය සමඟ 2012 වසරේදී අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේදී පවත්වන ලද වීඩියෝ සම්මන්ත්‍රණවලටද සහභාගී වන ලදී.

දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ නෛතික රාමු සම්මුතියේ පාර්ශ්වවල 18 වැනි සමුළුව සහ කියෝටෝ සන්ධානයේ පාර්ශ්වවල 8 වැනි රැස්වීම

දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ නෛතික (UNFCCC) පාර්ශවවල 18 වැනි සැසිවාරය (COP18) සහ කියෝටෝ සන්ධානයේ පාර්ශ්වවල රැස්වීම ලෙස සලකන පාර්ශ්වවල සමුළුවේ අට වැනි සැසිවාරය (CMP8) 2012 නොවැම්බර් 26 සිට දෙසැම්බර් 08 දක්වා කාලයේදී දෝහා හි දී පවත්වන ලදී. මෙම අංශය විසින් ඉහත සමුළුව සඳහා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සහභාගීත්වය සම්බන්ධයෙන් වූ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ වෙනත් බහු පාර්ශ්වික නියෝජන

පරිසරය සහ සෞඛ්‍යය හා සම්බන්ධ එක්සත් ජාතීන්ගේ සමුළු සඳහා සහභාගී වන නියෝජිත කණ්ඩායම් මෙම අංශය විසින් නියෝජනය කර තිබෙන අතර, ගෝලීය ප්‍රවණතා සැලකිල්ලට ගනිමින, ප්‍රධාන ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරය සැකසීමෙහිලා මෙම අංශය, ජාතික කේන්ද්‍රස්ථානවලට සහාය ලබා දෙමින් සිටියි.

විවිධ වූ ජාත්‍යන්තර රැස්වීම්, සමුළු, වැඩමුළු නියෝජනය කරමින්, වෙනත් අමාත්‍යාංශ හා කේන්ද්‍රස්ථානවලින් සිදු කරන සහභාගී වීම් සඳහා මෙම අංශය විසින් අවශ්‍ය පහසුකම් සලසා ඇත. මේ සම්බන්ධයෙන් පසුගිය වසරේදී මෙම අංශය එම නියෝජිතයන් වෙත අක්ත පත්‍ර ලිපි 38ක් නිකුත් කර තිබේ.

එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනවලට තේරී පත්වීම

එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සඳහා තෝරා පත් කර ගැනීම් සම්බන්ධයෙන් මෙම අංශය පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල නියැළී සිටියි.

- එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවල පැවැත්වෙන ඡන්ද විමසීම් සම්බන්ධයෙන් දූත මණ්ඩල වෙත උපදෙස් ලබා දීම
- එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ පැවැත්වෙන ඡන්ද විමසීම්/ පවතින තනතුරු සම්බන්ධ තීරණ ගැනීමේදී අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සමග අඛණ්ඩව සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම
- එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සඳහා තෝරා පත් කර ගැනීම්වලදී ශ්‍රී ලංකාව ඡන්දය ප්‍රකාශ කරන ස්වරූපය පිළිබඳව දත්ත පාදකයක් පවත්වාගෙන යාම

සමුළු සහ වීසා බලපත්

සමාලෝචනයට බඳුන් කරන කාලය තුළදී, ශ්‍රී ලංකාවේ පැවැත්වෙන විවිධ ජාත්‍යන්තර සමුළු සහ රැස්වීම් සඳහා විදේශීය ජාතිකයන්ට ශ්‍රී ලංකාවට පැමිණීමට වීසා බලපත් 1800ක් සැකසීමෙහිලා මෙම අංශය සහාය ලබා දී තිබේ. මෙම අංශය, ශ්‍රී ලංකාවේ ඇති එක්සත් ජාතීන්ගේ දූත මණ්ඩල සඳහා පත් කර ඇති විදේශීය කාර්ය මණ්ඩලය සඳහා වීසා බලපත් ලබා ගැනීමට නිරීක්ෂණ/ අනුමැතිය ලබා දී තිබේ.

එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන/ වෙනත් ජාත්‍යන්තර සංවිධානසහ දූත මණ්ඩල සමග සැලකිය යුතු ප්‍රමාණයකින් සම්බන්ධීකරණ කටයුතු කරමින් ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් සිදු කරනු ලබන වීසා බලපත් නිකුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කිරීම, මෙම අංශයෙ දෛනික රාජකාරි අතර වෙයි.

රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති රාජ්‍ය නොවන අංශය සඳහා මධ්‍යස්ථානයෙන් හා රාජ්‍ය නොවන සංවිධානවල ජාතික ලේකම් කාර්යාලයෙන්, රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත් මෙම අංශය වෙත ලැබී තිබේ.

අදාළ රාජ්‍ය නොවන සංවිධානයට විදේශීය අරමුදල් ලැබේ නම්, ශ්‍රී ලංකාවේදී රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම හා අදාළ වන කරුණු පිළිබඳව මෙම අංශය නිරීක්ෂණ ලබා දෙයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පවතින පුරප්පාඩු

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පවතින විවිධ පුරප්පාඩු සම්බන්ධයෙන් තොරතුරු ලද විට, මෙම අංශය එම තොරතුරු අදාළ රේඛීය අමාත්‍යාංශවලට හා ආයතනවලට යොමු කරයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දායක මුදල්

එක්සත් ජාතීන්ගේ අදාළ නියෝජිතායතන/ ආයතන වෙත ගෙවිය යුතු වන ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සහ අනිවාර්ය දායක මුදල්/ ගෙවීම් හා සම්බන්ධයෙන් මෙම අංශය, අදාළ රජයේ අමාත්‍යාංශ සහ ආයතන සමග කටයුතු සම්බන්ධීකරණය කරයි.

# ආර්ථික කටයුතු අංශය

## ආර්ථික කටයුතු අංශය

- ආර්ථික කටයුතු අංශයට, ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික ආර්ථික සහයෝගීතාව හා සම්බන්ධ කාර්ය කටයුතු පැවරී තිබේ. මෙම අංශය, දැයට කිරුළ ප්‍රදර්ශනය, වෙළඳ ප්‍රදර්ශන, සමුළු වැනි ජාතික හා ජාත්‍යන්තර අවස්ථා සහ 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදය සංවිධානයෙහිලා පහසුකම් සලසයි.

- ද්විපාර්ශ්වික ආර්ථික සහයෝගීතාව යටතේ, වෙනත් රටවල් සමඟ පවත්වන සාකච්ඡා, වෙනත් රටවල් සමඟ ආර්ථික කටයුතු හා සම්බන්ධ අවබෝධතා ගිවිසුම් හා ගිවිසුම්වලට එළඹීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පහසුකම් මෙම අංශය විසින් සලසා දෙනු ලබයි. මෙම දිනවල, හන්ගේරියාව, පෝලන්තය, කසකස්තානය හා සෞදි අරාබිය වැනි රටවල් සමඟ එළඹීමට නියමිත අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් සම්බන්ධයෙන් සාකච්ඡා සම්බන්ධීකරණය කිරීමෙහි මෙම අංශය නියුක්තව සිටියි.

- බහු පාර්ශ්වීය ආර්ථික සහයෝගීතාව යටතේ, ලෝක බුද්ධිමය දේපළ පිළිබඳ සංවිධානය (WIPO), 15 කණ්ඩායම (G – 15), ආසියානු සහයෝගීතා සංවිධානය (ACD), ආසියාව හා පැසිෆික් සඳහා ආර්ථික හා සමාජයීය කොමිෂන් සභාව (ESCAP), කොළඹ ක්‍රමය, කලාපීය සහයෝගීතාව සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමය (IOR – ARC), ඉන්දියානු සාගර ටූනා මත්ස්‍යයින් පිළිබඳ කොමිෂන් සභාව(IOTC), බහු පාර්ශවීය තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය (BIMSTEC), 11 කණ්ඩායම (G – 11), ලෝක වෙළඳ සංවිධානය (WTO), වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සහයෝගීතාව(UMCTAD), 77 - කණ්ඩායම (G – 77), සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO), වැනි සංවිධාන කිපයක් සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සහභාගීත්වය සඳහා හා ගෝලීය වශයෙන් හා කලාපීය වශයෙන් වඩා හොඳ නියෝජනයක් සිදු කිරීම සඳහා දායකත්වය ලබා දීමට මෙම අංශය පහසුකම් සලසමින් සිටියි.

- ආර්ථික කටයුතු අංශය, ආර්ථික ආරක්ෂාව පිළිබඳ ගැටලු සඳහා ද විසඳුම් ලබා දෙයි. මෙම ගැටලු අතරින් ප්‍රමුඛතාව ලබා දෙන ගැටලුවක් වනුයේ සංක්‍රමණය හා සංවර්ධනයයි. ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 8%ක් වන විදේශ විනිමයෙන් 1/3 ක් උපයා දෙමින් ජාතික ආර්ථිකයට දායකත්වය ලබා දෙයි.

- ආර්ථික කටයුතු අංශය, ජාත්‍යාන්තර, කලාපීය හා ජාතික මට්ටම්වලදී බුද්ධිමය දේපළ අයිතිවාසිකම් (IPR), ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අභිලාෂයන් සුරක්ෂා කිරීම සඳහා හා ප්‍රවර්ධනය කිරීම සඳහා දායකත්වය ලබා දෙයි. වෙනත් කරුණු අතර කතෘ හිමිකම්, වෙළඳ සලකුණු, පේටන්ට් බලපත්‍ර, භූගෝලීය දර්ශක, සංවර්ධනය, ජාන සම්පත්, පාරම්පරික දැනුම, පාරම්පරික සංස්කෘතික අදහස් හා සම්බන්ධ බුද්ධිමය දේපළ හිමිකම්වලට අදාළ ක්ෂේත්‍රවල විශේෂඥවරුන්ගේ සහභාගීත්වය සහතික කරලනු වස්, මෙම අංශය ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය හා රේඛීය අමාත්‍යාංශ කිහිපයක් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි. මෙම කටයුතු මගින්, ශ්‍රී ලංකාවේ අභිලාෂයන් සුරක්ෂිත කිරීමෙහිලා දායකත්වය ලබා දී ඇති අතර, අදාළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සැකසීමේ මූලික කටයුතු සඳහා දායකත්වය ලබා දී තිබේ. ශ්‍රී ලංකාවේ අභිලාෂයන් සම්බන්ධයෙන් ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ අවධානය

යොමු කරවා ගැනීම හා සම්බන්ධයෙන් ජිනීවා හි පිහිටි ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලයට සහාය ලබා දීමද මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

- බහු ආංශික, තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය (BIMSTEC) ශ්‍රී ලංකාව ඇතුළු රටවල් හතකින් සමන්විත ජාත්‍යන්තර සංවිධානයක් වන අතර මෙය සාමාජික රටවල් අතර තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාව වැඩි දියුණු කිරීම සඳහා ඇති කර ගත්තකි. මෙම සංවිධානයේ කාර්ය කටයුතු ශක්තිමත් කර ගැනීම සඳහා, මෙම වසරේ බංග්ලාදේශයේ ඩකා නුවර පවත්වන ලද මෙහි නිත්‍ය ලේකම් කාර්යාලයක් ස්ථාපනය කිරීම පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ රුස්වීමට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සඳහා මෙම අංශය පහසුකම් සැලසීය. තවද, 2012 වසරේදී බැංකොක් හීදී පවත්වන ලද බිම්ස්ටෙක් ක්‍රියාකාරී කණ්ඩායමේ (BWG) රුස්වීම සඳහා ආසියානු සංවර්ධන බැංකව පිළියෙල කළ ප්‍රවාහන යටිතල පහසුකම් සහ සැපයුම් සේවා සම්බන්ධයෙන් කළ අධ්‍යයනය පිළිබඳ තාක්ෂණික සහාය ව්‍යාපෘතිය හා සම්බන්ධ වාර්තාව සඳහා එකඟතාව ලබා ගැනීමට මෙම අංශය විසින් අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. මෙම තාක්ෂණික සහාය ව්‍යාපෘතිය බිම්ස්ටෙක් ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරීත්වයට සහ මෙහෙයුම් කටයුතුවලට මහත් ශක්තියක් ගෙන දෙනු ඇත.

- කලාපීය සහයෝගිතාව සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමය (IOR – ARC) ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල කලාපීය සංවිධානයකි. ඉන්දියාවේ ගුරාගොන්හි 2012 නොවැම්බරයේ පවත්වන ලද, ඉන්දියානු සාගර වටද්දර රටවල කලාපීය සහයෝගිතා සංගමයේ 2 වැනි අමාත්‍ය මණ්ඩල රුස්වීම සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සම්බන්ධයෙන් මෙම අංශය පහසුකම් සැලසීය. මෙම රුස්වීමට සහභාගි වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ ප්‍රධානත්වය දැරූ විදේශ කටයුතු අමාත්‍ය ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා, කලාපයේ ජනතාවගේ යහපත තකා විශේෂ ව්‍යාපෘති සකසන ලෙස මෙම සංවිධානයෙන් ඉල්ලා සිටියේය. ඉහත රුස්වීමේදී මෙම සංගමයේ විසි වැනි සාමාජිකයා ලෙස යූනියන් ඔෆ් කොමොරොස් මෙහි සාමාජිකත්වය ලබා ගත් අතර, එක්සත් ජනපදය සංවාද පාර්ශ්වකරුවකු ලෙස එයට එක් විය. මෙම සංගමය වෙනත් රටවල සිදු කරන ව්‍යාපෘති කීපයක් සඳහා සහභාගිත්වයද මෙම අංශය තහවුරු කළේය.

- කොළඹ ක්‍රමය, පැරණිතම කලාපීය අන්තර් ආණ්ඩු සංවිධානවලින් එකක් වන අතර, එහි ලේකම් කාර්යාලය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේය. කලාපීය රටවල ආර්ථික හා සමාජයීය සංවර්ධනය සීඝ්‍ර කිරීම උදෙසා මෙම කොළඹ ක්‍රමය ස්ථාපිත කිරීම පිළිබඳ අදහස 1950 ජනවාරි මස කොළඹදී පැවති පොදු රාජ්‍ය මණ්ඩලයීය විදේශ අමාත්‍යවරයන්ගේ සමුළුවේ දී මුලින්ම ඉදිරිපත් වූ අතර, ශ්‍රී ලංකාවේ කොළඹ ක්‍රමයේ මුල් සාමාජික රටවල් හතෙන් එකකි. මෙම කොළඹ ක්‍රමය මඟින්, සංවර්ධනය වෙමින් පවතින රටවල රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිලධාරින්ට පුහුණු වැඩසටහන් හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පිරිනමනු ලබයි. 2012 වසරේ ඔක්තෝබරයේ ඉන්දුනීසියාවේ පැවති කොළඹ ක්‍රමයේ උපදේශන කමිටු රුස්වීම සඳහා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සහභාගීත්වය වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සලසන ලද්දේ ද මෙම අංශය විසිනි. සාමාජික රටවල් කිහිපයක් මෙම සංවිධානයට අඛණ්ඩ සහාය ලබා දීමට ප්‍රතිඥා ලබා දී තිබේ.

- 8 - කණ්ඩායමේ (G – 8) අදහස් හා මතවලට සාමූහිකව ප්‍රතිචාර දැක්වීම සඳහා ආරම්භ කරන ලද 15 කණ්ඩායම (G – 15) සාමාජිකයන් 18 දෙනෙකුගෙන් සමන්විත වන සංවර්ධනය වෙමින් පවත්නා රටවල සංවිධානයකි. 15 කණ්ඩායම සඳහා තාක්ෂණික සහාය පහසුකම සලසන ආයතනයක් ජිනීවා හි පිහිටා ඇත. ඉරානයේ ටෙහෙරාන් නුවර පැවති 15 කණ්ඩායමේ අවසන් සමුළුවේදී මෙහි සභාපතිත්වය ශ්‍රී ලංකාව විසින් භාර ගන්නා ලදී. මෙම අංශය විසින්, ජිනීවා හි පිහිටි ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලය හා එක්ව 15 කණ්ඩායමේ ශ්‍රී ලංකා සහභාගිත්වය හා සම්බන්ධ කාර්ය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. 2012 සැප්තැම්බර් මස නිව්යෝර්ක් හි දී පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමට සමගාමීව 15 කණ්ඩායමේ අමාත්‍ය මට්ටමේ රැස්වීම සංවිධානය කිරීමෙහිලා මෙම අංශය පහසුකම් සැලසීය.

- 2012 පෙබරවාරි මස අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සඳහා කොළඹ පිහිටි විදේශ දූත මණ්ඩලවල සහභාගිත්වය මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. මෙහිදී එම රටවල පවතින සංස්කෘතික, සංචාරක, අධ්‍යාපනික හා වෙළඳ ඉඩ ප්‍රස්ථා මෙන්ම ශ්‍රී ලංකාව සමඟ පැවති ඓතිහාසික සබඳතා විදහා දක්වන ලෙසට මෙම දූත මණ්ඩල දිරිමත් කරන ලදී. මෙම ප්‍රදර්ශනය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වැනි ජාත්‍යන්තර සංවිධානවල සයභාගීත්වය ද මෙම අංශය විසින් තහවුරු කරන ලදී.

- ආසියානු සහයෝගිතා සංවාදය (ACD), ආසියානු ප්‍රජාවක් බිහිකිරීම අරමුණු කර ගත් සාමාජිකයන් 31කින් යුත් සංසදයකි. 2012 අප්‍රේල් මසදී ඉන්දියාවේ නවදිල්ලි නුවර දී පවත්වන ලද ආසියානු සහයෝගිතා සංවිධානයේ සංස්කෘතික සහයෝගිතාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ දෙවැනි රැස්වීම සහ 2012 මැයි මසදී කුවේට් හි දී පැවති මූල්‍ය, ආර්ථික සහ වෙළඳ සහයෝගිතාව පිළිබඳ ආසියානු සහයෝගිතා සංවාද වැඩමුළු රැස්වීම වැන ආසියානු සහයෝගිතා සංවිධානයේ රැස්වීම් කීපයක් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය හා සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබුවේද මෙම අංශය විසිනි. 2012 සැප්තැම්බර් මස නිව් යෝර්ක් හි දී පැවති එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීමට සමගාමීව පැවති ආසියානු සහයෝගිතා සංවාදයේ අමාත්‍ය මට්ටමේ රැස්වීම සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සඳහාද පහසුකම් සැලසුවේ මෙම අංශයයි. ආසියා සහයෝගිතා සංවාදයේ ප්‍රථම සමුළුව 2012 ඔක්තෝබර් මස කුවේට් හි පවත්වන ලද අතර ඒ සඳහා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සහභාගිත්වය උදෙසා මෙම අංශය පහසුකම් සැලසීය. කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායන් හා ඉ - අධ්‍යාපනය ක්ෂේත්‍ර පිළිබඳ පුරෝගාමී රටක් ලෙස ශ්‍රී ලංකාව ලබා දෙන දායකත්වය පිළිබඳ වෙනත් රේඛීය නියෝජිතායතන සමඟ මෙම අංශය සම්බන්ධීකරණ කටයුතු කළේය.

- ආසියා හා පැසිෆික් කලාපය සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජීය කොමිෂන් සභාවේ සියලු (UNESCAP) ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරනු ලබන්නේ මෙම අංශය විසිනි. සමාලෝචනයට බඳුන් කෙරෙන කාලය තුළදී, මෙම කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද විවිධ අවස්ථා සඳහා මෙම අංශය ක්‍රියාකාරීව සහභාගී වී ඇති අතර, එහිදී යෝග්‍ය ආකාරයේ මැදිහත් වීම් සිදු කර ඇත. මෙම කොමිෂන් සභාව හා එක්ව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනය (ICTA) විසින් 2012 සැප්තැම්බර් 05 - 06 දිනවල කොළඹ දී පවත්වන ලද සංවර්ධනය ප්‍රකෘති තත්ත්වයට පත් කිරීම සඳහා ආසියා පැසිෆික් ඩිජිටල් සංගමය සම්බන්ධ කර ගැනීම පිළිබඳ කලාපීය විශේෂඥවරුන්ගේ

- උපදේශන සංවිධානය කරන ලදී. ආසියා - පැසිෆික් වෙළඳ පහසුකම් සැලසීමේ සංසදය, 2012 ඔක්තෝබර් 30 - 31 දින වලදී කොළඹදී පවත් වන ලදී. ආසියා හා පැසිෆික් සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජයීය කොමිෂන් සභාවේ 68 වැනි සැසිවාරය තායිලන්තයේ බැංකොක් නුවරදී 2012 මැයි 17 - 20 දින වලදී පවත්වන ලදී. ප්‍රවාහනය පිළිබඳ ආසියා - පැසිෆික් සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජයීය කොමිෂන් සභා කමිටුවේ 3 වැනි සැසිවාරය 2012 ඔක්තෝබර් 10 - 12 දිනවලදී තායිලන්තයේ බැංකොක් නුවර දී පවත්වන ලද. මෙම සැසිවාරයේදී, වරාය සමග සෘජුව සම්බන්ධ වන රට තුළ පිහිටි පර්යන්ත පිළිබඳ අන්තර් ආණ්ඩු කෙටුම්පත් ගිවිසුම පිළිගන්නා ලදී. කෘෂිකාර්මික ඉංජිනේරු කටයුතු සහ කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආසියා සහ පැසිෆික් මධ්‍යස්ථානය පිළිබඳ තාක්ෂණික කමිටුවේ 8 වැන සැසිවාරය 2012 ඔක්තෝබර් 23 - 25 දිනවලදී පේරාදෙණියේ දී පවත්වන ලදී.

- මැලේසියාවේ ජාතික වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ ඉහළ පෙළේ ව්‍යාපාරික නියෝජිත කණ්ඩායම 2012 ජූලි මසදී සිදු කළ සංචාරය සහ 2012 අගෝස්තු මසදී ශ්‍රී ලංකා ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් වියට්නාමයේ නයැලූණු සංචාරය ඇතුළුව ශ්‍රී ලාංකාවේ සිට හා ශ්‍රී ලංකාව වෙත වෙළඳ හා ආර්ථික නියෝජිත කණ්ඩායම් සිදු කළ සංචාර සඳහා මෙම අංශය පහසුකම් සලසන ලදී. සීෂෙල්ස්, ස්වාසිලන්ත හා මාලදිවයින් ජනාධිපතිවරුන්ගේ රාජ්‍ය සංචාර වැනි ඉහළ පෙළේ සංචාර අතරතුරදී, ව්‍යාපාරික සංසද කිහිපයක් ශ්‍රී ලංකාවේදී සංවිධානය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ද අංශය විසින් සලසන ලදී.

- 2011/ 2012 අධ්‍යයන වර්ෂයේ සිට ආරම්භ වන පරිදි, විදේශ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා උපාධි හා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව 100ක් ප්‍රදානය කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජය තීරණය කර ඇත. මෙම අංශය, ශ්‍රී ලංකා දූත මණ්ඩල සමග සම්බන්ධීකරණයෙන් යුතුව මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සහ විදේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් ඉල්ලුම් පත් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

- අපනයන ප්‍රවර්ධනය සම්බන්ධයෙන් වන ප්‍රකාශන ("ඉකොනොමික් රිව්ව්", "ද එක්ස්පෝට් මැගසින්", "ටෝකියෝ ඉකොනොමික් ඩයිජස්ට්", "ස්ටෙප් බයි ස්ටෙප් ටු ඩුයින් බිස්නස් ඉන් ශ්‍රී ලංකා" ) ආදී විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට බෙදා හැරීම සම්බන්ධීකරණය කරන ලද්දේ මෙම අංශය විසිනි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ විශේෂ ප්‍රකාශන සහ "ටච් යුවර් ෆියුචර්","ෆැසට්ස්" හා මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශන පිළිබඳ ප්‍රවර්ධන ලියකියවිලිද මේ සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්ව අතර බෙදා හැරීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත යවන ලදී.

- ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JAICA) අපනයන සංවර්ධන බැංකුව, ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර ආයතන/ නියෝජිතායතනවලින් පැමිණෙන විදේශීය විශේෂඥ පුද්ගලයන්යට කෙටි කාලීන වීසා බලපත් ලබා දීම සඳහා පහසුකම් සැලසීමද ආර්ථික කටයුතු අංශය විසින් ඉටු කරන ලදී. 2012 වසරේදී මෙවැනි වීසා බලපත්‍ර කිහිපයක් නිකුත් කිරීම හා සම්බන්ධ කටයුතු මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. ආගමන හා විගමන දෙපාර්තමේන්තු විසින් විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් විදේශ ගමන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ (ETA) සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලද්දේද මෙම අංශය විසිනි.

# සන්ධාන අංශය

**<u>සන්ධාන අංශය</u>**

සන්ධාන අංශයේ කාර්ය කටයුතු පහත දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් යටතේ වර්ග කළ හැකිය.

අ) උත්සව අවස්ථා සඳහා අවශ්‍ය කටයුතු සැලසීම.

ආ) ශ්‍රී ලංකාව සඳහා අක්ත ගන්වා ඇති විදේශීය රාජතාන්ත්‍රික නියෝජනයන් හා ජාත්‍යාන්තර සංවිධාන සඳහා රාජතාන්ත්‍රික වරප්‍රසාද සහ විනිර්මුක්තත් සම්බන්ධයෙන් පහසුකම් සැලසීම සහ ඒවා පිරිනැමීම.

ඇ) ශ්‍රී ලංකාව සඳහා අක්ත ගන්වා ඇති (කොළඹ සිටින සහ වෙනත් ස්ථානවල සිට සමගාමීව අක්ත ගන්වා ඇති) දූත මණ්ඩල ප්‍රධානීන් හා සම්බන්ධ කටයුතු සඳහා පහසුකම් සැලසීම.

ඇ) ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර සමුළු සඳහා සැපයුම් සංවිධාන හා සන්ධාන කටයුතුවලට පහසුකම් සැලසීම.

**1. උත්සව අවස්ථා**

1.1 උත්සව අවස්ථා සඳහා අවශ්‍ය කටයුතු ඉටු කිරීමේ ප්‍රධාන කේන්ද්‍රස්ථානය වනුයේ සන්ධාන අංශයයි. සන්ධාන අංශය රාජ්‍ය නායකයින්, ආණ්ඩු ප්‍රධානීන්, අමාත්‍යවරුන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ වෙනත් සම්භාවනීය පුද්ගලයන් ශ්‍රී ලංකාවේ සදු කරන සංචාර සඳහා පහසුකම් සැලසීමෙහිලා අවශ්‍ය වන සැපයුම් සංවිධාන සහ සන්ධාන කටයුතු සිදු කරයි. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යවරයා, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා විදේශීය සම්භාවනීය පුද්ගලයන් වෙනුවෙන් සංවිධානය කරන විවිධ අවස්ථා සඳහා අවශ්‍ය සහාය ලබා දීමේ වගකීම දරනු ලබන්නේද සන්ධාන අංශයයි. අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් සංවිධානය කරනු ලබන උත්සව අවස්ථා සඳහා විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සහ රටවල් සම්බන්ධ වන්නේ නම්, එම අමාත්‍යාංශවල ඉල්ලීම මත අවශ්‍ය සන්ධාන සහාය සහ උපදෙස් ලබා දෙනු ලබයි.

1.1.1 අතිසම්භාවනීය පුද්ගලයන්/ අතිවිශේෂ පුද්ගලයන්ගේ ශ්‍රී ලංකා සංචාර සම්බන්ධයෙන් කටයුතු කිරීම (අ) ඇමුණුමෙහි විස්තර දක්වා ඇත.

| | |
|---|---|
| රාජ්‍ය නායකයින්/ අග්‍රාමාත්‍යවරුන් සහ වෙනත් අති විශේෂ පුද්ගලයන් | - 15 |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ වෙනත් ජාත්‍යන්තර සංවිධානවල ප්‍රධානීන් | - 09 |
| විශේෂ නියෝජිතයන් | - 04 |
| විදෙශ අමාත්‍යවරුන් | - 18 |
| කැබිනට් අමාත්‍යවරුන් | - 10 |
| වෙනත් විදේශ සම්භාවනීය පුද්ගලයන් | - 25 |
| රැස්වීම්/ සමුළු සඳහා නියෝජිත කණ්ඩායම් | - 20 |

| | | |
|---|---|---|
| 1.1.2 | විදේශ රටවල ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරුන්ගේ පත්වීම | - 19 |
| | ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් | -නැත |

1.2 අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් සිදු කරනු ලබන සංචාර සංවිධානය කිරීමේදී, මෙම අංශය, අදාල විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ විදේශ රටවල පිහිටි නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව, සියලු සන්ධාන හා සැපයුම් සංවිධාන කටයුතු සම්බන්ධයෙන් මනා සම්බන්ධීකරණයක් තහවුරු කිරීම සඳහා ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කරයි.

1.2.1 **ශ්‍රී ලංකාවේ අතිසම්භාවනීය පුද්ගලයන් නිරත වූ සංචාර**

| | |
|---|---|
| අතිගරු ජනාධිපතිවරයාගේ රාජ්‍ය සංචාර | - 14 (ආ ඇමුණුමෙහි විස්තර දක්වා ඇත) |
| ගරු අග්‍රාමාත්‍යවරයාගේ සංචාර | - නැත |
| ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාර | - 26 (ඇ ඇමුණුමෙහි විස්තර දක්වා ඇත) |

**2.වරප්‍රසාද සහ විනිර්මුක්තීන්**

2.1 1961 රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිළිබඳ වියනා සම්මුතිය, 1963 කොන්සියුලර් සබඳතා පිළිබඳ වියනා සම්මුතිය, 1946 එක්සත් ජාතීන්ගේ වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිළිබඳ සම්මුතිය සහ 1947 විශේෂිත නියෝජිතායතනවල වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිළිබඳ සම්මුතිය ප්‍රකාරව, රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල, ජාත්‍යන්තර සංවිධාන සහ ඒවායේ කාර්ය මණ්ඩල සඳහා වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිරිනැමීමේ හා ඒ සම්බන්ධ පහසුකම් සැලසීමේ වගකීම දරන්නේද සන්ධාන අංශයයි.

සමාලෝචනයට බඳුන් කෙරෙන කාලය තුළදී, සන්ධාන අංශයේ, වරප්‍රසාද හා විනිර්මුක්තීන් පිළිබඳ ඒකකය විසින් ඉටු කරනු ලැබූ කාර්ය කටයුතු :

2.2.1 නිෂ්කාශන සහතික පත් නිකුත් කිරීම - 1965

2.2.2 ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩලවල කාර්ය මණ්ඩල සාමාජිකයින් පැමිණෙන හා පිටත්ව යන අවස්ථාවලදී ලබා දුන් රේගු පහසුකම් - 135

2.2.3 රාජ්‍යතාන්ත්‍රික වාහන

| | |
|---|---|
| වාහන විකිණීම | - 285 |
| වාහන ලියාපදිංචි කිරීම | - 98 |
| ආදායම් බලපත්‍ර නිකුත් කිරීම | - 980 |
| රියදුරු බලපත්‍ර නිකුත් කිරීම් | - 58 |
| පෙට්‍රල් කූපන් පොත් නිකුත් කිරීම | - 402 |

2.2.4 විදේශ දූත මණ්ඩල හා එක්සත් ජාතීන්ගේ සංවිධාන සඳහා නිකුත් කළ වීසා බලපත් ප්‍රමාණය - 1222

2.2.5 ගුවන් තොටුපළ අවසරපත් - (162- ස්ථිර සහ තාවකාලික)
ගුවන් තොටුපළේ අතිවිශේෂ පුද්ගලයන් රැඳී සිටින ස්ථානය සඳහා අවසරපත් - 1400

2.2.6 රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාශන (විදේශ ගුවන්යානා සහ නැව් - 174)

2.2.7 ජාතික දින සුභාශිංසන පණිවුඩ - 102

**3.අක්ත ගැන්වීම**

මෙම අංශය, ශ්‍රී ලංකාව සඳහා අක්ත ගන්වා ඇති විදේශීය තානාපතිවරුන් අක්ත පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව අවස්ථා සංවිධානය කිරීම, වෙනත් රටවල් සඳහා පත්කරනු ලබන ශ්‍රී ලාංකික තානාපතිවරුන්, මහ කොමසාරිස්වරුන් සඳහා අදාළ රටවලින් නිකුත් කරන පිළිගැනීමේ ලිපිය ලබා ගැනීම, ශ්‍රී ලංකාවේ සිටින විදේශීය රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම සහ ඔවුන් පිටව යන අවස්ථාවලදී සිදු කළ යුතු විධිමත් ක්‍රියාපිළිවෙත් ඉටු කිරීම පිළිබඳව වගකීම දරයි. අදාළ කාල සීමාව තුළදී මෙම අංශය විසින් පහත සඳහන් කාර්යය ඉටු කර තිබේ;

3.1.2 හැඳුනුම්පත් (රාජ්‍යතාන්ත්‍රික - 277 සහ වෙනත් - 216)

3.1.2 ශ්‍රී ලංකාව සඳහා විදේශ දූත මණ්ඩල ප්‍රධානීන් පත් කිරීම - 22

**4.ජාත්‍යන්තර සමුළු**

4.1 සැපයුම් සංවිධාන සහ සන්ධාන අංශ සම්බන්ධයෙන් ගත් කළ **මෙම අංශය, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සමුළු පැවැත්වීම සඳහා සිත් ගන්නා සුළු ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් අඛණ්ඩව ඉටු කරමින් සිටියි.** සන්ධාන අංශය අදාළ රේඛීය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමඟ ඒ සඳහා අවශ්‍ය කටයුතු සමීපව සම්බන්ධීකරණය කරනු ලබයි.

4.2 ජාත්‍යන්තර සමුළු හා සම්බන්ධ මෙවැනි සන්ධාන හා සැපයුම් සංවිධාන කටයුතු ඉටු කිරීමෙහිලා අදාළ රේඛීය ආයතනවල කාර්ය මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය වන සහාය සහ මාර්ගෝපදේශනය ලබා දෙනු ලබන්නේද මෙම අංශය විසිනි. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සන්ධාන අංශයේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ පවත්වන ලද ජාත්‍යන්තර සමුළු පහත දැක්වේ.

1. එක්සත් රාජධානි පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජේම්ස් වර්ටොන් මහතා - 2012 ජනවාරි 03 - 05

2. පොදු රාජ්‍ය මණ්ඩලයීය පළාත් පාලන සංසදසිම්පෝසියම, 2012 අප්‍රේල් 24 -25

3. චීන මහජන දේශපාලන උපදේශක සමුළුවේ (CPPCC) හැන්ග්ෂූ කමිටුවේ සභාපති ගරු සුන් සොන්ග්හුවාන් මහතාගේ නායකත්වයෙන් යුත් නියෝජිත කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරය, 2012 අප්‍රේල් 24 - 27

4. විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල ප්‍රධානීන් සඳහා දියතලාවේ පිහිටි ශ්‍රී ලංකා හමුදා අධ්‍යයන ආයතනයේ පැවති නේවාසික වැඩමුළුව සහ ක්ෂේත්‍ර සංචාරය, - 2012 ජූලි 06 - 10

5. පොදු රාජ්‍ය මණඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමේ කටයුතු සැලසුම් කිරීමේ කණ්ඩායම, 2012 සැප්තැම්බර් 06 - 13

6. කොළඹ පැවති පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමයේ 58 වැනි සමුළුව, 2012 සැප්තැම්බර් 05 - 07

7. මීට අමතරව, කපිල වස්තුපුර දන්ත ධාතූන් වහන්සේ ප්‍රදර්ශනය කිරීමේදී ද සන්ධාන අංශය ක්‍රියාකාරීවසහාය දැක්වීය. 2012 අගෝස්තු 20 - සැප්තැම්බර් 12

**<u>අ ඇමුණුම</u>**

**රාජ්‍ය නායකයින්/ අග්‍රාමාත්‍යවරුන් සහ වෙනත් අති විශේෂ පුද්ගලයන්** - 15

1. කටාර් රාජ්‍යයේ එමීර්වරයා වන ෂෙයික් හමාඩ් බින් බලීෆා අල් තානි උතුමාණන්ගේ සංචාරය, 2012 ජනවාරි 15 - 16

2. මාලදිවයිනේ උප ජනාධිපතිවරයාගේ සංචාරය, 2012 පෙබරවාරි 22

3. කටාර් රාජ්‍යයේ එමීර්වරයා වන ෂෙයික් හමාඩ් බින් බලීෆා අල් තානි උතුමාණන්ගේ සංචාරය, 2012 පෙබරවාරි 22 - 24

4. මාලදිවයින් ජනරජයේ ජනාධිපති අතිගරු මොහොමඩ් නෂීඩ් මහතාගේ සංචාරය, 2012 මාර්තු 22

5. පලස්තීන රාජ්‍යයේ ජනාධිපති අතිගරු මොහොමඩ් අබ්බාස් මහතාගේ රාජ්‍ය සංචාරය, 2012 අප්‍රේල් 15 - 17

6. අග්‍රාමාත්‍ය සහ ආරක්ෂක අමාත්‍ය අතිගරු අවුන් බසාවිනෙහ් මහතාගේ සංචාරය, 2012 මැයි 07 - 10

7. මාලදිවයින් ජනරජයේ හිටපු ජනාධිපති අතිගරු මවුමූන් අබ්දුල් ගයූම් මහතාගේ සංචාරය, 2012 අප්‍රේල් 19 - 22

8. ජපාන අග්‍රාමාත්‍ය අතිගරු කත්සුයා ඔකාඩා මහතාගේ සංචාරය, 2012 මැයි 04 - 05

9. ස්වාසිලන්ත රාජධානියේ රජු වන III වැනි මිස්වටි රජතුමාගේ සංචාරය, 2012 අගෝස්තු 13 - 15

10. චීනයේ ජාතික මහජන කොන්ග්‍රසයේ ස්ථාවර කමිටුවේ සභාපති අතිගරු වූ බැන්ගුඕ මහතාගේ සංචාරය, 2012 සැප්තැම්බර් 15 - 18

11. සීෂෙල්ස් ජනරජයේ ජනාධිපති අතිගරු ජේම්ස් ඇලික්ස් මිෂෙල් මහාතගේ සංචාරය, 2012 අගෝස්තු 20 - 22

12. මාලදිවයින් ජනරජයේ ජනාධිපති අතිගරු ආචාර්ය මොහොමඩ් වහීඩ් මහතාගේ සංචාරය, 2012 අගෝස්තු 23 - 25

13. ඉන්දුනීසියා ජනරජයේ උප ජනාධිපති මහාචාර්ය ආචාර්ය බොක්ඩියෝනෝ මහතාගේ සංචාරය, 2012 අගෝස්තු - 28 සැප්තැම්බර් 02

14. උගන්ඩාවේ අතිගරු ජනාධිපතිවරයාගේ සංචාරය 2012 නොවැම්බර් 12-15

15. යුක්රේනයේ ආරක්ෂක අමාත්‍ය අතිගරු දමිත්රෝ ස්ලාමටින් මහතා 2012 දෙසැම්බර් 17-19

**එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හා වෙනත් ජාත්‍යන්තර සංවිධානවල ප්‍රධානීන් - 08**

1. ලෝක බැංකුවේ විධායක උප සභාපති, ලාර්ස් තනෙල් මහතා, 2012 පෙබරවාරි 21 - 24

2. සාර්ක් මහ ලේකම් අතිගරු ආචාර්ය ෆතිමාත් ඩියානා සයීඩ් මහත්මියගේ සංචාරය, 2011 ජූනි 20 -23

3. China Floor Association හි සභාපති එම්.එම්.සී ජන්ග් සෙහුයි මහතාගේ සංචාරය, 2011 නොවැම්බර් 17 - 21

4. පාකිස්තානයේ රාජ්‍ය අමාත්‍ය/ ආයෝජන මණ්ඩලයේ සභාපති ගරු සලීම් එච්. මැන්ඩ්විවල්ල මහතාගේ සංචාරය, 2012 දෙසැම්බර් 26 - 28

5. රසායනික අවි තහනම් කිරීම සඳහා සංවිධානයේ (OPCW) අධ්‍යක්ෂ ජනරාල් අතිගරු අහ්මෙට් උසුම්කු මහතාගේ සංචාරය

6. යුනිස්කෝ හි මහා සම්මේලනයේ සභාපති අතිගරු කැමලින් වොග්යා මැතිනියගේ සංචාරය , 2012 නොවැම්බර් 02-10

**විශේෂ නියෝජිතවරු - 04**

1. ඉන්දියාවේ හිටපු ජනාධිපති ආචාර්ය ඒ.පී.ජේ. අබ්දුල් කලාම් මහතා, 2012 ජනවාරි 21 - 23

2. ජපානයේ විශේෂ නියෝජිත යසුෂි අකාෂි මහතාගේ සංචාරය, 2012 අගෝස්තු 21 - 26

3. මුරුසියේ හිටපු ජනාධිපති කසාම් උටීම් මහතාගේ සංචාරය, 2012 සැප්තැම්බර් 5 - 8

4. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සංචාරය, 2012 ඔක්තොම්බර් 7-10

**විදේශ අමාත්‍යවරුන් - 18**

1. පලස්තීන රාජ්‍යයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු (ආචාර්ය) රියාඩ් අල් මල්කි මහතාගේ සංචාරය, 2012 ජනවාරි 02 - 03

2. ඉන්දුනීසියාවේ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු ආර්.එම්. මාර්ටි නටලිගාවා මහතාගේ සංචාරය, 2012 ජනවාරි 25 - 26

3. ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු එස්.එම්. ක්‍රිෂ්නා මහතාගේ සංචාරය, 2012 ජනවාරි 16 - 19

4. යුක්රේනයේ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු වික්ටර් මයිකෝ මහතා, 2012 ජනවාරි 19 - 21

5. මාලදිවයින් ජනරජයේ විදේශ ලේකම් අතිගරු මොහොමඩ් නසීර් මහතාගේ සංචාරය, 2012 ජනවාරි 25 - 27

6. ඕමානයේ විදේශ අමාත්‍ය අතිගරු යූසුෆ් බින් අලවි බින් අබ්දුල්ලා මැතිතුමාගේ සංචාරය, 2012 ඔක්තෝම්බර් 30 - නොවැම්බර් 01

7. හන්ගේරියාවේ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු ආචාර්ය ජැනෝස් මාටෝනියි මැතිතුමාගේ සංචාරය, 2012 නොවැම්බර් 7 - 8

8. වාර්ෂික ද්විපාර්ශ්වික සාකච්ඡා සඳහා යුක්රේනයේ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය අතිගරු ආචාර්ය වික්ටර් මයිකෝ මහතා සහ නියෝජිත කණ්ඩායම, 2012 මාර්තු 21 - 22

9. කොන්ගෝ ජනරජයේ විදේශ කටයුතු හා සහයෝගිතා අමාත්‍ය අතිගරු බැසිලි ඉකූඑබේ මහතා, 2012 මාර්තු 21 - 24 සහ මාර්තු 29 - 30

10. සිංගප්පූරුවේ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු කේ. ෂන්මුගම් මහතාගේ සංචාරය, 2012 මැයි 29 - ජූනි 01

11. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ කටයුතු අමාත්‍ය ෂෙයික් අබ්දුල් බින් සෙයෙඩ් බින් සුල්තාන් අල් නහ්යාන් උතුමාණන්ගේ සංචාරය, 2012 මැයි 13

12. චෙක් ජනරජයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සහ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු තෝමස් ඩබ් මහතාගේ සංචාරය, 2012 අප්‍රේල් 19 - 21

13. සංගප්පූරුවේ හිටපු විදේශ කටයුතු අමාත්‍ය ජෝර්ජ් යෙඕ මහතාගේ සංචාරය, 2012 අප්‍රේල් 28 - 30

14. ආසියාව හා පැසිෆික් සඳහා ඉරාන නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය හා ජනාධිපතිවරයාගේ විශේෂ නියෝජිත ගරු ආචාර්ය අබ්බාස් අරග්චි මහතාගේ සංචාරය

15. පාකිස්තානයේ විදේශ කටයුතු ඇමතිනී අතිගරු හිනා රබ්බානිඛාර් මහත්මියගේ සංචාරය, 2012 අගෝස්තු 01 - 03

16. උගන්ඩාවේ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු ඔරෙයෙම් ඔකෙලෝ මහතාගේ සංචාරය, 2012 සැප්තැම්බර් 04 - 09

17. ඕස්ට්‍රේලියාවේ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු බොබ් කාර් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය, 2012 දෙසැම්බර් 14 - 17

18. ඇෆ්ගනිස්තාන ඉස්ලාමීය ජනරජයේ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු ආචාර්ය සල්මාල් රුස්සෝල් මහතාගේ සංචාරය, 2012 දෙසැම්බර් 18 - 20

**ආ ඇමුණුම**

**ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයාගේ රාජ්‍ය සංචාර - 14**

1. ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ පකිස්තාන රාජ්‍ය සංචාරය, 2012 පෙබරවාරි 10 - 12
2. ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ සිංගප්පූරු රාජ්‍ය සංචාරය, 2012 පෙබරවාරි 14 - 17
3. ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ දකුණු කොරියා රාජ්‍ය සංචාරය, 2012 අප්‍රේල් 23 - 27
4. 12 වැනි දෝහා සංසදය සඳහා සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ දෝහා කටාර් රාජ්‍ය සංචාරය, 2012 මැයි 18 - 22
5. අතිගරු ශ්‍රී ලංකා ජනාධිපතිවරයා 9 වැනි ජාත්‍යන්තර සමුළුවට හා එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරීම් සඳහා සහභාගී වීම සඳහා ඉන්දියාවේ නිරත වූ සංචාරය, 2012 මැයි 29 - ජූනි 02
6. II වැනි එලිසබෙත් මහ රැජිනගේ දියමන්ති ජුබිලි සැමරුම් සඳහා සහභාගීවීමට ශ්‍රී ලංකා අතිගරු ජනාධිපතිතුමා එක්සත් රාජධානියේ සිදු කළ සංචාරය, 2012 ජූනි 03 - 07
7. ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා වතිකානුවේ සිදු කළ රාජ්‍ය සංචාරය, 2012 ජූනි 07 - 09
8. ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ කියුබානු නිල සංචාරය, 2012 ජූනි 14 - 18

9. බ්‍රසීලයේ රියෝ ද ජැනයිරෝ හි පැවති තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ සංචාරය, 2012 ජූනි 19 - 25

10. XVI වැනි නොබැඳි ජාතීන්ගේ සමුළුවට සහභාගීවීම සඳහා අතිගරු ජනාධිපතිතුමා ඉරානයේ සිදු කළ සංචාරය, 2012 අගෝස්තු 29 - 31

11. අතිගරු ජනාධිපතිතුමාගේ ඉන්දියානු නිල සංචාරය, 2012 සැප්තැම්බර් 19 - 22

12. ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ කුවේට් රාජ්‍ය සංචාරය , 2012 ඔක්තෝම්බර් 15 - 17

13. ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ ඩුබායි රාජ්‍ය සංචාරය, 2012 ඔක්තෝම්බර් 21 - 24

14. ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ කසකස්තාන සංචාරය, 2012 නොවැම්බර් 19 - 22

**ඇ ඇමුණුම**

**ශ්‍රී ලංකාවේ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාර** - 26

1. ගරු අමාත්‍යවරයා සිංගප්පූරුවේ සිදු කළ පෞද්ගලික සංචාරය, 2012 දෙසැම්බර් 21 - ජනවාරි 01

2. සෙනෙගාල්, බර්කිනා ෆාසෝ හා මොරිටේනියාවේ සිදු කළ නිල සංචාරය, 2012 ජනවාරි 08 - 15

3. නව දිල්ලි නුවර සිදු කළ නිල සංචාරය, 2012 ජනවාරි 22 - 24

4. දකුණු අප්‍රිකාව, බොට්ස්වානා, කෙන්යාව, කැමරූන් හා කොන්ගෝවේ නියැලුණු රාජ්‍ය සංචාරය, 2012 පෙබරවාරි 27 මාර්තු 03

5. ජෝර්දානයේ සිදු කළ නිල සංචාරය සහ පකිස්තානයේ සිදු කළ රාජ්‍ය සංචාරය, 2012 පෙබරවාරි 08 - 12

6. සිංගප්පූරුවේ රාජ්‍ය සංචාරය, 2012 පෙබරවාරි 14 - 17

7. ස්විස්ටර්ලන්තය, උගන්ඩාව, නයිජීරියාව, බොට්ස්වානාව සහ දකුණු අප්‍රිකාව යන රටවල නිරත වූ නිල සංචාරය, 2012 පෙබරවාරි 20 මාර්තු 07

8. සෞදි අරාබි රාජධානියේ නිරත වූ රාජ්‍ය සංචාරය, 2012 මාර්තු 11 - 13

9. ජිනීවා හි (ස්විස්ටර්ලන්තය) නිරත වූ රාජ්‍ය සංචාරය

10. මාලදිවයින් නිල සංචාරය, 2012 අප්‍රේල් 05 - 08

11. මාලදිවයින් නිල සංචාරය, 2012 අප්‍රේල් 11 - 15

12. කොරියානු ජනරජයේ නිරත වූ රාජ්‍ය සංචාරය, 2012 අප්‍රේල් 23 - 25

13. සිංගප්පූරු පෞද්ගලික සංචාරය, 2012 මැයි 02 - 06

14. ඊජිප්තුවේ නිල සංචාරය, 2012 මැයි 07 - 10

15. ඇමරිකා එක්සත් ජනපදය, කටාර්, කසකස්තානය හා රුසියාව යන රටවල නිරත වූ නිල සංචාරය, 2012 මැයි 14 - 27

16. තායිලන්තයේ හා සිංගප්පූරුවේ නියැලුණ නිල සංචාරය, 2012 මැයි 14 - 27

17. එක්සත් රාජධානියේ හා ඉතාලියේ සිදු කළ රාජ්‍ය සංචාර, 2012 ජූනි 04 - 10

18. හන්ගේරියාවේ සිදු කළ නිල සංචාරය, 2012 ජූනි 10 - 14

19. කියුබානු හා බ්‍රසීල රාජ්‍ය සංචාරය, 2012 ජූලි 14 - 24

20. ජපානයේ ටොහොකුහි සිදු කළ නිල සංචාරය, 2012 ජූලි 01 - 05

21. වියට්නාමයේ නිල සංචාරය, 2012 ජූලි 16 - 18

22. බංග්ලාදේශයේ ඩකා නුවර සිදු කළ නිල සංචාරය, 2012 අගෝස්තු 04 - 07

23. ඉරානයේ සිදු කළ රාජ්‍ය සංචාරය, 2012 අගෝස්තු 26 - 31

24. එක්සත් රාජධානියේ සිදු කළ නිල සංචාරය, 2012 සැප්තැම්බර් 01 - 05

25. ඉන්දියාවේ නිරත වූ රාජ්‍ය සංචාරය, 2012 සැප්තැම්බර් 19 - 22

26. ඇමරිකා එක්සත් ජනපදයේ සිදු කළ නිල සංචාරය, 2012 සැප්තැම්බර් 23 ඔක්තෝබර් 05

# කොන්සියුලර් කටයුතු අංශය

**<u>කොන්සියුලර් අංශය</u>**

| | |
|---|---|
| ආවරණය වන රටවල් | - සියලුම රටවල් |
| නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව | - 61 |
| සමගාමීව අක්ත ගත්වා ඇති දූත මණ්ඩල සංඛ්‍යාව | - 87 |
| නිර්වේතනික කොන්සල්වරුන්ගේ සංඛ්‍යාව | - 68 |

කොන්සියුලර් අංශය පහත සඳහන් උප අංශවලින් සමන්විතය

1. **ලිපි ලේඛන සහතික කිරීමේ අංශය**

   2011 වසරේදී සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (IOM) සහාය ඇතිව ලිපි ලේඛන සහතික කිරීමේ අංශයේ කාර්ය කටයුතු පරිගණක ගත කිරීමෙන් අනතුරුව, කාර්යක්ෂමව හා ප්‍රමාදයකින් තොරව ලිපි ලේඛන 800 - 1000ක් පමණ දෛනිකව සහතික කර දීමට දැන් මෙම අංශයට හැකියාව ඇත. මෙම අංශය, විදේශීය රටවල් විසින් ඉල්ලා සිටින පරිදි ශ්‍රී ලංකාවේ අදාළ බලධාරීන් විසින් නිකුත් කරනු ලබන උප්පැන්න, විවාහක, අවිවාහක, වෛද්‍ය, අධ්‍යාපන, හා පොලිස් සහතික ඇතුළු විවිධාකාර ලිපි ලේඛන සහතික කිරීමේ කාර්යයෙහි නියුක්තවසිටියි.

   ලිපි ලේඛන සහතික කිරීම සහ ඒවායේ නිර්ව්‍යාජභාවය පරීක්ෂා කිරීම මගින් උපයාගන්නා ලද සමස්ත ආදායම ශ්‍රී ලංකා රුපියල් 127,364,375.00/- කි.

2. **වන්දි ලබා දීමේ අංශය**

   වන්දි මුදල්, ගෙවීමට ඇති වැටුප්, පරිත්‍යාග හෝ රක්ෂණ ආවරණ ලැබීමට හිමිකමක් ඇති විදේශ රටක වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට පහසුකම් සැලසීම සම්බන්ධයෙන් වගකීම දරනු ලබන්නේ මෙම අංශය විසිනි. සේවයේ නියුතුව සිටියදී සිදුවන ස්වාභාවික හෝ හදිසි මරණ, කාර්යාල වේලාවෙන් පසුව සිදුවන හදිසි මරණ හෝ ඝාතනයට ලක් වීම් වෙනුවෙන් මෙම ගෙවීම් ලබා දෙනු ලැබේ. එක් පුද්ගලයෙකු වෙනුවෙන් දැනට ලැබී ඇති ඉහළම වන්දි මුදල, ඩුබායි හි දී සිදුවූ මරණයක් වෙනුවෙන් ගෙවන ලද රු. 16,227,355.00ක මුදල වේ.

   වන්දි මුදල් හා ළඟම ඥාතීන් සම්බන්ධයෙන් පැන නගින ගැටලු නිරාකරණය කිරීම මෙම වර්ෂයේදී ගෙවන ලද මුළු වන්දි මුදල - ශ්‍රී ලංකා රුපියල් 208,103,971.37

## 3. මරණ පිළිබඳ අංශය

ශ්‍රී ලාංකිකයන් මිලියන 1.5 කට වැඩි පිරිසක් විදේශ රටවල රැකියාවල නියුක්තව සිටින අතර වාර්ෂිකව මරණ 350ක සාමාන්‍ය අගයක් මෙම අංශය වෙත වාර්තා වෙයි. 2012 දෙසැම්බර් 31 දක්වා කාලය තුළදී මරණ 431 ක් වාර්තා වී ඇති අතර, ඉන් 223ක් ස්වාභාවික මරණ ද 105ක් හදිසි අනතුරු මරණ ද වෙයි. ඝාතනයට ලක් වීමේ සිද්ධි 6ක් ද, සියදිවි නසා ගැනීමේ සිද්ධි 23ක් ද මීට ඇතුළත් වෙයි. කොන්සියුලර් අංශය විසින් මෘත දේහ ශ්‍රී ලංකාවට ගෙන ඒම සඳහා ළඟම ඥාතීන්ට අවශ්‍ය සහායද ලබා දෙන ලදී. මෙවැනි සිදුවීම් 18ක් සම්බන්ධයෙන් දැනට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතියි. මෙම සිදු වීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී සිදුවන ප්‍රමාදයන් සඳහා ප්‍රධාන හේතු වශයෙන්, නීත්‍යානුකූල නොවන මාර්ගවලින් සංක්‍රමණය වීම හේතුවෙන් ඔවුන් සඳහා අනුග්‍රාහකයන් නොමැති වීම, මෘත දේහ මෙරටට ගෙන්වා ගැනීම සඳහා වැය වන මුදල ගෙවීමට ඥාතීන්ට නොහැකි වීම සහ එම සිද්ධි සම්බන්ධයෙන් පොලිස් විමර්ශන කටයුතු තවදුරටත් සිදු කෙරෙමින් පැවතීම දැක්විය හැකිය.

මරණ පිළිබඳ අංශය : 2012 දෙසැම්බර් 31 වන විට මරණ 413ක් පිළිබඳව කටයුතු කර තිබේ.

## 4. නැවත සිය රට ගෙන්වා ගැනීමේ අංශය

අතරමංවූ හෝ අත්අඩංගුවේ පසු වන ශ්‍රී ලාංකිකයන් රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සමඟ සහයෝගීතාවයෙන් යුතුව, සංක්‍රමණ පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOM) සහ වෙනත් සංවිධානවල සහාය ඇතිව නැවත මෙරටට ගෙන්වා ගැනීම, කොන්සියුලර් අංශය විසින් සිදු කරනු ලබන වැදගත් කාර්යයක් වෙයි.

| | | |
|---|---|---|
| සාමාන්‍ය | - වාර්තා වී ඇති සංඛ්‍යාව | - 591 |
| | කටයුතු නිම කළ සංඛ්‍යාව | - 240 |
| | දැනට කටයුතු සිදු කෙරෙමින් පවතින සංඛ්‍යාව | - 351 |

රඳවාගෙන ඇති/ අත්අඩංගුවට ගෙන ඇති/ සිරභාරයේ පසුවන

| | |
|---|---|
| වාර්තා වී ඇති සංඛ්‍යාව | - 262 |
| කටයුතු නිම කළ සංඛ්‍යාව | - 75 |
| දැනට කටයුතු සිදු කෙරෙමින් පවතින සංඛ්‍යාව | - 187 |

මුළු එකතුව

| | |
|---|---|
| වාර්තා වී ඇති සංඛ්‍යාව | - 853 |
| කටයුතු නිම කළ සංඛ්‍යාව | - 315 |
| දැනට කටයුතු සිදු කෙරෙමින් පවතින සංඛ්‍යාව | - 538 |

කටයුතු කිරීමට දැනට මෙවැනි ඉල්ලීම් වැඩි ප්‍රමාණයක් ඉතිරිව ඇත්තේ පහත දැක්වෙන හේතු නිසාය.

(I) තම අනුග්‍රාහකයා සමඟ ගැටළුව විසඳා ගෙන සිටින අතරතුර ඔහුගේ/ ඇයගේ ළඟම ඥාතීන් ඔහුව/ ඇයව ගෙන්වා ගැනීමට ඉල්ලීමක් කිරීම.

(II) ගෙනවා ගැනීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් සම්පූර්ණ කර නොතිබීම.

(III) තවමත් අවසාන වී නොමැති විමර්ශන කටයුතු/ නඩු කටයුතු සඳහා විදේශ රටවල රඳවා තබා ගෙන ඇති පුද්ගලයන් හා සම්බන්ධ ඉල්ලීම්.

(IV) බඳවා ගැනීමේ ගාස්තුව නොමැතිව ගිවිසුම් කාලය සම්පූර්ණ වීමට පෙරාතුව මෙරටට එවීමට අනුග්‍රාහකයන් එකඟ නොවීම.

(V) නීති විරෝධී ලෙස විදේශ ගත වූවන්.

5. **අධ්‍යාපන සහතික අංශය**

විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන (සා/ පෙළ හා උ/ පෙළ) අධ්‍යාපන සහතික විදේශ රටවල් ඉල්ලා ඇති පරිදි මෙම අංශය මගින් සහතික කරනු ලබයි.

අ.පො.ස. සා/ පෙළ සහ උ/ පෙළ අධ්‍යාපන සහතික, සහතික කිරීම මගින් මෙම අංශය උපයන ලද මුළු ආදායම - ශ්‍රී ලංකා රුපියල් 8,585,875.00

**විවිධ කටයුතු අංශය**

- මෙම අංශය මගින් අතරමංවූ ධීවර යාත්‍රා සහ ධීවරයන් නැවත මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කරයි.

- මෙම වර්ෂයේදී ධීවර යාත්‍රා 22ක සිටි ධීවරයින් 110ක් නැවත ගෙන්වා ගන්නා ලදී.

- අතරමංවූ බෝට්ටුවලට අමතරව, සෝමාලියාවේ මුහුදු කොල්ලකරුවන් විසින් අල්ලා ගනු ලැබූ ධීවර යාත්‍රා පිළිබඳව කටයුතු කිරීම ද මෙම අංශයේ විෂය පථයට අයත් වේ.

  මීට අමතරව, විවිධාකාර වූ සිද්ධීන් කිහිපයක් සම්බන්ධයෙන්ද මෙම අංශය කටයුතු කර තිබේ. 2012 වසරේදී එවැනි සිද්ධි 41ක් වාර්තා වී ඇති අතර ඉන් 3ක් විසඳා තිබේ.

- උප්පැන්න සහතික නිකුත් කිරීම
  උප්පැන්න සහතික 1250ක් ලැබී ඇත.
  ඉන් 550ක් ඉල්ලුම්කරුවන් වෙත භාර දෙන ලදී.

- වෙනත් රටවලින් ලැබෙන පොලිස් නිෂ්කාශන
  ඉල්ලුම් පත් 43ක් ලැබී තිබේ.
  ඉන් 35ක් පිළිබඳව කටයුතු නිම කර තිබේ.

# පොදු සන්නිවේදන අංශය

## පොදු සන්නිවේදන අංශය

පොදු සන්නිවේදන අංශය අමාත්‍යාංශයේ සක්‍රිය අංශයක් වන අතර තොරතුරු පතුරුවා හැරීම හා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ආරක්ෂා කරමින් එම ප්‍රතිරූපය විදේශ රටවල් වෙත ප්‍රක්ෂේපනය කිරීම තුලින් රජයත් බාහිර ක්‍රියාකාරිනුත් අතර මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමේ කාර්යභාරය මෙම අංශයට පැවරී ඇත. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට හා ජාත්‍යන්තර සම්බන්ධතාවලට අදාලව අමාත්‍යාංශය තුල හා පොදුවේ මුළු රට තුළම හටගන්නා සිදුවීම්/ උදාවන තත්ත්වයන් මත මෙම අංශයේ වැඩ කටයුතු රඳා පවතී.

1. අතිගරු ජනාධිපතිතුමා 2012 වර්ෂයේ පෙබරවාරි මාසයේදී පකිස්තානය හා සිංගප්පූරුවේ කළ සංචාරය, අප්‍රේල් මාසයේදී දකුණු කොරියාවේ කළ සංචාරය, මැයි මාසයේදී කටාර් හි කළ සංචාරය, ජුනි මාසයේදී තායිලන්තයේ, එක්සත් රාජධානියේ, ඉතාලියේ (වතිකානුවේ) කියුබාවේ හා බ්‍රසීලයේ කළ සංචාරය, අගෝස්තු මාසයේ දී ඉරානයේ හා සැප්තැම්බර් මාසයේදී ඉන්දියාවේ කළ සංචාරය ඔක්තෝම්බර් මාසයේදී කුවේට් හා ඩුබායි හි කළ සංචාරය හා නොවැම්බර් මාසයේ දී කසකස්තානයේ කළ සංචාරය යන සංචාර පිළිබඳ කටයුතු මෙම අංශය විසින් සම්බන්ධීකරණය කර ඇත.

2. ගරු විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා ජනවාරි මාසයේදී සෙනෙගාල්, බුර්කිනා ෆාසෝ, මොරිටේනියාව, ඉන්දියාව, කැමරූන් සහ කොන්ගෝ යන රටවල ද පෙබරවාරි මාසයේදී ජෝර්දානය, පකිස්තානය, සිංගප්පූරුව, ස්විට්සර්ලන්තය, උගන්ඩාව, නයිජීරියාව, බොස්නියාව යන රටවලද, මාර්තු මාසයේ සවුදි අරාබිය සහ සිංගප්පූරුව යන රටවලද, අප්‍රෙල් මාසයේ මාලදිවයින සහ කොරියාව යන රටවලද, මැයි මාසයේදී ඊජිප්තුව, ඇමරිකා එක්සත් ජනපදය, කටාර්, රුසියානු සමූහාන්ඩුව, කසකස්ථානය, තායිලන්තය හා සිංගප්පූරුව යන රටවලද, ජුනි මාසයේදී කියුබාව, බ්‍රසීලය, එක්සත් රාජධානිය, ඉතාලිය හා හන්ගේරියාව යන රටවලද, ජූලි මාසයේදී වියට්නාමයේද, අගෝස්තු මාසයේදී ඉරානය, එක්සත් රාජධානිය හා බංග්ලාදේශය යන රටවලද සැප්තැම්බර් මාසයේදී ඉන්දියාවේ හා ඇමරිකා එක්සත් ජනපදයේ ද කරන ලද සංචාර පිළිබඳ කටයුතු මෙම අංශය මගින් සම්බන්ධීකරණය කර ඇත.

3. වෙනත් රටවල නියෝජිත කණ්ඩායම් 31ක් ශ්‍රී ලංකාවේ සිදු කළ නිල සංචාර පිළිබඳ මාධ්‍ය ආවරණ සඳහා මෙම අංශය මගින් පහසුකම් සලසා දී ඇත.

4. තොරතුරු ආවරණය කිරීම සඳහා විදේශීය මාධ්‍යවේදීන් මෙරටෙහි සිදු කළ සංචාර 159ක් හා චිත්‍රපට රූගත කිරීමේ ව්‍යාපෘති 40ක් සඳහා මෙම අංශය මගින් පහසුකම් සලසා දී ඇත. මතු ප්‍රයෝජනය සඳහා සංචාරක මාධ්‍ය වේදීන් විසින් කරන ලද වැඩ කටයුතු පිළිබඳව මෙම අංශය දිගින් දිගටම වාර්තා පවත්වා ගෙන යයි.

5. අති සම්භාවනීය පුද්ගලයින් හා රාජ්‍ය නිලධාරීන් හමුවීමට පැමිණෙන සංචාරක මාධ්‍යවේදීන් සඳහා වේලාවන් හා අවස්ථාවන් සලසා උමේ සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මගින් කර ඇත.

6. සමාලෝචනයට භාජනය වන කාලය තුළදී, අමාත්‍යාංශය වෙනුවෙන් මෙම අංශය මගින් ප්‍රවෘත්ති සාකච්ජා/ රාජ්‍යතාන්ත්‍රික හමුවීම් 11ක් සංවිධානය කොට ඇති අතර, මාධ්‍ය නිවේදන 163ක් නිකුත් කර ඇත. එම මාධ්‍ය නිවේදනවල පිටපත් අදාල අංශවලට හා දූත මණ්ඩලවලට ලබාදී තිබේ.

7. අමාත්‍යාංශයේ මාධ්‍ය ප්‍රකාශක වශයෙන්, පොදු සන්නිවේදන අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා තොරතුරු ලබා දෙන අතර දේශීය හා විදේශීය මාධ්‍ය මගින් කෙරෙන විමසීම්වලට ප්‍රතිචාර දක්වයි.

8. භාෂාත්‍රයෙන් පළවන ප්‍රධාන දේශීය පුවත්පත් හා වෙබ් අඩවි මෙම අංශය විසින් දෛනිකව අධීක්ෂණය කරනු ලබන අතර මාධ්‍ය වාර්තාවල ශ්‍රී ලංකාවට අදාළව පළකෙරෙන තොරතුරු අඩංගු දෛනික වාර්තාවක් සකස් කොට, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ගරු විදේශ කටයුතු අධීක්ෂණ මන්ත්‍රීතුමා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ අමාත්‍යාංශයේ වෙනත් අංශ, ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හා රේඛීය නියෝජිතායතනවල තෝරා ගත් නිලධාරීන් වෙත යවනු ලබයි.

9. ශ්‍රී ලංකාවට අහිතකර වන ප්‍රචාරන කටයුතු සිදුවන අවස්ථාවලදී ඒවාට එරෙහිව කටයුතු කිරීම සඳහා, වත්මන් ප්‍රවණතා, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල ප්‍රගතිය, පශ්චාත් ගැටුම් කටයුතු, කම්කරු සුභසාධනය, සංස්කෘතික හා සංචාරක කටයුතු ආදිය පිළිබඳ තොරතුරු අවශ්‍ය අවස්ථා වලදී ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත ලබාදීමේ දී මෙම අංශය, අදාළ රාජ්‍ය සංවිධාන හා ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය.

10. ශ්‍රී ලංකාවට අදාළව කෙරෙන විමසීම් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා මෙම අංශය විසින්, ශ්‍රී ලංකාවේ සිදු වන සිදුවීම් පිළිබඳව දූත මණ්ඩල යාවත්කාලීන කරනු ලැබූ අතර, රජයේ ප්‍රකාශන/ මාධ්‍ය නිවේදන බෙදා හරින ලදී.

11. වැදගත් තොරතුරු අඩංගු ප්‍රකාශන ශ්‍රී ලංකාවේ සිට විදේශ දූත මණ්ඩලවලට නිතිපතා යැවීමේ කටයුතු මෙම අංශය මගින් සම්බන්ධීකරණය කරන ලදී.

12. දැයට කිරුළ ප්‍රදර්ශනය, ජාතික දිනය සහ වෙසක් උත්සවය නිමිත්තෙන් මෙම අංශය මගින් විශේෂ ප්‍රකාශන/ වාර්තා හා ශ්‍රව්‍ය දෘෂ්‍ය ප්‍රදර්ශන ද්‍රව්‍ය සකස් කරන ලදී. මෙයට අමතරව පාර්ලිමේන්තුව වෙත යවන විශේෂ විස්තර පත්‍රිකා, අමාත්‍යාංශයේ අයවැය පළිබඳ වාර්තාව, 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම සහ 2012 සැප්තැම්බර් මාසයේ පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සම්මේලනය සම්බන්ධයෙන් මාධ්‍යයට අදාළ වූ වැඩකටයුතු පිළිබඳව කටයුතු සූදානම් කිරීම සහ ඊට අදාළ ලියකියවිලි සැකසීම මෙම අංශය මගින් සිදු කරන ලදී.

13. 2012 පෙබරවාරි 04-10 දක්වා කාලය තුළ, අනුරාධපුර ඔයාමඩුවේ දී පවත්වන ලද දැයට කිරුළ ප්‍රදර්ශනයේදී මෙම අංශය මගින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රදර්ශන කුටිය පවත්වා ගෙන යාම පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

14. ඉ-රාජ්‍ය සංවර්ධන දර්ශකය පිළිබඳ එක්සත් ජාතීන්ගේ නිර්ණායකවලට අනුකූලව මෙම අමාත්‍යාංශය මගින් 2011 ජූලි 18 වන දින www.mea.gov.lk යන ඩොමේන් නාමය යටතේ අමාත්‍යාංශ වෙබ් අඩවිය නවීකරණය කර නැවත දියත් කරන ලදී. තොරතුරු/ දත්ත භාෂාත්‍රයෙන් අමාත්‍යාංශයේ වෙබ් අඩවියට හා රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයට (1919 සේවා) එක් කොට තිබේ. මාධ්‍ය නිවේදන ඇතුළු අමාත්‍යාංශයේ කාර්ය කටයුතු සහ දූත මණ්ඩලවල කාර්ය කටයුතු ඇතුළත් කරමින් අමාත්‍යාංශයේ වෙබ් පිටුව දෛනිකව යාවත්කාලීන කෙරේ.

15. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ඉ-රාජ්‍ය වැඩපිළිවෙලේ දෙවන අදියර නිමා කොට ඇති අතර මෙම අංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ඩොමේන් නාමය යටතේ ඇති රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයෙහි වෙබ් අඩවියෙහි අමාත්‍යාංශයේ වෙබ් පිටුව අඛණ්ඩව පවත්වා ගෙන යයි. මෙම අමාත්‍යාංශය 2013 ඉ-රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් වන දත්ත එකතුවට ඇතුලත් වන අමාත්‍යාංශ හයෙන් එකකි.

16. එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරකම්, සර්වපාක්ෂික නියෝජිත කමිටුව ආදිය පිළිබඳ අදාළ ලිපි ගොනු පහසුවෙන් සොයා ගැනීමේ අරමුණෙන්, තැන්පත් කර තැබීම සඳහා තොරතුරු සම්පත් ඒකකය පොදු සන්නිවේදන අංශය මගින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. පර්යේෂකයන්ට හා අදාළ වෙනත් පාර්ශවවලට අන්තර්ජාලය මගින් මෙම තොරතුරු ලබා ගත හැකි වන ආකාරයෙන්, තොරතුරු සම්පත් ඒකකය විසින් ත්‍රස්තවාදය හා සම්බන්ධ තොරතුරු අන්තර්ජාලයට නිතිපතා එක් කරනු ලැබේ.

17. විදේශ දූත මණ්ඩල සමඟ සන්නිවේදන සබඳතා සහ තොරතුරු බෙදා හදා ගැනීම ශක්තිමත් කිරීම සඳහා මෙම අංශය මගින් ලියකියවිලි කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් ආරම්භ කරන ලද අතර ඒ පිළිබඳ කටයුතු දැනට අවසාන අදියරට පැමිණ ඇත.

18. විදේශකයන් මෙරට සංචාරය කිරීම සම්බන්ධයෙන් විදේශ රටවලින් නිකුත් කරන උපදේශන මාලා මෙම අංශය මගින් අධීක්ෂණය කරනු ලබන අතර, යම් රටක් විසින් මෙරටට අයහපතක් වන ආකාරයේ උපදෙස් නිකුත් කර ඇත්නම් එම රට සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීම තුළින් එම උපදේශන මාලා සංශෝධනය කර ගැනීමේ අරමුණෙන් එවැනි අයහපත් බලපෑම් එල්ල කරන උපදේශන සම්බන්ධයෙන් විදේශ දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

19. චිත්‍රපට උළෙලවල්, සංස්කෘතික උළෙලවල් හා සංචාරක කර්මාන්තයට අදාළ කටයුතු සංවිධානය කිරීමේදී මෙම අංශය රේඛීය නියෝජිතායතන හා විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණ කටයුතු කරනු ලැබේ.

20. අමාත්‍යාංශයට අවශ්‍ය සිංහල දෙමළ, පරිවර්තන කටයුතු මෙම අංශය මගින් කර දෙනු ලැබේ.

21. කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව මෙම අංශය සඳහා සන්නිවේදන නිලධාරීන් දෙදෙනෙකු හා තොරතුරු නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගන්නා ලදී.

22. ගබඩා කිරීම සඳහා ඉඩකඩ පහසුකම් නොමැතිකම නිසා දැනට ගොඩගසා තිබෙන රහස්‍ය හා වටිනා වාර්තා සහ ආරක්ෂා කළ යුතු ලිපිලේඛන අනු සේයාපට ගතකිරීමට මෙම අංශය බලාපොරොත්තුවෙයි. මේ සඳහා කළයුතු වැඩ ප්‍රමාණය තක්සේරු කර පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීම සඳහා සුප්‍රසිද්ධ සමාගමක සේවය ලබා ගැනීමට අපේක්ෂා කරයි. ඉදිරිපත් කොට ඇති මිල ගණන් සැලකිල්ලට භාජනය වෙමින් පවතින අතර අරමුදල් ලැබුණු වහාම වැඩ කටයුතු නිම කළ හැකිවේයැයි අපේක්ෂා කෙරේ.

23. ශ්‍රී ලංකාවට පැමිණෙන මාධ්‍යවේදීන් පිළිබඳ දත්ත සමුදායක් පිහිටුවීමේ කටයුතු මෙම අංශය විසින් සිදු කෙරෙමින් පවතී. මෙය මගින් පරිශීලනය පහසුවන අතර ලිපිගොනු තැන්පත්කර තැබීම සඳහා ඉඩකඩ පහසුකම් නොමැතිවීමේ ප්‍රශ්නයටද විසඳුම් ලබා දෙයි.

# නීති අංශය

නීති අංශයේ කාර්ය කටයුතුවල වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ සාමාන්‍ය විස්තරයක්

- විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශය ස්ථාපනය කරන ලද්දේ 1967 දිය. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මගින් අමාත්‍යවරයාටත්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ වෙනත් අංශවලටත්, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලටත්, ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති විදේශ රටවල දූත මණ්ඩලවලටත්, වෙනත් අමාත්‍යාංශවලටත් ජාත්‍යන්තර නීතිය පිළිබඳ නෛතික උපදෙස් සැපයීම නීති අංශයේ කාර්ය භාරය වේ.

මෙම අංශය මගින් උපදෙස් ලබාදෙන ප්‍රධාන විෂය ක්ෂේත්‍ර

- සියලුම ප්‍රතිපත්ති තීරණවල නෛතික පැතිකඩ සම්බන්ධයෙන් විශේෂයෙනම්, දේශ සීමාවන් පිළිබඳ හිමිකම් සහ මායිම්, ගිවිසුම් සම්බන්ධතා පිළිගැනීම, රාජ්‍යතාන්ත්‍රික විනිර්මුක්ති හා වරප්‍රසාද යනාදිය තුළින් කලින් කල උදාවන ජාත්‍යන්තර ප්‍රශ්න සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම නීති අංශයේ කාර්යභාරය වේ.

- නාවික කටයුතු, සිවිල් ගුවන් සේවය, ජාත්‍යන්තර වෙළඳාම හා ආයෝජන වැනි පුළුල් විෂය පරාසයක් ආවරණය කරමින් විදේශීය ගනුදෙනුවල නිරතවන අනෙකුත් සියලුම අමාත්‍යාංශවලට හා රජයේ දෙපාර්තමේන්තුවලට විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශය ජාත්‍යන්තර නීතියට අදාලව උපදෙස් ලබාදෙයි. තවද, උදර්පනය, සාපරාධී, සිවිල් හා වාණිජ කටයුතු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නෛතික සහාය, ද්විත්ව බදුකරණය වැළැක්වීම, ආයෝජන සුරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය, සිරකරුවන් හුවමාරු කර හැරීම, ආපසු භාරගැනීම, සංක්‍රමණ, කම්කරු හා මිනිස් බලය සහ සාගර නීතිය ආදී කරුණු සම්බන්ධයෙන් අධිකරණ සහයෝගීතාවකට එළැඹීම පිළිබඳවසාකච්ඡාවලට කැඳවීම, සාකච්ඡා පැවැත්වීම සහ ගිවිසුම් පිළිබඳ කටයුතු නිම කිරීම යන කාර්යවල නීති අංශය නිරත වේ.

- ශ්‍රී ලංකා විදේශ සේවයට අදාළ වන අමාත්‍යාංශ උපදෙස් මාලාව අර්ථකථන කිරීම, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් ඇතිකර ගන්නා කොන්ත්‍රාත් හා ගිවිසුම්, අපගේ දූත මණ්ඩල මගින් ස්ථානීයව කම්කරුවන් බඳවා ගැනීම, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල මෙන්ම ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන විදේශ දූත මණ්ඩලවල රාජ්‍යතාන්ත්‍රික හා කොන්සියුලර් වරප්‍රසාද සහ විනිර්මුක්තීන්වලට අදාළ ප්‍රශ්න මෙම අංශයෙන් විමසීම් කරන ක්ෂේත්‍ර කිහිපයකි. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සියලුම ද්විපාර්ශ්වික රැස්වීම්වලදී වැදගත් හා ක්‍රියාශීලී කාර්යභාරයක් ඉටු කරන නීති අංශය ආයෝජන ප්‍රවර්ධනය, වැරදිකරුවන් ආපසු භාර ගැනීම ආදී ක්ෂේත්‍ර පිළිබඳ ද්විපාර්ශ්වික සාකච්ඡා මෙහෙයවයි.

ගුවන් සේවා

- මෙම වර්ෂය තුළදී, පහත සඳහන් රටවල් සමඟ ද්විපාර්ශ්වික ගුවන් සේවා සාකච්ඡා සඳහා නීති අංශයේ සහාය ලබාදී තිබේ.

**ජපානය**

- කොළඹ - නරිටා සහ නරිටා - කොළඹ අතර ගුවන් ගමන් වාර සංඛ්‍යාව 07ක් දක්වා වහාම ඉහළ දැමීමටත් 2013 ග්‍රීෂ්ම ඍතුවෙන් පසු සීමා රහිතව ගුවන් ගමන් වාර පැවැත්වීමටත්, සාකච්ඡාවලදී පාර්ශ්ව එකඟ වූහ. ජපානයේ අතිකුත් ගුවන් තොටුපළවල්වලට ගුවන් සේවා සීමා රහිතව පැවැත්වීමට ශ්‍රී ලංකාවට අවසර ලැබී ඇත. එක් අතරමැදි ස්ථානයක් සහ ඔබ්බෙහි පිහිටි ස්ථානයක් හරහා ගුවන් සේවා සිදුකිරීම සඳහා ගුවන් ගමන් සේවා පිළිබඳ පස්වන නිදහස් අයිතිය ඔවුන් විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන ලදී.

**ඉන්දුනීසියාව**

- වර්තමාන අවශ්‍යතාවලට සරිලන ආකාරයෙන් පවත්නා ගුවන් සේවා ගිවිසුම සංශෝධනය කරන ලදී. මේ අනුව, සාකච්ඡාවලදී ගිවිස ගත් ප්‍රකාරව සතියකට පැවැත්විය හැකි ගුවන් ගමන් වාර ගණන 6 සිට 14 දක්වා වැඩි කරන ලදී.

**ආයෝජන ප්‍රවර්ධනය**

අන්‍යෝන්‍ය වශයෙන් ආයෝජන ප්‍රවර්ධන කිරීම හා සුරක්ෂා කිරීම පිළිබඳ ගිවිසුමක් මෙම වර්ෂය තුළදී කටාර් රාජ්‍ය සමඟ අත්සන් කරන ලදී. මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නීතියේ ප්‍රධාන වෙනස්කම් සිදුවී ඇති හෙයින් සාකච්ඡාවලදී භාවිතා කරන ලද ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා සුරක්ෂා කිරීම පිළිබඳ ගිවිසුමේ ආකෘතිය නැවත කෙටුම්පත් කිරීමට අමාත්‍යාංශය මඟින් තීරණය කරන ලදී. ගිවිසුමේ නව ආකෘතිය නැවත කෙටුම්පත් කිරීම සඳහා වන නීති උපදේශකවරයාගේ සභාපතිත්වයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ, ආයෝජන මණ්ඩලයේ, ආර්ථික සංවර්ධන හා විදේශ කටයුතු අමාත්‍යාංශවල නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කෙරිණ. මෙම ආකෘතිය කෙටුම්පත් කිරීමේදී හිටපු නීති උපදේශක, ආචාර්ය රොහාන් පෙරේරා මහතාගෙන් උපදෙස් ලබාගැනීමට තීරණය විය. ආදර්ශ කෙටුම්පත 2012 දෙසැම්බර් 31 වන දාට පෙර සකස් කොට නිම කෙරෙනු ඇත. මෙම ආදර්ශ ආකෘතිය කෙටුම්පත් කර නිම කෙරෙන තෙක් රටවල් ගණනාවක් සමඟ පවත්වන්නට නියමිතව තිබූ සාකච්ඡා කල්දමා ඇත.

**ද්විත්ව බදුකරණය වැළැක් වීම.**

මෙම වර්ෂයතුළදී, ශ්‍රී ලංකාව පලස්තීන රජය සමඟ ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුමකට එළඹුනාය. මෙම වර්ෂය තුළදී පවත්වන ලද ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම පිළිබඳ සියලුම සාකච්ඡාවලට නීති අංශයේ නියෝජිතයා සහභාගී විය.

**ආපසු භාරගැනීම.**

මෙම වර්ෂය තුළදී, රුසියානු සමූහාණ්ඩුව සමඟ සිය රටට ආපසු භාර ගැනීම පිළිබඳ ගිවිසුමක් සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන ලදී. සිය රටට ආපසු භාර ගැනීම පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ අමාත්‍යාංශ කේන්ද්‍රස්ථානය වනුයේ ද නීති අංශයයි.

සිය රටට ආපසු භාර ගැනීම පිළිබඳ යුරෝපා ගිවිසුම වැනි සිය රටට ආපසු භාර ගැනීමේ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමෙහිලා නීති අංශය ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කරයි.

<u>සමුද්‍රික / සාගර නීතිය</u>

- නීති අංශය සාගර නීතියට අදාළ සියලුම සාකච්ඡාවලට ක්‍රියාකාරීව සහභාගී වී තිබෙන අතර මහද්වීපික තටක සම්බන්ධයෙන් එක්සත් ජාතීන් වෙත ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳ විශේෂ උනන්දුවක් දක්වා ඇත. මහද්වීපික තටක පිළිබඳ කොමිසන් සභාවේ රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ රැස්වීමට හා මෙම වර්ෂයේදී නිව්යෝර්ක් හිදී පැවැත්වුණ 1982 සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අත්සන් තැබීමට විවෘත කිරීමේ 30 වන සංවත්සරයට නීති අංශය සහභාගී විය.

- 2025 දී මෙම කොමිෂන් සභාව ඉදිරියේදී සිදු කිරීමට නියමිත වාචික කරුණු ඉදිරිපත් කිරීමේ කටයුතු අවසන් කිරීමෙහිලා මෙම දිනවල ජාතික සාගර කටයුතු කමිටුවසමඟ අවශ්‍ය කටයුතුවල නිරතව සිටියි.

- මෙම වසර තුළදී නීති අංශය විසින් ශ්‍රී ලංකා වරායන්වලට යුධ නැව් ඇතුල් කිරීම පිළිබඳව රුසියානු සමූහාණ්ඩුව සමඟ සාකච්ඡා සම්බන්ධීකරණය කිරීමද සිදු කරන ලදී.

<u>වාණිජ හා වෙළඳ කටයුතු</u>

- වාණිජ හා වෙළඳ කටයුතු පිළිබඳ ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ගිවිසුම් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා මෙම අංශය වාණිජ කටයුතු දෙපාර්තමේන්තුවසමඟ සමීපව කටයුතු කර තිබේ. මෙම වසරේදී, 2014 සිට GSP + සහනය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට අවශ්‍ය වන නෛතික කරුණු ඉදිරිපත් කිරීම් සැකසීමෙහිලා මෙම අංශය නිරත විය.

<u>අධිකරණ සහයෝගීතාව හා උදර්පනය</u>

- නෛතික සහයෝගිතාව හා උදර්පනය ඵලදායක අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වර්ෂය තුළදී ගිවිසුම් ගණනාවක් පිළිබඳ සාකච්ඡා පවත්වා ඒ පිළිබඳ කටයුතු නිමකර ඇත. මෙම සාකච්ඡා පවත්වන්නේ අධිකරණ අමාත්‍යාංශය සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟය. උදර්පනය හා අන්‍යෝන්‍ය නෛතික සහාය සඳහා සියලුම අයදුම්පත් යවනු ලබන්නේ මෙම අමාත්‍යාංශයේ නීති අංශය මගිනි.

- මෙයට අමතරව, විදේශවල සිටින අයට සිතාසි භාර දීම, විදේශීය සිතාසි ශ්‍රී ලංකාවේදී භාර දීම පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයේ සහාය ඇතිව මෙහෙයුම් කටයුතු සිදු කරන්නේ ද මෙම නීති අංශය මගිනි.

<u>එක්සත් ජාතීන්</u>

- එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අංක 1267 හා 1373 දරන යෝජනාවලි ක්‍රියාත්මක කිරීම පිළිබඳ අන්තර් අමාත්‍යාංශ කමිටුවේ සාමාජිකයකු ලෙස නීති අංශය විසින් මෙම වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා වන ඊට අදාළ රෙගුලාසි පිළිබඳව ගැසට් නිවේදනයක් පළ කිරීමට පියවර ගන්නා ලදී. මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ කාර්ය සාධන බලකායේ අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා ත්‍රස්තවාදීන්ගේ මුදල් රැස් කිරීමේ කටයුතු මැඩ පැවැත්වීම පිළිබඳ සම්මුතිය සංශෝධනය කිරීමේ කටයුතු මෙම අංශය මගින් ආරම්භ කරන ලදී.

- එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීමේ 68 වන සැසි වාරය 6 වැනි කාරක සභාවට ඉදිරිපත් කිරීම සඳහා රටේ ස්ථාවරය පිළිබඳ ප්‍රකාශ කරමින් වාර්තා සකස් කිරීම ද නීති අංශයේ කාර්යභාරයකි.

**<u>ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ ජාතික කමිටුව</u>**

- මෙම අමාත්‍යංශයේ නීති අංශය, ජාත්‍යන්තර මානුෂීය නීතිය හා සම්බන්ධ ක්‍රියාකාරකම් අනෙකුත් අමාත්‍යංශ හරහා ක්‍රියාවට නැංවීම පිළිබඳ ප්‍රධාන කේන්ද්‍රස්ථානය වේ. මානුෂීය නීති වැඩසටහන පිළිබඳ දකුණු ආසියානු ඉගැන්වීම 12 වැනි සැසිය ප්‍රථම වතාවට විශාල නිලධාරී පිරිසකගේ සහභාගිත්වයෙන් මෙම නීති අංශයේ සහය ඇතිව ජාත්‍යන්තර රතු කුරුස සංගමය විසින් පවත්වන ලදී. මෙය කලාපීය පුහුණු වැඩසටහනක් වන හෙයින් සාර්ක් රටවල් ද සහභාගී විය.

ඇමුණුම : මෙම වසර තුළදී ශ්‍රී ලංකාව අනෙක් රටවල් හා නියෝජිතායතන සමඟ එළැඹී ඇති ගිවිසුම් ලැයිස්තුව.

| | ගිවිසුමේ නම | අනෙක් පාර්ශ්වකාර රාජ්‍යය |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කටාර් හෝල්ඩින් එල්.එල්.සී. අතර ආයෝජන සහයෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම | කටාර් රාජ්‍යය |
| 02 | කටාර් රාජ්‍යය සහ ශ්‍රී ලංකාව අතර ගුවන් සේවා ගිවිසම | කටාර් රාජ්‍යය |
| 03 | ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කටාර් රාජ්‍යයේ ආණ්ඩුව අතර සංස්කෘතික ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ ගිවිසුම | කටාර් රාජ්‍යය |
| 04 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කටාර් රාජ්‍යයේ ආණ්ඩුව අතර ආර්ථික, වාණිජ සහ තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ ගිවිසුම | කටාර් රාජ්‍යය |
| 05 | ශ්‍රී ලංකාව සහ කටාර් අතර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ සහයෝගිතාවය සඳහා වන අබෝධතා ගිවිසුම | කටාර් රාජ්‍යය |
| 06 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කටාර් රාජ්‍යයේ ආණ්ඩුව අතර ඉහළ පෙළේ ඒකාබද්ධ කමිටුවක් ස්ථාපනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම | කටාර් රාජ්‍යය |
| 07 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කටාර් රාජ්‍යයේ ආණ්ඩුව අතර නෛතික ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ ගිවිසුම | කටාර් රාජ්‍යය |
| 08 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කටාර් හි නිශ්චල දේපළ ආයෝජන සමාගම අතර නිශ්චල දේපළ ආයෝජන සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම | කටාර් රාජ්‍යය |
| 09 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කටාර් රාජ්‍යයේ ආණ්ඩුව අතර සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම | කටාර් රාජ්‍යය |
| 10 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවසහ ඉන්දියානු ජනරජයේ ආණ්ඩුව අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම | ඉන්දියාව |
| 11 | ශ්‍රී ලංකාවේ උතුරු, නැගෙනහිර, මධ්‍යම සහ ඌව පළාත්වල නිවාස ඒකක 49,000ක් සඳහා ඉන්දියානු ආධාර ලබා දීම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ආණ්ඩුව අතර අවබෝධතා ගිවිසුම | ඉන්දියාව |
| 12 | ශ්‍රී ලංකාවේ විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සහ ඉන්දියාවේ ටෙලිකොම් නියාමන අධිකාරිය (TRAI) අතර අවබෝධතා ගිවිසුම | ඉන්දියාව |
| 13 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මාලි ජනරජය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ඒකාබද්ධ නිල නිවේදනය | මාලි |
| 14 | ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දුනීසියානු ජනරජයේ ආණ්ඩු අතර සංස්කෘතික සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම | ඉන්දුනීසියාව |
| 15 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ඉන්දුනීසියානු ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර රාජ්‍යතාන්ත්‍රික අධ්‍යාපනය සහ පුහුණුව පිළිබඳ අවබෝධතා ගිවිසුම | ඉන්දුනීසියාව |
| 16 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දුනීසියානු ජනරජය අතර ද්විපාර්ශ්වික සහයෝගිතාව පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභාවේ ප්‍රථම රැස්වීමේ එකඟතාවයට පත් වාර්තාව | ඉන්දුනීසියාව |
| 17 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කොන්ගෝ ජනරජය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනයකිරීම පිළිබඳ ගිවිසුම | කොන්ගෝ |

| | | |
|---|---|---|
| 18 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර පකිස්තාන ඉස්ලාමීය ජනරජයේ ආණ්ඩුව අතර ඇ.ඩො. මිලියන 200ක අගයක් දක්වා වූ ණය පහසුකමක් පිළිබඳ අවබෝධතා ගිවිසුම | පකිස්තානය |
| 19 | ජාතික වෘත්තීය හා තාක්ෂණික පුහුණු කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාවේ තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අතර අවබෝධතා ගිවිසුම | පකිස්තානය |
| 20 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනමාධ්‍ය සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය සහ පකිස්තාන ඉස්ලාමීය ජනරජයේ ප්‍රවෘත්ති සහ විකාශන අමාත්‍යාංශය අතර මාධ්‍ය ක්ෂේත්‍රයේ සහයෝගීතාවය සඳහා වන අවබෝධතා ගිවිසුම | පකිස්තානය |
| 21 | 1978 ආයෝජන මණ්ඩල නීති අංක 4 යටතේ පිහිට වූ රාජ්‍ය ආයෝජන ප්‍රවර්ධන නියෝජිත ආයතනය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා 2001, සිංගප්පූරුව ව්‍යාපාරික බල මණ්ඩල පනත යටතේ පිහිට වූ සිංගප්පූරු ව්‍යාපාරික බල මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුම | සිංගප්පූරුව |
| 22 | ශ්‍රී ලංකාව හා රුසියානු සමූහාණ්ඩුවේ ආණ්ඩුව අතර ගුවන් සේවා ගිවිසුම | රුසියානු සමූහාණ්ඩුව |
| 23 | ද්විත්ව බදුකරණය වැලැක්වීම සහ ආදායම මත බදු මුදල් සම්බන්ධයෙන් මූල්‍ය පැහැරහැරීම් වැලැක්වීම සඳහා ශ්‍රී ලංකාව හා පලස්තීන රාජ්‍ය අතර ගිවිසුම් | පලස්තීනය |
| 24 | ශ්‍රී ලංකාව හා පලස්තීන රාජ්‍ය අතර දේශපාලනික උපදේශන පිළිබඳ සන්ධානය | පලස්තීනය |
| 25 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා කොරියානු ජනරජයේ දැනුම් ආර්ථික අමාත්‍යාංශය අතර විදුලිබල පාර්ශ්වකාරත්වය සඳහා ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම | කොරියානු ජනරජය |
| 26 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සහ කොරියානු ජනරජයේ ක්‍රමෝපායික හා මුදල් අමාත්‍යාංශ අතර ආර්ථික සංවර්ධන සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම | කොරියානු ජනරජය |
| 27 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති තාක්ෂණ අමාත්‍යාංශය (MOTIT) හා කොරියානු ජනරජයේ රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක අමාත්‍යාංශය (MOPAS) අතර ප්‍රවෘත්ති අංශයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම | කොරියානු ජනරජය |
| 28 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව හා ඕස්ට්‍රේලියාවේ ආණ්ඩුව අතර ගුවන් සේවාවලට අදාළ ගිවිසුම | ඕස්ට්‍රේලියාව |
| 29 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව හා කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර කම්කරු, මිනිස්බල බඳවා ගැනීම හා සංවර්ධන ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධතා ගිවිසුම | කුවේට් |
| 30 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කටාර් රාජ්‍යයේ ආණ්ඩුව අතර ආයෝජන අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා සුරක්ෂා කිරීම සඳහා ගිවිසුම | කටාර් |
| 31 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය හා කසකස්තාන ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර ද්විපාර්ශ්වික උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුම | කසකස්තානය |
| 32 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව හා තායිලන්ත රාජධානියේ ආණ්ඩුව අතර සාපරාධී කටයුතු මැඩපැවැත්වීමෙහිලා සඳහා අන්‍යෝන්‍ය නෛතික සහාය පිළිබඳ ගිවිසුමක් සඳහා තහවුරු කිරීමේ නෛතික ලේඛන | තායිලන්තය |
| 33 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය හා තායිලන්ත රාජධානියේ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන පිළිබඳ ගිවිසුම | තායිලන්තය |

| | | |
|---|---|---|
| 34 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව හා මහජන චීන ජනරජයේ ආණ්ඩුව අතර ශ්‍රී ලංකාවේ චීන සංස්කෘතික මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම | මහජන චීන ජනරජය |
| 35 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා සැන්මැරිනෝ ජනරජය අතර ද්විපාර්ශ්වික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ගිවිසුම | සැන් මැරිනෝ |
| 36 | ශ්‍රී ලංකාව හා හංගේරියාව අතර උපදේශන හා සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම | හංගේරියාව |
| 37 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය හා කියුබානු ජනරජයේ කෘෂිකර්ම අමාත්‍යාංශය අතර පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සහයෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම | කියුබාව |
| 38 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව හා චිලී ජනරජයේ ආණ්ඩුව අතර රාජ්‍යතාන්ත්‍රික හා නිල / සේවා විදේශ ගමන් බලපත්‍ර හිමියන් වීසා අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම පිළිබඳ ගිවුිසම | චිලී |
| 39 | ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර ගුවන් සේවා ගිවිසුම | වියට්නාමය |
| 40 | ආර්ථික, විද්‍යාත්මක හා තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර ඒකාබද්ධ කොමිෂන් සභාවේ තුන්වැනි රැස්වීමේ එකඟතාවයට පත් වාර්තා | වියට්නායම |
| 41 | ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපායික අධ්‍යනය පිළිබඳ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය සහ පෝලන්ත ජනරජයේ ජාත්‍යාන්තර කටයුතු පිළිබඳ පෝලන්ත අධ්‍යනය ආයතනය (PIMS) අතර අවබෝධතා ගිවිසුම | පෝලන්තය |
| 42 | ශ්‍රී ලංකා ආණ්ඩුව හා ස්වාසිලන්ත රාජධානියේ ආණ්ඩුව අතර ආර්ථික, වාණිජ හා තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ ගිවිසුම | ස්වාසිලන්තය |
| 43 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධ්‍යාපන අමාත්‍යාංශය හා සීෂෙල්ස් ජනරජයේ අධ්‍යාපන අමාත්‍යාංශය අතර අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ අවබෝධතා ගිවිසුම | සීෂෙල්ස් |
| 44 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සෞඛ්‍යය අමාත්‍යාංශය හා සීෂෙල්ස් ජනරජයේ සෞඛ්‍යය අමාත්‍යාංශය අතර සෞඛ්‍යය ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම | සීෂෙල්ස් |
| 45 | ශ්‍රී ලංකා ආණ්ඩුව හා සීෂෙල්ස් ජනරජයේ ආණ්ඩුව අතර නෛතික කටයුතු සඳහා කම්කරු සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම | සීෂෙල්ස් |
| 46 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සීෂෙල්ස් ජනරජයේ ආණ්ඩුව අතර සීෂෙල්ස් ජනරජයේදී ශ්‍රී ලාංකික මිනිස් බලය සඳහා රැකියා පිළිබඳ ගිවිසුම | සීෂෙල්ස් |
| 47 | ලංකා වාණිජ මණ්ඩලය හා බ්‍රසීලයේ රියෝද ජැනයිරෝ විදේශ වෙළඳ බල මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුම | බ්‍රසීලය |
| 48 | ශ්‍රී ලංකා ප්‍රවාහන අමාත්‍යාංශයේ (MOT) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (SLR) හා චීන මහජන ජනරජයේ ඩොන්ග්ෆැන් ඉලෙක්ට්‍රිකල් ජාත්‍යන්තර සමාගම (DEC) අතර වේයන්ගොඩ සිට දකුණු කළුතර දක්වා විදුලි දුම්රිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ අවබෝධතා ගිවිසුම | මහජන චීන ජනරජය |
| 49 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය හා මහජන චීන ජනරජයේ රාජ්‍ය සාගර පරිපාලන ආයතනය අතර අවබෝධතා ගිවිසුම | මහජන චීන ජනරජය |
| 50 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රක සමාජවාදී ජනරජයේ ආණ්ඩුව හා යුරෝපා සංගමය අතර ගුවන් සේවාවල සමහරක් අංශ පිළිබඳ ගිවිසුම | යුරෝපා සංගමය |
| 51 | සීෂෙල්ස් ජනරජය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර කෙටි කාලයක් | සෂෙල්ස් |

| | | |
|---|---|---|
| | සඳහා නැවතී සිටියදී වීසා බලපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කිරීම පිළිබඳ ගිවිසුම | |
| 52 | ගුවන් සේවාවල යම් යම් අංශ පිළිබඳව යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකාව අතර ගිවිසුම | යුරෝපා සංගමය |
| 53 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ඕමාන සුල්තාන් රාජ්‍යයේ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර ද්විපාර්ශ්වික උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුම | ඕමානය |
| 54 | ශ්‍රී ලංකාව හා උගන්ඩාව අතර සංස්කෘතික ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ ගිවිසුම | උගන්ඩාව |
| 55 | ශ්‍රී ලංකාව හා උගන්ඩාව අතර ආර්ථික, වාණිජ, හා තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ ගිවිසුම | උගන්ඩාව |
| 56 | ශ්‍රී ලංකාව හා උගන්ඩාව අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුම | උගන්ඩාව |
| 57 | ශ්‍රී ලංකාව හා උගන්ඩාව අතර සංචාරක කටයුතු සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම | උගන්ඩාව |
| 58 | බර්කිනා ෆාසෝ හා ශ්‍රී ලංකාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ගිවිසුම | බර්කිනා ෆාසෝ |
| 59 | ශ්‍රී ලංකාව හා සරිනාම් අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය | සූරිනාම් |
| 60 | ශ්‍රී ලංකාව හා කසකස්ථනය අතර සංචාරක කටයුතු ක්ෂේත්‍රයේ සහයෝගිතාවය පිළිබඳ ගිවිසුම | කසක්ථානය |
| 61 | එල් සැල්වදෝර ජනරජයේ ආණ්ඩුව සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය | එල් සැල්වදෝරය |
| 62 | ශ්‍රී ලංකාව හා හයිටි අතර ද්විපාර්ශ්වික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශනය | හයිටි |
| 63 | ශ්‍රී ලංකාව හා ග්‍රෙනේඩා අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය | ග්‍රෙනේඩා |
| 64 | ශ්‍රී ලංකාව හා මොරිටේනියාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය | මොරිටේනියාව |

**<u>ගිවිසුම් තැන්පත් කර තබා ගැනීම.</u>**

- ශ්‍රී ලංකා රජය මගින් අත්සන් කරනු ලබන සියලුම ගිවිසුම් තැන්පත් කර තබා ගන්නා ස්ථානය ලෙස නීති අංශය ගිවිසුම්වල විද්‍යුත් දත්ත සමුදායක් පවත්වාගෙන යයි. 1986 දක්වා ශ්‍රී ලංකා රජය විසින් අත්සන් කරන ලද සියලුම ගිවිසුම්වල විද්‍යුත් පිටපත්, යොමුව සඳහා තබාගෙන එම ගිවිසුම්වල මුල් පිටපත් සුරක්ෂිතව තබා ගැනීම සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට භාර දීමට මෙම වර්ෂයේදී තීරණය කර තිබේ.

- නීති අංශයේ පහසුකම් ලබා ගනිමින් වෙනත් රටවල් හා නියෝජිතායතන සමඟ වර්ෂය තුළදී ශ්‍රී ලංකාව විසින් අත්සන් තබන ලද ගිවිසුම් පහත සඳහන් වේ.

# විදේශ දූත මණ්ඩල පාලන අංශය

විදේශ දූත මණ්ඩල පාලන අංශය

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල 64 හි පරිපාලන කාර්ය කටයුතු හා සේවා පිරිස් අධීක්ෂණය කරමින් එම දූත මණ්ඩලවල කළමනාකරණ කටයුතු අඛණ්ඩව සිදු කිරීම. ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය පැවැත්වීම, විදේශ දූත මණ්ඩලවල සේවය කිරීම සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් හා පෞද්ගලික සහකාරවරුන් බඳවා ගැනීම හා ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල අලුතින් ඇති කිරීම පිළිබඳ වගකීම විදේශ දූත මණ්ඩල පාලන අංශයට පැවරී ඇත.

**ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවා ගැනීම**

- වර්ෂ 2011 දී පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල අනුව 2012 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට නිලධාරීන් 14 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් බඳවා ගන්නා ලදී. මෙම නව නිලධාරීන් සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයේදී පුළුල් පුහුණු වැඩසටහනක් හා තවත් වැඩසටහන් ගණනාවක් පැවැත්වීම මඟින් අදාළ රාජකාරි කටයුතුවලට හුරුවීමේ අවස්ථාව සලසා දෙන ලදී. මොවුහු දැනට අමාත්‍යාංශයේ අංශවලට අනුයුක්ත කරනු ලැබ සිටිති.

- ශ්‍රී ලංකා විදේශ සේවයට නිලධාරීන් බඳවා ගැනීමේ විභාගය 2012 මැයි/ ජූනි මාසවලදී විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වන ලදී. ඉහත ලිඛිත විභාගයේ ප්‍රතිඵල අනුව, විභාගය සමත් වූ අපේක්ෂකයන් 64 දෙනෙකු සඳහා 2013 මාර්තු 07-09 දිනවලදී සම්මුඛ පරීක්ෂණය පවත්වන ලදී.

- විභාග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, වර්ෂ 2012 පෙබරවාරි සහ මාර්තු මාසවලදී කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වන ලදී. එහි ප්‍රතිඵල අයදුම්කරුවන් වෙත යවා ඇත. 2013 වසරේදී මීළඟ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම සඳහා කටයුතු සදානම් කර තිබේ.

**දූත මණ්ඩල ප්‍රධානීන් අලුතින් පත් කිරීම.**

- 2012 වර්ෂය තුළ දී දූත මණ්ඩල ප්‍රධානීන් 14 දෙනෙකු පත්කරනු ලැබ සිටිති. රේඛීය අමාත්‍යාංශ, රජයේ ආයතන හා පෞද්ගලික අංශයේ සංවිධාන සමඟ එක්ව වැඩසටහන් ගණනාවක් පවත්වා එමගින් දූත මණ්ඩල ප්‍රධානීන් වශයෙන් නම් කරනු ලැබ සිටින මෙම නිලධාරීන්ට පුළුල් පුහුණුවක් හා හුරුවීමේ අවස්ථා සලසා දෙන ලදී.

**ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් මාරු කිරීම.**

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් 19 දෙනෙක් අමාත්‍යාංශයේ සිට විදේශ දූත මණ්ඩලවලට ද විදේශ දූත මණ්ඩලවල සිට අමාත්‍යාංශයට ද මාරු කරනු ලැබූහ. මෙම කාලය තුළදී කොන්ත්‍රාත් පදනම මත රාජ්‍ය තාන්ත්‍රික තනතුරු සහිතව විදේශ දූත මණ්ඩලවල සේවය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් තවත් 10 දෙනෙකු පත් කරන ලදී. මෙම නිලධාරීන් සඳහා දූත මණ්ඩලවලදී අවශ්‍ය සැපයුම් කටයුතුවලදී විදේශ දූත මණ්ඩල පාලන අංශය මගින් අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදී.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් හා පුද්ගලික සහකාරවරුන් තෝරා පත්කර ගැනීම හා මාරු කිරීම.

- 2011 ජනවාරි මස පවත්වන ලද විවෘත තරඟ විභාගයෙන් තෝරාගත් රාජ්‍ය කළමනාකරන සහකාර සේවයේ නිලධාරීන් හතළිස් නව දෙනෙකු (49) විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා පත් කරන ලදී.
- විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරු පදනමින් බඳවාගන්නා කළමනාකරණ සහකාර සේවයේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා තරඟ විභාගය - 2012 නොවැම්බර් 17 හා 18 යන දිනවලදී විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අතර ඉන් අපේක්ෂකයින් 50 දෙනෙකු තොරා ගන්නා ලදී.
- තෝරාගත් රාජ්‍ය කළමනාකරන සහකාර සේවයේ නිලධාරීන් 50 දෙනෙකු සඳහා සම්මුඛ පරීක්ෂණය 2013 මාර්තු 19 වැනි දා පවත්වන ලද අතර පත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතියි.
- 2012 දී පැවති සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත විදේශ රටවල පිහිටි දූත මණ්ඩලවල පුරප්පාඩු සඳහා පුද්ගලික සහකාරවරුන් විසි දෙකක් (22) තෝරා පත් කරන ලදි.
- විදේශ රටවල පිහිටි විවිධ දූත මණ්ඩල සඳහා ස්ථානීය කොන්ත්‍රාත් පදනම මත පුද්ගලයන් තිස් හතර (34) දෙනෙකු බඳවා ගන්නා ලදි.

**ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා ශිෂ්‍යත්ව/පුහුණු පහසුකම්**

- ඕස්ට්‍රේලියාව, ඊශ්‍රායලය, මැලේසියාව, ඉන්දියාව, බංග්ලාදේශය, ඇමෙරිකා එක්සත් ජනපදය, බෙල්ජියම, තායිලන්තය, ජර්මනිය, චීනය, නේපාලය, දකුණු කොරියාව හා මෝල්ටාව ඇතුළු රටවල පවත්වන ලද පුහුණු වැඩසටහන්වලට/ වැඩමුළුවලට සහභාගීවීමට විදේශ දූත මණ්ඩල පාලන අංශය විසින් ශ්‍රී ලං.වි.සෙ. නිලධාරීන් 16 දෙනෙකුට පහසුකම් සලසා දී තිබේ. රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය වැඩි දියුණු කිරීම අරභයා ද්වි පාර්ශ්වික හා බහු පාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රික කටයුතු, ජාත්‍යන්තර නීතිය, මානව හිමිකම් සහ ආරක්ෂාව පිළිබඳ අධ්‍යයනය සහ ජාත්‍යන්තර වෙළඳාම හා සාකච්ඡා වැනි විවිධ ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන පරිදි මෙම වැඩසටහන සකසන ලදී.

- තවද, ඕස්ට්‍රේලියානු සංවර්ධන ආධාර වැඩසටහන යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා නිලධාරීන් දෙදෙනෙකු (02) තෝරාගනු ලැබ සිටින අතර, ඔවුහු ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය හා මොනෑෂ් විශ්ව විද්‍යාලය වැනි සප්‍රකට විශ්ව විද්‍යාලවල අධ්‍යයන කටයුතු සිදුකර ගෙන යති. මෙයට අමතරව, එක් නිලධාරියකුට සිංගප්පූරුවේදී රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය සඳහා අධ්‍යයන කටයුතු කිරීමට ලී ක්වාන් යූ අධි ශිෂ්‍යත්වය පිරිනමා ඇත.

**නව රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල ආරම්භ කිරීම**

2012 වර්ෂයේදී පහත සඳහන් නව දූත මණ්ඩල ආරම්භ කරන ලදී.

- තුර්කියේ අන්කාරා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
- චීනයේ ගුවැන්ෂු හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය
- ඉරාකයේ බැග්ඩෑඩ් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ( 2012.02.07 වන දින නැවත විවෘත කරන ලදී)

පහත සඳහන් දූත මණ්ඩල විවෘත කිරීම සඳහා මෙම අංශය මගින් කටයුතු සිදු කෙරෙමින් පවතී.

- නයිජීරියාවේ අබුජාහි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
- බහරේන් හි මැනමා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
- ඕස්ට්‍රේලියාවේ මෙල්බන් හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය
- ඉතාලියේ මිලානෝහි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය
- සවුදි අරාබියාවේ දමාම් හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය

**ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සඳහා ගොඩනැගිලි මිලට ගැනීම හා ඉදි කිරීම.**

පහත සඳහන් ස්ථානවල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හා දේපළ මිලට ගැනීම සඳහා  කටයුතු ආරම්භ කොට ඇති අතර, ඒ පිළිබඳ ප්‍රගතිය පහත සඳහන් වේ.

- ඉන්දියාවේ චෙන්නායිහි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාල ගොඩනැගිල්ල හා තානාපතිවරයාගේ නිල නිවස ඉදි කිරීම (ඉදිකිරීම් කටයුතු නිම කර ඇත.)
- ලන්ඩන් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාගේ නිල නිවස ඉදි කිරීම (ඉදිකිරීම් කටයුතු කෙරෙමින් පවතියි)
- ඕස්ට්‍රේලියාවේ කැන්බරාහි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම ( ඉදි කිරීම් කටයුතු නිම කර ඇත.)
- ඉන්දියාවේ නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සුළු සේවක නිල නිවාස ඉදි කිරීම (ඉදි කිරීම් කටයුතු නිම කර ඇත.)
- නිව්යෝර්ක් හි නිත්‍ය දූත මණ්ඩලය සඳහා දේපළක් මිලදී ගැනීම (මිල දී ගැනීමේ කටයුතු නිම කර ඇත).
- ඕමානයේ හා වොෂිංටන් ඩී.සී හි දූත මණ්ඩල සඳහා දේපළ මිලදී ගැනීමට පියවර ගෙන තිබේ.
- විදේශ කටයුතු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා විදේශ නියුක්ති කාර්යාංශය අතර වසර 20 ක් සඳහා රු: 25,497,600/- (ඕමාන් රියාල් 76,800) ක වාර්ෂික කුලී මුදලක් යටතේ කුලියට මිලදී ගැනීමේ ගිවිසුමකට එළඹීමට අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය ලබා දී තිබේ. ඒසේ වුවත්, මෙම කුලියට මිලදී ගැනීමේ ගිවිසුම යටතේ විදේශ කටයුතු අමාත්‍යාංශයට වාර්ෂිකව ශ්‍රී ලංකා විදේශ නියුක්ති කාර්යාංශයට ගෙවිය යුතු වන්නේ රු: 15,298,560/- (ඕමාන් රියාල් 48,080) ක් පමණක් වන අතර රු:10,149,040 /- (ඕමාන් රියාල් 30,720) ක් වන ඉතිරි මුදල ගොඩනැගිලි භාවිතා  කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා විදේශ නියුක්ති කාර්‍යාංශය ගෙවිය යුතු වන කොටස ලෙස සලකනු ලැබේ.

**ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම හා ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම.**

- දූත මණ්ඩල ගණනාවක ප්‍රතිසංස්කරණ හා අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කර ඇත.

- විදේශ දූත මණ්ඩල සඳහා වාහන මිලට ගැනීම/ විදේශ දූත මණ්ඩල 23 ක් සඳහා අලුත් වාහන සපයා දී ඇති අතර, දූත මණ්ඩල දෙකක් (2) සඳහා කුලී පදනම මත වාහන සපයා දී තිබේ. (වොෂින්ටන් ඩී.සී. සඳහා (1) සහ නිව්යෝර්ක් සඳහා (1))

**විදේශ ගමන් ඒකකයේ කාර්ය කටයුතු.**

කැබිනට් අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, වෙනත් දේශපාලන නියෝජිතයින් හා රාජ්‍ය නිලධාරින් විශාල සංඛ්‍යාවකට නිල විදේශ ගමන් බිමන්වල යෙදෙන අවස්ථාවල දී විදේශ ගමන් ඒකකයේ සහාය ලබා දී ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමය (SAARC), ඉන්දියානු සාගර කලාපීය වටද්දර රටවල සහයෝගිතා සංගමය (IORARC), බහු ආංශික තාක්ෂණික, ආර්ථික සහයෝගිතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය (BIMSTEC), පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම (CHOGM) සහ වෙනත් ජාත්‍යන්තර සංවිධානවල සම්මේලනවලට හා රැස්වීම්වලට සහභාගී වන ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම්වලට ද මෙම ඒකකයේ සහාය ලබා දී ඇත.

# සාමාන්‍ය පරිපාලන අංශය

## සාමාන්‍ය පරිපාලන අංශය

- මානව සම්පත් කළමනාකරණය, පාර්ලිමේන්තු ප්‍රශ්න, අමාත්‍ය මණ්ඩල සංදේශ, සේවා සහ භාණ්ඩ ලබා දීමේ හා සංවිධානය කිරීමේ කටයුතු, ගොඩනැගිලි හා උපකරණ නඩත්තුව, ප්‍රසම්පාදනය, ප්‍රවාහන කටයුතු, සන්නිවේදන පහසුකම් සැලසීම, සේවක පුහුණු කටයුතු සහ අමාත්‍යාංශයට අදාළ වෙනත් වැඩ කටයුතු පිළිබඳ වගකීම සාමාන්‍ය පාලන අංශයට පැවරී ඇත.

- මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් සාමාන්‍ය පරිපාලන අංශය, වර්ෂය තුළදී අමාත්‍යාංශයට අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා ගැනීම සඳහා පහසුකම් සලසා ඇති අතර කාර්ය මණ්ඩලයේ විවිධ තරාතිරම්වල සාමාජිකයන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පුහුණු ලබා දී ඇත. කාර්ය මණ්ඩලයේ සේවකයින්ගේ හිඟයක් පවතින නිසා උපාධිධාරීන් බඳවා ගැනීමට පහසුකම් සලසා දීම සඳහා සංවර්ධන නිලධාරී තනතුරු 50ක් ඇති කිරීමට කටයුතු කර තිබේ. අංක 06/ 2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව සේවයට බඳවා ගැනීමේ කාර්ය පටිපාටි සකස් කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා තිබේ. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව සේවක සංඛ්‍යාව පිළිබඳ සමාලෝචනයක් කොට, නිගමනවලට එළඹීම සඳහා අවශ්‍ය පහසුකම් මෙම අංශය මගින් සලසා දී තිබේ.

- අමාත්‍යාංශයේ ජනරජ ගොඩනැගිල්ලේ පිට බිත්ති ප්‍රතිසංස්කරණය කිරීම හා නිලධාරීන් හා සේවකයින් සඳහා නව විවේකාගාර/ නාන කාමර ඉදිකිරීම ආදී මූලික ප්‍රතිසංස්කරණ කටයුතු 2012 වර්ෂය තුළදී නිම කර ඇත. මෙයට අමතරව ගරු අමාත්‍යතුමාගේ නිල නිවාසය අලුත්වැඩියා කිරීම, පිළිගැනීමේ පරිශ්‍රය අලුත්වැඩියා කිරීම, අලුත් රතු පළස් ඇතිරීම සහ වෙනත් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇති අතර ඒ සඳහා සිදු වූ මුළු වියදම රුපියල් මිලියන 38ක් විය.

- අමාත්‍යාංශයේ නිත්‍ය අවශ්‍යතා සඳහා පහසුකම් සලසා දීමට අමතරව, අදාළ සේවා පහසුකම් හා උපකරණ ප්‍රසම්පාදනය කිරීම මගින්, 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම නිමිත්තෙන් කාර්ය සාධන බලකා ලේකම් කාර්යාලය ස්ථාපනය කිරීමෙහිලා සැලකිය යුතු දායකත්වයක් සාමාන්‍ය පරිපාලන අංශය ලබා දී තිබේ. 2012 දී අනුරාධපුරයේදී පවත්වන ලද දැයට කිරුළ ප්‍රදර්ශනයේදී අමාත්‍යාංශයේ කටයුතුවල සාර්ථකත්වය සඳහා කටයුතු සම්පාදනය කිරීම සාමාන්‍ය පරිපාලන අංශයේ තවත් මූලික කර්තව්‍යයක් විය.

- විදේශ තානාපතිවරුන් හා මහ කොමසාරිස්වරුන් වශයෙන් පත් කරනු ලැබුවන්ට අක්තපත්‍ර පිළිගැන්වීමේ උත්සව සඳහා සහ අති විශේෂ පුද්ගලයින් හා වෙනත් විදේශීය නියෝජිත කණ්ඩායම්වල නිල සංචාර සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් හා සැපයුම් සංවිධාන කටයුතු සම්පාදනය කිරීම සම්බන්ධයෙන් පහසුකම් සලසා දීම මෙම වර්ෂය තුළදී සාමාන්‍ය පරිපාලන අංශය මගින් ඉටු කර තිබේ. 2012 වර්ෂය තුළදී අක්තපත්‍ර පිළිගැන්වීමේ උත්සව 05ක් හා නිල සංචාර 15ක් ඇතුළුව සංචාර 101ක් සහ ශ්‍රී ලංකාවේදී පවත්වන ලද ජාත්‍යන්තර සම්මේලන සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සාමාන්‍ය පරිපාලන අංශය මගින් ඉටු කර ඇත.

- අමාත්‍යාංශයේ වාහන සංචිතය ප්‍රතිසම්පාදනය කර ගැනීම සම්බන්ධයෙන් සාමාන්‍ය පරිපාලන අංශය මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා පවත්වා ඇති අතර වර්ෂය තුළදී අලුත් වාහන 22ක් අමාත්‍යාංශයට ලබා ගත හැකි විය. පාවිච්චි කළ වාහන 11ක් සංචිතයෙන් ඉවත් කොට ඇති අතර එමගින් රුපියල් මිලියන 7ක් රජයේ ආදායමට බැර කළ හැකි වී තිබේ.

- සාමාන්‍ය පරිපාලන අංශය මගින් අමාත්‍ය මණ්ඩලයීය සංදේශ 60ක් ඉදිරිපත් කොට පාර්ලිමේන්තු ප්‍රශ්න 10 ට පිළිතුරු සපයා ඇත.

# මුදල් අංශය

**<u>මුදල් අංශය</u>**

කළමණාකාරිත්වයට උපකාරක සේවා සැපයීම සහ අමාත්‍යාංශයේ සංවර්ධන වැඩ කටයුතු පිළිබඳ මූල්‍ය සැළසුම්කරණය පිළිබඳ වගකීම් මුදල් අංශය භාරයේ පවතී. අමාත්‍යාංශයේ හා විදේශ දූත මණ්ඩලවල මූල්‍ය ගනුදෙනු පිළිබඳ ගිණුම් පවත්වා ගැනීම මෙම අංශයේ කාර්යභාරයක් වන අතර එම ගිණුම් පිළිබඳ වාර්තා මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කරනු ලැබේ.

**මෙම අංශයේ කාර්ය භාරය :**

- අවශ්‍ය මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රධාන ගිණුම් නිලධාරියා වන අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහාය වීම.
- රජයේ මූල්‍ය රීති හා රෙගුලාසි අනුගමනය කරන බව තහවුරු කර ගැනීම.
- මූල්‍ය සැලසුම්කරණ හා අයවැයකරණ කටයුතු කිරීම.
- මුදල් කළමනාකරණය ඇතුළු ගිණුම් ක්‍රම පනවා පවත්වාගෙන යාම.
- කලට වේලාවට නිවැරදි ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමට වගබලා ගැනීම.
- ගිණුම් වාර්තා හා අයවැය අවශ්‍යතා සකස් කිරීම/ යාවත් කාලීන කිරීම/ සමාලෝචනය කිරීම සහ නිම කිරීම පිළිබඳ කටයුතු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය, අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් නියෝජිතායතන හා අමාත්‍යාංශයේ අනෙකුත් අංශ සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.

2012 මුදල් වර්ෂය සඳහා පහත සඳහන් ආකාරයෙන් මෙම අමාත්‍යාංශය වෙත අය වැය ප්‍රතිපාදන වෙන් කොට ඇත :

අ. පුනරාවර්තන

| විස්තරය | මුළු ප්‍රතිපාදන<br>රු. | මුළු වියදම<br>රු. | වියදම ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 4,119,298,620 | 4,105,974,257 | 100 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 3,210,796,330 | 3,199,425,865 | 100 |
| එකතුව | 7,330,094,950 | 7,305,400,122 | 100 |

ආ. ප්‍රාග්ධනය

| විෂය ක්ෂේත්‍රය | විස්තරය | මුළු ප්‍රතිපාදන රු. | 2012.12.31 වැනි දිනට මුළු වියදම | වියදම ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| **ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම** | | | | |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 111,200,000 | 70,232,650 | 63 |
| 2002 | යන්ත්‍රාගාර, යන්ත්‍ර සහ උපකරණ | 6,000,000 | 2,646,850 | 44 |
| 2003 | වාහන | 21,361,200 | 20,134,080 | 94 |
| **ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | |
| 2101 | වාහන | 127,963,900 | 120,371,928 | 94 |
| 2102 | ලීබඩු හා කාර්යාල උපකරණ | 90,402,255 | 83,950,301 | 93 |
| 2103 | යන්ත්‍රාගාර, යන්ත්‍ර සහ උපකරණ | 18,597,745 | 13,596,178 | 73 |
| 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 825,000,000 | 680,668,807 | 83 |
| **මානව සම්පත් සංවර්ධනය** | | | | |
| 2401 | දැනුම වැඩිදියුණු කිරීම හා ආයතනික සංවර්ධනය | 4,000,000 | 3,820,250 | 96 |
| **වෙනත් ප්‍රාග්ධන වියදම්** | | | | |
| 2502 | ආයෝජන විදේශ වෙළදාම හා සංචාරක කටයුතු ප්‍රවර්ධනයෙහිලා පහසුකම් සැලසීම | | | |
| | එකතුව | 1,204,525,100 | 995,421,044 | 83 |

(2) අත්තිකාරම් ගිණුමේ නිර්දේශිත මුදල් ප්‍රමාණ ඉක්ම ගොස් ඇති අවස්ථා

| **විස්තරය** | **උපරිම හර** | **අවම බැර** | **උපරිම බැර ශේෂය** |
|---|---|---|---|
| **නියමිත සීමාව** | 21,000,000 | 18,000,000 | 110,000,000 |
| 2012.12.31 දිනට තථ්‍ය ගණන 1120011<br>2012.12.31 දිනට තථ්‍ය ගණන 1120012 | 17,878,927<br><br>8,098,294 | 24,715,933<br><br>8,907,940 | 94,760,576 |

# ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල ජාලය




2013 ආරම්භ කිරීමට නියමිත දූත මණ්ඩල

1. මෙල්බරන් - ඕස්ට්‍රේලියා

2. අබුජා - නයිජීරියා

3. මනමා - බහරේන්

4. කම්පාලා - උගන්ඩා

# සංවිධාන සැලැස්ම

## විදේශ කටයුතු අමාත්‍යාංශය

